

2025

කාර්යසාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

Performance Report

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
புத்தசாசன, மத மற்றும் கலாச்சார அலுவல்கள் அமைச்சு
Ministry of Buddhasasana, Religious & Cultural Affairs



කාර්යසාධන වාර්තාව

2025

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,

කොළඹ 07.

දුරකථන : **011- 2307694**
011- 2307674
ෆැක්ස් : **011- 2307688**
011- 2300513
විද්‍යුත් තැපෑල : **mbsecoffice@gmail.com**
වෙබ් අඩවිය : **http://www.mbs.gov.lk**

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

අන්තර්ගතය **පිටු අංක**

පරිච්ඡේදය 01	- ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	01-17
පරිච්ඡේදය 02	- ප්‍රගතිය හා ඉදිරි දැක්ම	18-92
පරිච්ඡේදය 03	- වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	93-141
පරිච්ඡේදය 04	- කාර්යසාධන දර්ශක	142-145
පරිච්ඡේදය 05	- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	146-151
පරිච්ඡේදය 06	- මානව සම්පත් පැතිකඩ	152-160
පරිච්ඡේදය 07	- අනුකූලතා වාර්තාව	161-184

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ /ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම.

වසර දෙදහස් පන්සියයකට අධික ප්‍රෞඩ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලාංකේය සභ්‍යත්වය සහ ශිෂ්ටාචාරය යනු අප සතු වටිනාම දායාදයයි. එම උදාර උරුමය වර්තමානය තුළ සුරක්ෂිත කරමින්, අනාගත පරපුර වෙත වඩාත් අර්ථවත් ලෙස සම්ප්‍රේෂණය කිරීම බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සතු අත්හළ නොහැකි වගකීමකි. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ජාතික ප්‍රතිපත්ති මාලාවට අනුකූලව, හුදු භෞතික දියුණුවෙන් ඔබ්බට ගිය, ආධ්‍යාත්මික සුවතාවයෙන් සහ ගුණධර්මවලින් පිරිපුන් ශිෂ්ටසම්පන්න සමාජයක් නිර්මාණය කිරීම අපගේ මූලික මෙහෙවර වේ.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව බුදුදහමට ප්‍රමුඛස්ථානය ලබා දී එය සුරක්ෂිත කොට පෝෂණය කරන අතරම, සෙසු සියලු ආගම්වලට හිමි ගෞරවය සහ නිදහස තහවුරු කරමින් අන්තර්-ආගමික සහජීවනය ගොඩනැගීමට අපි බැඳී සිටිමු. ජාතික උරුමයන් සහ සංස්කෘතික අංගයන් යනු රටක ජීව රුධිරයයි. එබැවින්, අපගේ ඓතිහාසික පුරාවිද්‍යාත්මක වටිනාකම් නූතන තාක්ෂණය ඔස්සේ සංරක්ෂණය කරමින්, දේශීය කලාවන් හා සාරධර්ම ප්‍රවර්ධනය කිරීම හරහා ආත්මාභිමානයෙන් යුතු පුරවැසියෙකු බිහිකිරීම සඳහා වූ ප්‍රතිපත්තිමය වටපිටාව මෙහිදී සකස් කෙරේ.

2025 වසරේ සිට ඉදිරියට ක්‍රියාත්මක වන අපගේ සියලු සැලසුම් "Clean Sri Lanka" සහ ඩිජිටල්කරණය වැනි ජාතික වැඩසටහන් සමග සමපාත කරමින්, විනයගරුක හා සදාචාරාත්මක සමාජ පරිවර්තනයක් කරා යොමු කර ඇත. අමාත්‍යාංශය යටතේ පවතින සියලුම අංශ සහ ආයතන ඒකාබද්ධ කරමින්, ජාතික මෙන්ම ජාත්‍යන්තර සහයෝගීතාවය ද උපයෝගී කරගනිමින්, ආධ්‍යාත්මිකව සහ සංස්කෘතිකව සුපෝෂිත "ලස්සන ජීවිතයක්" උදෙසා වූ තිරසර මාවත විවර කිරීම අපගේ අභිප්‍රායයි.

1.2 දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"තිරසර ලෙස සංවර්ධනය වූ ශ්‍රී ලංකාවක්"

මෙහෙවර

"බුදු දහම ප්‍රමුඛව සියලු ආගමික හරපද්ධතීන් මත පදනම්ව, ගුණගරුක, විනයගරුක හා ආධ්‍යාත්මික සංවර්ධනයෙන් යුතු මතුපරපුරක් බිහිකිරීමට කලා - සංස්කෘතික හා උරුමයන් සංරක්ෂණය ප්‍රවර්ධනය තුළින් වඩා යහපත් අනාගතයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස්කර ක්‍රියාත්මක කිරීම"

අරමුණු

- **බුද්ධශාසනය සුරක්ෂිත කිරීම:** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව බුද්ධශාසනය ආරක්ෂා කිරීම, පෝෂණය කිරීම සහ බෞද්ධ සාරධර්ම සමාජගත කිරීම.

- **පූජ්‍ය පක්ෂයේ සහ ආගමික ආයතනවල අභිවෘද්ධිය:** පූජ්‍ය පක්ෂයේ සුභසාධනය සලසමින් පූජනීය ස්ථාන ක්‍රමවත් ලෙස කළමනාකරණය සහ සංවර්ධනය කිරීම.

- **ආගමික සහජීවනය තහවුරු කිරීම:** සියලු ආගම් අතර ගෞරවය සහ අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය කරමින්, ජාතික සමගිය උදෙසා ආගමික පසුබිමක් නිර්මාණය කිරීම.

- **සදාචාරාත්මක අධ්‍යාපනය ප්‍රවර්ධනය:** දහම් පාසල් අධ්‍යාපන පද්ධතිය නවීකරණය කරමින්, ගුණගරුක හා විනයගරුක අනාගත පරපුරක් බිහිකිරීම.

- **ආධ්‍යාත්මික සංවර්ධනය මගින් මානව ප්‍රාග්ධනය ඉහළ නැංවීම:** පුරවැසියන් තුළ මානසික සුවතාවය සහ ගුණාංග වර්ධනය කරමින් "ලස්සන ජීවිතයක්" සඳහා අවශ්‍ය පදනම දැමීම.

- **සංස්කෘතික ප්‍රවර්ධනය:** ශ්‍රී ලාංකීය බහු ජාතිකත්වය පිළිගනිමින්, ඒ එක් එක් උප සංස්කෘතිවල අනන්‍යතාව ආරක්ෂා කරන අතරම සියලු උප සංස්කෘති එක්ව ගෙන ශ්‍රී ලාංකික වූ මහා සංස්කෘතියක් සහිත රටක් ලෙස ඉදිරියට පවත්වාගෙන යාම සහ විවිධ බලවේග හරහා හානියට පත්වන සාධනීය සංස්කෘතිකාංග, එවැනි හානිවලින් වළක්වා ගැනීම.

- **දේශීය කලා හා සංස්කෘතික අංග පෝෂණය:** පාරම්පරික හා නූතන කලා අංගයන්ට රාජ්‍ය අනුග්‍රහය ලබා දෙමින් සංරක්ෂණය කිරීම, කලාකරුවන්ගේ සුභසාධනය සහ වෘත්තීය ගෞරවය තහවුරු කිරීම.

- **සංස්කෘතික සංචාරක කර්මාන්තය දිරිමත් කිරීම:** ශ්‍රී ලංකාවේ අද්විතීය සංස්කෘතික උරුමයන් ලෝකයට විවෘත කරමින් රටේ ආර්ථික සංවර්ධනයට සෘජු දායකත්වයක් ලබාදීම.

- **ජාතික උරුම සංරක්ෂණය:** ශ්‍රී ලාංකීය ජාතික උරුමයන් නෛතිකව හඳුනා ගැනීම හා **ජාතික උරුමයන් සංරක්ෂණය** කිරීම.

- **ආදිවාසී ජන අයිතීන් සුරැකීම:** ආදිවාසී හා සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාවන්ගේ අයිතින් සුරැකීම හා තෘප්තිමත් ජන කොටසක් බවට පත් කිරීම.


- **පුරාවිද්‍යාත්මක උරුමයන් සංරක්ෂණය:** දිවයින පුරා විසිරී ඇති ඓතිහාසික ස්මාරක සහ පුරාවිද්‍යාත්මක ස්ථාන නූතන විද්‍යාත්මක ක්‍රමවේද ඔස්සේ ආරක්ෂා කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්


- රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු විෂයයන්ට සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම .
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- බුදුදහම ඇතුළු අනෙකුත් ආගම් ඇදහීමේ අයිතිය සුරක්ෂිත කිරීම.
- සියලු ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කරදීම සහ ආගමික අන්තවාදයට එරෙහිව පියවර ගැනීම.
- දහම් පාසල් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීම.
- පූජා භූමි සංරක්ෂණය හා සංවර්ධනය කිරීම.
- ආගමික හා සංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම.
- දුෂ්කර ප්‍රදේශවල පිහිටි ආගමික ස්ථාන වැඩිදියුණු කිරීම.
- සියලු ආගම්වලට අයත් ඩිජිටල් පුරාවිද්‍යා විශ්වකෝෂයක් නිර්මාණය කිරීම.
- රාජ්‍ය ලේඛන විධිමත් කළමනාකරණය හා සංරක්ෂණය කිරීම.
- මධ්‍යම සංස්කෘතික අරමුදල කාර්යක්ෂම ලෙස පරිපාලනය කිරීම.
- ශ්‍රී ලංකාවේ ජාතික සංස්කෘතියේ සියලුම අංගයන් අභිවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- විදේශීය රටවල් සමග සංස්කෘතික සබඳතා පවත්වාගෙන යාම.
- සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක උරුමයන් ආරක්ෂා වන අයුරින් සංස්කෘතික හා ජාතික උරුමයන්හි අභිමානය ප්‍රමුඛ වන සංචාරක වැඩසටහන් සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම.
- ජාතීන් අතර සහයෝගය ඇතිකිරීමෙහිලා සංස්කෘතිකමය දායකත්වය යොදාගැනීමේ ප්‍රවණතාවයන් හඳුනාගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- ඓතිහාසික, පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- නවීන හා සාම්ප්‍රදායික කලා නිර්මාණ ප්‍රවර්ධනයට සහ කලා ශිල්පීන් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

- නාට්‍ය, සංගීතය හා නර්තන ක්ෂේත්‍රයන්ගේ අභිවර්ධනයට අදාළ ක්‍රියාමාර්ග හඳුනාගෙන ක්‍රියාවට නැංවීම.
- ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව කතෘ භාග ගෙවීම පිළිබඳ ක්‍රමවේදයක් හඳුන්වාදීම.
- රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම අඛණ්ඩ අනුග්‍රහය ලබන සාහිත්‍ය, සිනමා, නාට්‍ය සහ අනෙකුත් කලාවන් සඳහා ජාතික අරමුදලක් පිහිටුවීම.
- කලා හා සංස්කෘතික ආයතන සමග සහයෝගීත්වයෙන් සෑම ප්‍රධාන නගරයකම සංස්කෘතික කලාප පිහිටුවීම.
- විශ්ව සාහිත්‍යය හා නාට්‍ය පිටපත් ජාතික භාෂාවන්ට පරිවර්තනය කිරීම, දිරිමත් කිරීම.
- නවීනතම තාක්ෂණය සපයමින් ජාතික ලේඛනාරක්ෂණය නවීකරණය හා ප්‍රතිසංවිධානය කිරීම.
- බහුකාර්ය සංස්කෘතික මධ්‍යස්ථාන ජාලයක් හරහා වේදිකා නාට්‍ය කලාව බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ප්‍රවර්ධනය කිරීමට ව්‍යූහාත්මක සැලැස්මක් සැකසීම.
- අද්‍යතන වේදිකා නාට්‍ය කලාව පිළිබඳ පර්යේෂණය හා පුහුණුව සඳහා ජාතික ආයතනයක් පිහිටුවීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු.
- අමාත්‍යාංශය යටතේ ඇති සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම.


1.4 සංවිධාන සටහන - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය




1.4.1 සංවිධාන සටහන - බුද්ධශාසන හා ආගමික අංශය



1.4.2 සංවිධාන සටහන - සංස්කෘතික අංශය



1.4.3 සංවිධාන සටහන - ජාතික උරුම අංශය



1.5 බුද්ධශාසන හා ආගමික අංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

- **බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව**

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් සම්බුද්ධ ශාසනයේ විරස්ථිය සඳහා සහ දැහැමි බොදු සමාජයක් පවත්වා ගෙන යාමට අදාල කාලීන ව්‍යාපෘතීන් රාශියක් ඉටු කරන අතරම, 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති වගකීම් වන බෞද්ධ සිද්ධස්ථාන හා දේපළ සම්බුද්ධ ශාසනයේ විරස්ථිතිය සඳහාම යෙදවීමට අවශ්‍ය පරිපාලන සහය ලබා දීම, විහාරස්ථාන සංවර්ධනය කිරීම, දහම් පාසල් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම හා දිවයිනේ සියලුම සාමණේර/උපසම්පදා භික්ෂූන් ලියාපදිංචි කර ලේඛන පවත්වා ගෙන යාම සිදු කරනු ලබයි.

මෙම කාර්යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ විවිධ අංශ ස්ථාපිත කොට ඇති අතර, එම අංශ වෙත අදාළ කාර්යයන් පවරා ඇත. විහාර දේවාලගම් ආඥා පනතට අදාල කටයුතු දුර බැහැර සිද්ධස්ථානවාසී ස්වාමීන් වහන්සේලාට ඉටු කර ගැනීම පහසු කරනු වස් මහනුවර ප්‍රාදේශිය කාර්යාලය, කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය හා රත්නපුර ප්‍රාදේශිය කාර්යාලය ස්ථාපිත කර පවත්වා ගෙන යනු ලබයි.

- **හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**



හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ හින්දු ආගමික කටයුතුවලට අදාලව සියලුම විෂයන්ට වගකිවයුතු දෙපාර්තමේන්තුවක් ලෙස 1985 ඔක්තෝම්බර් 02 වන දින (1985/123-12) යන අංකයලත් කැබිනට් මණ්ඩලයේ තීරණය මත 1986 වන වර්ෂයේ ජනවාරි මස පළමුවන දින පිහිටුවන ලදී.

හින්දු ධර්මය සහ දෙමළ සංස්කෘතිය ආරක්ෂා කර පෝෂණය කිරීමේ අරමුණින් මෙම දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. මෙහි ප්‍රධාන කාර්යභාරය වන්නේ දිවයින පුරා විසිරී ඇති හින්දු කෝවිල් ලියාපදිංචි කිරීම සහ ඒවායේ පාලන කටයුතු සඳහා අවශ්‍ය සහාය ලබා දීමයි. මීට අමතරව, හින්දු දහම් පාසල් (අරනෙරි) පද්ධතිය මෙහෙයවීම, ගුරු පුහුණුව සහ පෙළපොත් සම්පාදනය කිරීම සිදු කරයි. තෛපොංගල් සහ දීපාවලි වැනි ජාතික මට්ටමේ ආගමික උත්සව සංවිධානය කිරීම මෙන්ම හින්දු පූජකවරුන්ගේ සුභසාධනය සහ කෝවිල් ප්‍රතිසංස්කරණය සඳහා මූල්‍ය ආධාර ලබා දීම ද මෙහිදී ප්‍රමුඛව සිදු කෙරේ.

- **මුස්ලිම් ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

ඉස්ලාම් දහම සහ මුස්ලිම් ප්‍රජාවගේ ආගමික අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. පල්ලි (මස්ජිඩ්) ලියාපදිංචි කිරීම සහ ඒවායේ පරිපාලන ගැටලු නිරාකරණය කිරීම මෙහි මූලික අරමුණයි. මුස්ලිම් දහම් පාසල් (මද්‍රාසා) අධ්‍යාපනය අධීක්ෂණය කිරීම, ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සහ හජ් වන්දනාව සඳහා යන බැතිමතුන්ට අවශ්‍ය පහසුකම් සලසා දීම මෙහි ප්‍රධාන කාර්යභාරයකි. එසේම, රාමසාන් සහ හජ් වැනි ආගමික උත්සවවලදී රාජ්‍ය මැදිහත්වීම ලබා දෙන අතර, ඉස්ලාමීය පදනම් සහ පුණ්‍යායතන (වකුෆ්) පාලනය කිරීමේ වගකීම ද මෙය සතු වේ.

- **ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව**

1999 වර්ෂයේ මැයි මසදි කැබිනට් පත්‍රිකාවක් මඟින් සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රිස්තියානි ආගමික කටයුතු හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ලෙස ඇරඹී මෙම දෙපාර්තමේන්තුව පසුව 2007 අගෝස්තු මස 01 වන දින සිට වඩාත් සක්‍රීය දෙපාර්තමේන්තුවක් ලෙස සංවිධිත හා ක්‍රමවත්ව වර්ධනය විය.

ශ්‍රී ලංකාවේ කතෝලික සහ ක්‍රිස්තියානි ප්‍රජාවගේ ආගමික කටයුතු සම්බන්ධීකරණය සහ ප්‍රවර්ධනය මෙහි මූලික අරමුණයි. පල්ලි සහ ක්‍රිස්තියානි සංවිධාන ලියාපදිංචි කිරීම හරහා ඒවාට අවශ්‍ය නීතිමය සහ පරිපාලනමය මගපෙන්වීම ලබා දීම මෙහිදී සිදු කෙරේ. ක්‍රිස්තියානි දහම් අධ්‍යාපනය නංවාලීම සඳහා ගුරු පුහුණු වැඩසටහන් සහ අධ්‍යාපනික ද්‍රව්‍ය සැපයීම ප්‍රධාන කාර්යයකි. තවද, නත්තල් සහ පාස්කු වැනි විශේෂ ආගමික උත්සව රාජ්‍ය මට්ටමින් සංවිධානය කිරීම, පල්ලි නඩත්තුව සඳහා ආධාර පිරිනැමීම සහ ආගමික සංහිඳියාව ඇති කිරීම සඳහා වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම දෙපාර්තමේන්තුව හරහා සිදු කෙරේ.

- **මහාභාරකාර දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකාවේ පුද්ගලික භාරයන් සහ පුණ්‍යාධාර කළමනාකරණය කිරීම සඳහා, 1930 නොවැම්බර් 22 වන දින, 1931 අංක 1 දරන මහාභාරකාර ආඥාපනත යටතේ මහාභාරකාර දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත.

මෙහි මූලික අරමුණ වන්නේ මහජනයා විසින් පවරා දෙනු ලබන දේපළ සහ භාරයන් විනිවිදභාවයෙන් යුතුව සුරක්ෂිත කිරීම සහ ඒවායේ අභිමතාර්ථයන් ඉටු කිරීමයි. මියගිය පුද්ගලයන්ගේ දේපළ පරිපාලනය, බාලවයස්කාර දරුවන්ගේ දේපළ භාරකරු ලෙස කටයුතු කිරීම සහ ආගමික හෝ අධ්‍යාපනික පුණ්‍යායතන කළමනාකරණය කිරීම මෙහි ප්‍රධාන කාර්යභාරය වේ.

- **ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව**

1877 වර්ෂයේ ස්ථාපනය කරන ලද ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මඟින්, සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා ජාතික උරුමය සංරක්ෂණය, ප්‍රදර්ශනය හා ප්‍රචාරණය කිරීමත්, සංස්කෘතික හා ස්වාභාවික උරුමයට අයත් සම්පත් විද්‍යාත්මකව හා ක්‍රමානුකූලව ආරක්ෂා කිරීම හා මහජනතාවගේ ඇගයීම, අධ්‍යාපනය හා රසාස්වාදය උදෙසා ඉදිරිපත් කිරීමත් සිදු කරයි.

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව දිවයින පුරා පිහිටුවා ඇති ජාතික කෞතුකාගාර 10 කින් සහ මානව විද්‍යා, මානව වංශ විද්‍යා, භූ විද්‍යා, සත්ත්ව විද්‍යා, කීට විද්‍යා, උද්භිද විද්‍යා, අධ්‍යාපන හා ප්‍රකාශන, සංරක්ෂණ අංශය යන අංශ හා පුස්තකාලයකින් සමන්විත වේ.

- **ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව**

සංස්කෘතික දායාදයේ කොටසක් ලෙස රාජ්‍ය ලේඛන විධිමත්ව කළමනාකරණය සහ සංරක්ෂණය උදෙසා ජාතික ලේඛනාරක්ෂක නීතිය සහ ඊට අදාළ නීති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, ස්ථිර සංරක්ෂණය සඳහා රාජ්‍ය ලේඛන සහ අද්විතීය පෞද්ගලික ලේඛන ආබද්ධ කර ගැනීම, අදාළ නීති රීතිවලට අනුකූලව සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන රාජ්‍ය ලේඛන කළමනාකරණය සහ සංරක්ෂණය කිරීම, අදාළ නීතිමය තැන්පතුවට පුවත්පත් සහ ප්‍රකාශන උපචිත කරගැනීම මෙන්ම රාජ්‍ය පරිපාලන ක්‍රියාවලියේ දී සහ මහජන පර්යේෂණය සඳහා, තැන්පතු ලේඛනවලින් තොරතුරු සමුද්ධනය කිරීමට පහසුකම් සැලසීම ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව මගින් සිදු කරයි.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- රාජ්‍ය ලේඛන ආබද්ධ කරගැනීම් අංශය
- ප්‍රදර්ශන අංශය
- පොත් සහ පුවත්පත් ලියාපදිංචි අංශය
- ලේඛන සංරක්ෂණ අංශය
- පුවත්පත් සූක්ෂම ඡායාගත කිරීමේ අංශය
- ලේඛනාගාර ගොඩනැගිල්ල පුළුල් කිරීමේ අංශය
- ලේඛන කළමනාකරණ ව්‍යාපෘති අංශය
- පර්යේෂණ අංශය
- මහජන සම්බන්ධතා අංශය

- **සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලාංකීය ජනතාව අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය වූ සංවේදී මිනිසුන් බවට පත් කිරීමේ ඒකායන අපේක්ෂාව සපුරා ගැනීම වස්, ශ්‍රී ලාංකික සංස්කෘතිය ගොඩනැගීමේ අරමුණින් යුතුව, ශ්‍රී ලාංකික අනන්‍යතාවයෙන් යුත් සාහිත්‍ය කලා හා සංස්කෘතික කටයුතු සංරක්ෂණය, ප්‍රවර්ධනය, ව්‍යාප්තිකරණය සඳහා වූ වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ආයතන

- ජාතික කලාභවන හා ජෝන් ද සිල්වා සමරු රඟහල
- මහාවංශ සම්පාදන කාර්යාලය
- ශබ්දකෝෂ කාර්යාලය
- විශ්වකෝෂ කාර්යාලය
- එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය පුහුණු පාසල
- වලිසිංහ හරිස්චන්ද්‍ර කෞතුකාගාරය හා සංස්කෘතික කේන්ද්‍රය
- ජාතික කලා නිකේතනය - මහනුවර කුන්ඩසාලේ
- උතුරු දකුණු මිතුරු සෙවණ - මිහින්තලේ
- රාජ්‍ය නැටුම් කණ්ඩායම හා රාජ්‍ය සංගීත කණ්ඩායම

මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරන අනෙකුත් කටයුතු

- සංස්කෘතික, කලා හා සාහිත්‍ය කටයුතු ප්‍රවර්ධනය උදෙසා රාජ්‍ය උත්සව/උළෙල සංවිධානය කිරීම හා කලාකරු සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- සංස්කෘතික, කලා හා සාහිත්‍ය කටයුතු ප්‍රවර්ධනය උදෙසා විශේෂ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- **ශ්‍රී ලංකා කලා මණ්ඩලය**

කලා කටයුතු ප්‍රවර්ධනය, සංරක්ෂණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය අනුමණ්ඩල පත්කොට ඒවාට නායකත්වය සැපයීම හා මඟ පෙන්වීම, සාහිත්‍ය, නාට්‍ය, සංගීත, නර්තන හා මුද්‍රා නාට්‍ය, දෘශ්‍ය කලා, අස්පර්ෂනීය කලා උරුම සහ සම්ප්‍රදායික කලා, රූපවාහිනී, ගුවන් විදුලි හා සිනමා අනුමණ්ඩල මගින් දීප ව්‍යාප්තව කටයුතු සංවිධානය කිරීම, ජාතික මට්ටමේ ඇගයීම්වලට ශිල්පීන් ගෙන ඒම හා ඔවුන් ජාතික තලයට හඳුන්වාදීම මගින් නියමිත ක්ෂේත්‍රයන් තුළ ඉහළම තලයන්හි පිහිටුවීම, ලලිත කලාවන්හි ප්‍රමිතිය වැඩි දියුණු කිරීම, ශ්‍රී ලංකාවට ආවේණික කලා ශිල්ප කර්මාන්ත නගා සිටුවීම, කලා කටයුතු සඳහා සම්බන්ධිත වෙනත් දෙපාර්තමේන්තු, ආයතන, ස්වේච්ඡා සංවිධාන සමග සම්බන්ධවී කටයුතු කිරීම, සාරධර්මවලින් පිරි සමාජයක් බිහි කිරීම සඳහා සුදුසු සංස්කෘතික පරිසරයක් ගොඩනැගීම මෙහි ප්‍රධාන කාර්යයන් වේ.

- **ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය**

ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ පළමු විධායක ජනාධිපති ජූනියස් රිචඩ් ජයවර්ධන ජනාධිපතිවරයාගේ සංකල්පයකට අනුව 1988 අංක 77 දරණ පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම මධ්‍යස්ථානය පුස්තකාලයක්, කෞතුකාගාරයක්, ජනාධිපති ලේඛනාගාරයක් සහ ජපන් කෞතුකාගාරයකින් සමන්විත වේ. එහි කෞතුකාගාරය තුළ ජයවර්ධන මහතාගේ පෞද්ගලික පුස්තකාල එකතුව සහ ඔහුගේ දේශපාලන දිවියට අදාළ ලිපි ලේඛන මෙන්ම ජනාධිපති මහලේකම් කාර්යාලයේ පැවති සමහර ලිපි ලේඛන සහ වාර්තා ද ඔහුගේ ධුර කාලය තුළ ඔහුට ලැබුණු තෑගි භෝග ද තැන්පත් කර ඇත. මෙම මධ්‍යස්ථානය මහජනතාව සඳහා විවෘතව පවතින අතර විවිධ සමාජ සේවා කටයුතු රැසක් ද මේ මගින් වර්තමානයේ ක්‍රියාත්මක කරනු ලබයි.

- **ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

1980 අංක 45 දරණ පනතින් සංශෝධනය කරන ලද, 1971 අංක 47 දරන පනත මඟින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව මෙරට සිනමා කර්මාන්තයේ පරිපාලනය සහ නියාමනය සඳහා ඇති එකම රාජ්‍ය ආයතනය වේ. නව තාක්ෂණ ක්‍රමවේදයන් අනුගමනය කරමින් තෘප්තිමත්, වගකීම් හඳුනාගත්, සුහදශීලී සේවයක් ගනුදෙනුකරුවන්ට ලබා දෙමින්, නිර්මාණකරණයට අවශ්‍ය අධ්‍යාපනය, අනුබලය හා සුභසාධනය ලබා දෙමින් ගුණාත්මක සිනමා සංස්කෘතියක් බිහි කිරීම උදෙසා මෙම ආයතනය කටයුතු කරයි. 1999.06.17 දිනැතිව

එවකට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්, ඩික්සන් නිලවීර මහතා විසින් නිකුත් කරන ලද ජාතික චිත්‍රපට ප්‍රතිපත්තිය හා ඒ පිළිබඳ මාර්ගෝපදේශය මගින් චිත්‍රපට බෙදා හැරීම මණ්ඩල 05ක් යටතේ ක්‍රියාත්මක වේ.

- **ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

ජනතාවගේ දැනුම වර්ධනය කිරීම රටක සංවර්ධන ක්‍රියාවලියේ අතිශයින් වැදගත් කාර්යයකි. සමාජයේ විවිධ ජන කොටස්වලට අවශ්‍ය දැනුම විද්‍යාත්මකව හා ක්‍රමානුකූලව ලබාදීමට අවස්ථාව සලසාදීම රටක පුස්තකාල පද්ධතියෙහි මූලික අරමුණ වේ. ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතිය සංවර්ධය කිරීමේ අරමුණ ඇතිව 1970 අංක 17 දරන පාර්ලිමේන්තු පනත මගින් ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවන ලද අතර 1998 අංක 51 දරන පාර්ලිමේන්තු පනත මගින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය නමින් එහි කටයුතු වඩාත් පුළුල් කෙරිණි.
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කාර්යභාරය ප්‍රධාන අංශ දෙකක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්,

- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම
- ජාතික මට්ටමේ පුස්තකාල සේවා හා සංවර්ධනය කටයුතු ක්‍රියාත්මක කිරීම.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය වන අතර එය දිවයිනේ අනෙකුත් පුස්තකාලවල මව් පුස්තකාලය ලෙස කටයුතු කරයි. එමෙන්ම ජාතික මට්ටමේ පුස්තකාල සංවර්ධන කටයුතු යටතේ පුස්තකාල සඳහා උපදේශන සේවා සැපයීම, පුස්තකාල වැඩිදියුණු කිරීම, පුස්තකාල ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සමීක්ෂණ කටයුතු පැවැත්වීම, පුස්තකාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ප්‍රාදේශීය වශයෙන් ඩිජිටල් පුස්තකාල ආරම්භ කිරීම සඳහා සහයෝගය ලබාදීම, පොත්පත් සංරක්ෂණය සඳහා පුස්තකාල සංරක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම, පුස්තකාල නඟා සිටුවීම සඳහා පළාත් පුස්තකාල සේවා මණ්ඩල සමඟ කටයුතු කිරීම, පුස්තකාල සහයෝගීතා වැඩසටහන් සංවිධානය හා ග්‍රන්ථ ප්‍රකාශනය සඳහා ආධාර කිරීම, ජාතික පුස්තකාලයේ තොරතුරු ඩිජිටල්කරණය කිරීම හා එම තොරතුරු ඇසුරින් ජාතික ඩිජිටල් පුස්තකාලය පවත්වාගෙන යාම වැනි ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කෙරේ.

- **ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය**

ලාංකීය සමාජයට බලපාන ප්‍රසිද්ධ රඟ දැක්වීම් ලෙස, දේශීය චිත්‍රපට, නාට්‍ය සහ සියලුම මහජන සංදර්ශන යන විෂය පථයන් දක්වා ඇත. එහිදී උක්ත විෂය පථයන් ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය යටතේ මහජන ප්‍රදර්ශනය සඳහා සුදුසු ද යන දැක්ම අනුව විමර්ශනය කර ඇත. ඒ අනුව ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය මගින් මේවා සුදුසු පරිදි හා අවශ්‍ය අවස්ථාවල දී පරීක්ෂා කර බලා වර්ගීකරණයට ලක් කිරීම, ප්‍රධාන කාර්ය වේ.

- **පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක සමීක්ෂණ කටයුතු විධිමත් ලෙස සිදුකිරීම සඳහා 1890 ජූලි 07 දින පුරාවිද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව ස්ථාපිත කර, 1940 අංක 9 දරන පුරාවස්තු ආඥා පනතින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නීති ගත කර ඇත. ශාස්ත්‍රීය කටයුතු සිදු කරනු ලබන දෙපාර්තමේන්තුවක් වන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට පැවරී ඇති ප්‍රධාන වගකීම් ක්ෂේත්‍රය වන්නේ ගවේෂණය, කැණීම් හා පර්යේෂණ මගින් ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය නෛතිකව හඳුනා ගැනීම, සංරක්ෂණය හා මනා ලෙස නඩත්තු කර අනාගත පරපුර වෙත ලබාදීම වේ. දෙපාර්තමේන්තුවට පැවරී ඇති මෙම කාර්යභාරය සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලය යටතේ පළාත් හා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාල 15 ක් හා දිවයින පුරා නඩත්තු කලාප කාර්යාල 99 ක් ස්ථාපනය කර ඇත.

- **ටවර් හෝල් රඟහල පදනම**

1978 අංක 01 දරණ ටවර් හෝල් රඟහල පදනම පනතින් ස්ථාපිත ආයතනයකි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු නිලබලයෙන් පත්වන සාමාජිකයන් දස දෙනෙකුගෙන් සහ ගරු අග්‍රාමාත්‍යතුමා විසින් තුන් අවුරුදු කාලයක් සඳහා පත්කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් මගින් පරිපාලනය වේ.

- **ගාලු උරුමය පදනම**

ගාලු උරුමය පදනම 1994 අංක 07 දරන පාර්ලිමේන්තු පනත මගින් රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස පිහිටුවනු ලැබීය. එහි ප්‍රධාන අරමුණු වූයේ ගාලු කොටුව සහ එහි ඓතිහාසික පශ්චාත් භූමිය ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීමයි. මෙතෙක් විවිධ අමාත්‍යාංශ යටතට පත්වූ ගාලු උරුමය පදනම වර්තමානයේ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ගාලු කොටු පවුර පුරාවිද්‍යා ස්මාරකයක් ලෙස 1971 දී ගැසට් කිරීමත්, 1988 දී යුනෙස්කෝව විසින් ලෝක උරුම ස්ථානයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම හේතුකොට ගෙන රජයේ සහ මහජනයාගේ වැඩි අවධානය එයට යොමුවීමත් සමග මෙහි ආරක්ෂාව හා සංරක්ෂණය සඳහා ගාලු උරුමය පදනම විසින් විවිධ පියවර ගනු ලැබිණ.

- **අපේ ගම**

2013 වර්ෂයේ දී පවත්වන ලද පොදුරාජ්‍ය මණ්ඩලීය සමුළුවට සමගාමීව අපේ ගම ස්ථාපිත කිරීමත් සමග විවිධ අමාත්‍යාංශ යටතේ පාලනය වීමෙන් අනතුරුව අවසාන වශයෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලේ ව්‍යාපෘතියක් ලෙස පරිපාලනය වූ නමුත් 2021.11.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් 2021.04.01 දින සිට ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී

ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ විෂය පථයට පවරා ඇත. මේ වන විට බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ජාතික උරුම අංශය යටතේ ක්‍රියාත්මක වේ.

අපේ ගම ජන උරුම ප්‍රදර්ශන මධ්‍යස්ථානය කොළඹ දිස්ත්‍රික්කයේ බත්තරමුල්ල, පැලවත්ත ප්‍රදේශයේ නාගරික සංවර්ධන අධිකාරිය සතු අක්කර 13, රූඩ් 03, පර්චස් 25.1 කින් යුත් භූමි භාගයක ස්ථාපිත කර ඇත.

- **ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය**

ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය 1988 නොවැම්බර් මස 17 වන දින ශ්‍රී ලාංකේය සංස්කෘතියෙන් කෙමෙන් වියැකෙමින් පවතින ජනකලාවන් සහ අස්පර්ශනීය උරුමයන් ආරක්ෂා කරමින් මතු පරපුර වෙත දායාද කිරීමේ උදාර සංකල්පයකට අනුව ආරම්භ කරන ලදී. ආරම්භයේ දී වෘත්තීය පාඨමාලාවලට පමණක් සීමා වූ ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රයේ අනතුරුව සෞන්දර්ය පාඨමාලාවන් ආරම්භ කර ඇත. දිවයිනේ විවිධ ප්‍රදේශවල සිසුසිසුවියන් සහභාගී වීම හේතුවෙන් නේවාසික පාඨමාලා ලෙස මෙම පාඨමාලාවන් පවත්වාගෙන ගොස් ඇත.

2013 වර්ෂයේ සිට නර්තන, සංගීත, චිත්‍ර හා මූර්ති යන පාඨමාලාවන් පැවැත්වෙන අතර වර්තමානයේ වෘත්තීය හා තෘතීයික අධ්‍යාපන කොමිෂමේ සහ ජාතික අධුනිකත්ව පුහුණු අධිකාරියේ අනුමැතියෙන් NVQ 4, 5 සහ 6 ප්‍රාසාංගික කලා වෘත්තීය පාඨමාලාවන් ලෙස වැඩි දියුණු කර ඇත. සෞන්දර්ය විෂයන් සඳහා ජාතික නිපුණතා මට්ටම ලබාගත් ප්‍රථම ආයතනය ලෙස ජනකලා කේන්ද්‍රය හැඳින්විය හැක.

- **ජාතික ප්‍රසාංගික කලා මධ්‍යස්ථානය (නෙළුම් පොකුණ)**

ප්‍රාසාංගික කලාව සබැඳිව, ශ්‍රී ලංකාව වසර 2500ක පමණ ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියයි. විවිධ ස්වරූපයෙන් දක්නට ලැබෙන ප්‍රාසංගික කලාව, ප්‍රදේශය හා ශෛලිය පදනම් කර ගනිමින් සුවිශේෂ වූ ගති ලක්ෂණ විදහා දක්වයි. ඉපැරණි අතීතය මුළුල්ලේම මේ සඳහා රාජකීය අනුග්‍රහය ලැබී ඇත. ප්‍රාසාංගික කලාවේ උන්නතියට රාජ්‍ය අනුග්‍රහය අත්‍යාවශ්‍ය වේ. ශ්‍රී ලංකා රජය ප්‍රාසාංගික කලා රහහල පිහිටුවනු ලබන්නේ වෙසෙසින්ම මෙම අරමුණ පෙරදැරි කරගෙනය. මෙය ශ්‍රී ලංකා කලාකරුවන් වසර ගණනාවක් මුළුල්ලේ දුටු සිහිනයකි. වත්මනෙහි සැබෑ වෙමින් පවතින මෙම සිහිනය ශ්‍රී ලංකා ජනතාවට කලාව සහ සංස්කෘතිය ඇගයීම සඳහා වූ ඉතාමත් උචිත ස්ථානයක් වනු ඇත. මෙම රහහල විවිධ ජනවාර්ගික කණ්ඩායම් වලට අයත් දේශීය ප්‍රාසාංගික කලාවක් හුවමාරු කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවය ගොඩනගා ගැනීම සඳහා තෝතැන්නක් වන්නේය.

- **රන්මිහිතැන්න ජාතික ටෙලි සිනමා උද්‍යානය**

"කලාවෙන් පෝෂිත ජන සමාජයක්" බිහිකිරීමේ උදාර දැක්ම පෙරදැරි කරගෙන ශ්‍රී ලංකාවේ ස්ථාපිත කරන ලද සුවිශේෂී ආයතනයකි. දේශීය හා විදේශීය සිනමා සහ ටෙලි නිර්මාණකරුවන් උදෙසා ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් චිත්‍රාගාර, විවිධ දර්ශන පසුතල (Film Sets) සහ නවාතැන් පහසුකම් සැපයීම මෙහි ප්‍රධාන මෙහෙවර වේ.

ටෙලි සිනමා කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් පහසුකම් සැලසීමට අමතරව, මෙය සංචාරකයින්ට දැනුම හා විනෝදය ලබාගත හැකි ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙසද ක්‍රියා කරයි. උද්‍යානය තුළ පෙර මංගල ඡායාරූපකරණය, වාණිජ වෙළඳ දැන්වීම් රූගත කිරීම් සහ කලා ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපනික පුහුණු වැඩසටහන් සඳහා ද අවස්ථාව සලසා දී ඇත. ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම, ගෝල්ෆ් කාර්ට් රථ සේවා සහ සම්මන්ත්‍රණ ශාලා පහසුකම් මගින් ආදායම් උත්පාදනය කරමින්, ස්වකීය සම්පත් මනා ලෙස කළමනාකරණය කරන මෙම උද්‍යානය, ශ්‍රී ලාංකේය කලා කෙත අනාගත පරපුර වෙත දායාද කරන සජීවී කලා කේන්ද්‍රස්ථානයකි.

- **කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය**

2020/76 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් ‘‘කන්ද උඩරට උරුමය’’ මැයෙන් විෂයක් ව්‍යවස්ථාපිත කරනු ලැබූ අතර එහි විෂය ක්ෂේත්‍රය ලෙස දක්වා ඇත්තේ ‘‘කන්ද උඩරට උරුමය සුරැකීම හා සංවර්ධනය’’ ලෙස ය. ඒ සඳහා, 2017.07.05 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට 2017.08.18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය නිල වශයෙන් 2018 මාර්තු 02 වන දින ස්ථාපනය කරන ලදී.

1.6 අමාත්‍යාංශය යටතේ පවතින අරමුදල්

1.6.1 බුද්ධශාසන අරමුදල

බුද්ධශාසන අරමුදල යනු ශ්‍රී ලංකාවේ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සහ උන්නතිය උදෙසා 1990 අංක 35 දරන පනතින් ස්ථාපිත කරන ලද සුවිශේෂී රාජ්‍ය ආයතනයකි. බුද්ධශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම මෙහි මූලික පරමාර්ථය වන අතර, දේශීය හා විදේශීය පරිත්‍යාගශීලීන්ගේ ආධාර සහ රජයේ මූල්‍ය දායකත්වය මත මෙම අරමුදල ක්‍රියාත්මක වේ.

මෙම අරමුදල මගින් ඉටුකරනු ලබන ශාසනික සේවාවන් අතර සාමණේර භික්ෂූන් වහන්සේලා සහ දසසිල් මාතාවන් සඳහා ශිෂ්‍යාධාර ලබා දීම, රෝගී සහ වයස්ගත භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් වෛද්‍යාධාර හා සුඛසාධන කටයුතු සම්පාදනය කිරීම ප්‍රමුඛ වේ. තවද, දුෂ්කර විහාරස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය, දහම් පොත්පත් මුද්‍රණය සහ භික්ෂූන් වහන්සේලාට ප්‍රායෝගික පුහුණුව ලබා දීම වැනි කාර්යයන් ද මෙහිදී සිදුකෙරේ. දේශීය ආදායම් බදු සහන සහතික නිකුත් කරමින් පරිත්‍යාගශීලීන් දිරිමත් කරන බුද්ධශාසන අරමුදල, ශ්‍රී ලංකාව තුළ බුදුදහම සුරක්ෂිතව පවත්වාගෙන යාම සඳහා කැපවී සිටින ප්‍රධාන මූල්‍ය කේන්ද්‍රස්ථානයයි.

1.6.2 මධ්‍යම සංස්කෘතික අරමුදල

මධ්‍යම සංස්කෘතික අරමුදල (Central Cultural Fund) යනු ශ්‍රී ලංකාවේ අනන්‍ය වූ සංස්කෘතික උරුමයන් සුරැකීම සහ කළමනාකරණය කිරීම උදෙසා 1980 අංක 57 දරන පාර්ලිමේන්තු පනතින් පිහිටුවන ලද ප්‍රමුඛතම රාජ්‍ය ආයතනයකි. ලෝක උරුමයක් බඳු වූ "සංස්කෘතික ත්‍රිකෝණය" කේන්ද්‍ර කරගනිමින් ආරම්භ වූ මෙම ආයතනය, දිවයින පුරා විහිදී ඇති ස්පර්ශණීය සහ අස්පර්ශණීය උරුමයන් ගවේෂණය, සංරක්ෂණය සහ ප්‍රවර්ධනය කිරීමෙහිලා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි.

පෞරාණික ස්මාරක සහ ජේතවනාරාමය වැනි මහා පරිමාණ ව්‍යාපෘති නඩත්තු කිරීමට අමතරව, ආගමික කටයුතු ප්‍රවර්ධනය සහ කලාකරුවන්ට අතහිත දීම මෙහි ප්‍රධාන වගකීමකි. නූතන තාක්ෂණය භාවිත කරමින් උරුමයන් ප්‍රදර්ශනය කිරීම සහ සංචාරක ආකර්ෂණය දිනා ගැනීම හරහා මෙරට ආර්ථිකයට හා ජාතික සමගියට දායක වීම මෙහි අරමුණයි. විශේෂයෙන්ම, ස්වයං පෝෂිත ආදායම් මාර්ග තුළින් සිය සේවාවන් විධිමත් කරමින්, ජාතික උරුමය අනාගත පරපුර උදෙසා සුරක්ෂිතව දායාද කිරීමට මෙම ආයතනය කැපවී සිටියි.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති

I.

- ව්‍යාපෘතියේ නම :බෞද්ධ විහාරස්ථාන සඳහා සූර්යයබල විදුලිය ලබාදීමේ ඉන්දීය මූල්‍ය ව්‍යාපෘතිය
- දායක නියෝජිත ආයතනය : ඉන්දියානු රජය හා ශ්‍රී ලංකා රජය
- ක්‍රියාත්මක බලධාරී ආයතනය : බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
- ඇස්තමේන්තු ගත වියදම : ඉන්දියානු මුල්‍ය ප්‍රදාන ඇ.ඩො.මි. 10.00

II.

- ව්‍යාපෘතියේ නම :ශ්‍රී ලංකාව සඳහා ජාතික උරුම ප්‍රතිපත්ති සංවර්ධනය පිළිබඳ තෙදින වැඩමුළුවක් ක්‍රියාත්මක කිරීම
- දායක නියෝජිත ආයතනය : ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව
- ක්‍රියාත්මක බලධාරී ආයතනය : බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
- ඇස්තමේන්තු ගත වියදම : රු. මි. 6.06
- ව්‍යාපෘති කාල සීමාව : 2024-2025

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 2025 දී ක්‍රියාත්මක වැඩසටහන් හා ව්‍යාපෘති ප්‍රගතිය

2.1.1 බුද්ධශාසන අංශය

(වගු අංක 1 - වර්ෂ 2025 දී ක්‍රියාත්මක වැඩසටහන් හා ව්‍යාපෘති ප්‍රගතිය 2025.12.31 දිනට)

අනු අංකය	වැඩසටහන / ව්‍යාපෘතිය	2025 අයවැය මගින් ප්‍රතිපාදන ලැබීම් (රු.මි.)	භෞතික ප්‍රගතිය (%)	2025.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	විශේෂ කරුණු
1.	පූජාභූමි සංවර්ධන වැඩසටහන	25.00	100%	24.91	-
2.	ග්‍රාමීය බෞද්ධ විහාරස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන	110.89	100%	108.28	-
3.	අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම	52.00	-	-	ඉදිකිරීම් සිදුකර අවසන්ව ඇත. ප්‍රතිපාදන භාවිතා කිරීමේ අවශ්‍යතාවයක් ඇති නොවීම.
4.	තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන	10.00	100%	8.89	-
5.	විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය ඉදිකිරීම - කැළණිය	137.11	100%	84.13	-
6.	බෞද්ධ විහාරස්ථාන සඳහා සූර්යයබල විදුලිය ලබාදීමේ ඉන්දීය මූල්‍ය ව්‍යාපෘතිය	13- 1040.00 17- 90.00	18%	0.71	මෙම ව්‍යාපෘතිය සඳහා ඉඩම ලබා ගැනීමේ කටයුතු අවසන් කර ඇත. පූර්ව ශක්‍යතා අධ්‍යයනය අවසන් කර ඇත. තවද ග්‍රිඩ් පහසුකම සඳහා ලං.වි.ම. වෙතින් ඉල්ලීම් කර ඇත.

2.1.1.1 පූජාභූමි සංවර්ධනය

සංස්කෘතික හා ආධ්‍යාත්මික වශයෙන් සුපෝෂිත පුරවැසියෙකු ජනිත කිරීමේ අරමුණින් ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයට අයත් ආගමික පූජනීය උරුමයන් සංරක්ෂණය කොට අනාගත පරපුර වෙත දායාද කිරීමේ අමාත්‍යාංශයීය කාර්යභාරය සාක්ෂාත් කරනු පිණිස කිසියම් විහාරස්ථානයක්, පල්ලියක්, කෝවිලක් හෝ දේවාලයක් පූජා භූමියක් ලෙස හඳුනාගෙන ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමත්, පූජාභූමි සන්නස් පත්‍ර ප්‍රදානයත්, එම පූජා භූමි සංවර්ධනය කිරීමත් පූජාභූමි සංවර්ධන වැඩසටහන යටතේ සිදුකරනු ලබයි. මෙය ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය එක්ව දියත් කරන ක්‍රියාදාමයකි.

පූජාභූමියක් ලෙස නම් කිරීමේදී සැලකිල්ලට ගන්නා නිර්ණායක :-

- ආගමික වැදගත්කම
- ඓතිහාසික වැදගත්කම
- පුරාවිද්‍යාත්මක වැදගත්කම
- සංස්කෘතික වැදගත්කම
- ගෘහ නිර්මාණ ශිල්පීය වැදගත්කම
- පාරිසරික වැදගත්කම
- ආර්ථික හා සමාජීයීය වැදගත්කම

ඒ අනුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් පැරණි ආගමික ස්ථානයන්හි පූජනීයත්වයත්, පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වටිනාකමත් කෙරෙහි අවධානය යොමු කරමින් එම ස්ථාන ජාතික, කලාපීය සහ ප්‍රාදේශීය වශයෙන් කොටස් තුනකට වර්ගීකරණය කොට මෙම නිර්ණායක වලට අනුව ගැලපෙන ස්ථාන 1946 අංක 13 දරන (269 වැනි අධිකාරිය වූ) නගර හා ග්‍රාම නිර්මාණ අඥාපනතේ 6 (2) (ආ) හා 21 (2) (ආ) වගන්ති යටතේ පූජනීය ස්ථාන වශයෙන් හා එම යෝජනා ක්‍රමය යටතේ දියුණු කිරීමට යෝජිත භූමි ප්‍රදේශ "නාගරික සංවර්ධන ප්‍රදේශ" ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කරයි.

2025 වසරේදී පූජා භූමි සංවර්ධනය සඳහා වෙන් වූ අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 25 ක් වූ අතර, පළාත් 06ක දිස්ත්‍රික් 8 ක පූජාභූමි 11ක සංවර්ධන ව්‍යාපෘති 13 ක කටයුතු සඳහා රු. මී. 25.00 ක ප්‍රතිපාදන නිදහස් කර ඇත. ඒ සඳහා වියදම් වූ මුදල රු.මී. 24.91 කි. එයට අමතරව මෙම ව්‍යාපෘතිය යටතේ මිහින්තලය ජාතික පොසොන් උත්සවය සඳහා රු.මී. 2.1 ක් ලබා දී ඇත. මෙම වර්ෂයේ පූජා භූමි ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද සිද්ධස්ථාන සංඛ්‍යාව 14කි.



ලංකාරාම රජමහා විහාරයේ දානශාලාවේ සංවර්ධන කටයුතු



හම්බන්තොට ථේරපුත්තාභය රජමහා විහාරයේ ධර්ම ශාලාවේ ඉතිරිවැඩ නිම කිරීම

(වගු අංක 2 - 2025 වර්ෂයේ පූජාභූමි සංවර්ධන ව්‍යාපෘති සඳහා නිදහස් කරන ලද ප්‍රතිපාදන සාරාංශය - 2025.12.31 දිනට)

අනු අංකය	පළාත	දිස්ත්‍රික්කය	අනුමත ව්‍යාපෘති ගණන	2025.12.31 දිනට වියදම (රු.මි.)	2025.12.31 දිනට ප්‍රගතිය	
					මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
01.	උතුර	වව්නියාව	01	3.50	100%	100%
02.	උතුරු මැද	අනුරාධපුර	02	3.00	100%	100%
				2.50	100%	100%
03.	නැගෙනහිර	අම්පාර	05	1.98	100%	100%
				0.50	100%	100%
				2.00	100%	100%
				1.00	100%	100%
				2.00	100%	100%
04.	දකුණ	හම්බන්තොට	01	1.99	100%	100%
05.	මධ්‍යම	නුවරඑළිය	01	1.99	99%	100%
		මහනුවර	01	1.00	100%	100%
		මාතලේ	01	1.47	98%	100%
06.	වයඹ	කුරුණෑගල	01	1.98	99%	100%
එකතුව	**06**	**08**	**13**	**24.91**	**99.7%**	**100%**

පූජා භූමි සන්නස් ප්‍රදානය 2025

රාජ්‍ය වෙසක් උත්සවය - සන්නස් ප්‍රදානය

2025 රාජ්‍ය වෙසක් උත්සවය නුවරඑළිය දිස්ත්‍රික්කයේ නගරසභා ශාලාවේදී ඉතා උත්කර්ෂවත් ලෙස පැවැති අතර එහිදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ මලියදේව රජමහා විහාරය හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඓතිහාසික ගොන්නව ශ්‍රී විශ්ණු දේවාලය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සන්නස් ප්‍රදානය ඉතා උත්කර්ෂවත් ලෙස සිදු කරන ලදී.





බටපොත ශ්‍රී සුදර්ශනාරාමය - සන්නස් ප්‍රදානය

කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බටපොත ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේ ශ්‍රී සන්නස් ප්‍රදානය 2025.02.02 දින එම විහාරස්ථානයේදී ගරු බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ඉතා සාර්ථකව පවත්වන ලදී.

ඓතිහාසික හේන්කඩුව රජමහා විහාරය - සන්නස් ප්‍රදානය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඓතිහාසික හේන්කඩුව රජමහා විහාරයේ ශ්‍රී සන්නස් ප්‍රදානය 2025.03.13 දින එම විහාරස්ථානයේදී ගරු බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගමගෙදර දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සාර්ථකව පවත්වන ලදී.

සංඛපිටිටි රජමහා විහාරය - සන්නස් ප්‍රදානය

කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඓතිහාසික සංඛපිටිටි රජමහා විහාරයේ ශ්‍රී සන්නස් ප්‍රදානය 2025.08.18 දින එම විහාරස්ථානයේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් උත්කර්ෂවත් ලෙස පවත්වන ලදී.



විදියගොඩ රජමහා විහාරය - සන්නස් ප්‍රදානය

කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් විදියගොඩ රජමහා විහාරයේ ශ්‍රී සන්නස් ප්‍රදානය 2025.11.08 දින එම විහාරස්ථානයේදී ඉතා සාර්ථකව පවත්වන ලදී.






2.1.1.2 ග්‍රාමීය බෞද්ධ විහාරස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන

බුද්ධශාසනයේ දිගුකාලීන ස්ථායීතාව ඇති කිරීම හා බෞද්ධ උරුම ස්ථාන ආරක්ෂා කිරීමේ අමාත්‍යාංශයීය කාර්යභාරය ක්‍රියාවට නැංවීමේ දී බෞද්ධ විහාරස්ථානයන්හි භෞතික පහසුකම් ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. මෙහිදී බුදුදහමේ චිරස්ථිතිය වෙනුවෙන් අදාළ විහාරස්ථානය දක්වන දායකත්වය සලකා බලා විහාරස්ථානයේ අත්‍යාවශ්‍යයෙන්ම සිදුකළ යුතු සංවර්ධන කටයුතු සහ ආපදාවට පත් විහාරස්ථානයන්ට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතු ව්‍යාපෘති වශයෙන් තෝරා ගැනීම සිදුවේ.

2025 වසරට අදාළව ග්‍රාමීය බෞද්ධ විහාරස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන වෙනුවෙන් රුපියල් මිලියන 110.89 ක ප්‍රතිපාදන වෙන් විය. එසේ වෙන් වූ ප්‍රතිපාදන වලින් 2025.12.31 වන විට දිස්ත්‍රික් මට්ටමින් තෝරා ගත් විහාරස්ථානයන්හි අදාළ ව්‍යාපෘති 215 ක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 108.28 ක් වැයකර ඇත.



දන්කොටුව, බටහිර කටුකෙන්ද ශ්‍රී මුණි ගුණාරාම විහාරස්ථානයේ ධර්මශාලා ගොඩනැගිල්ල ඉතිරි වැඩ නිමකිරීම



පුස්සැල්ලාව, නවකඩදොර, ප්‍රියදර්ශනාරාම විහාරස්ථානයේ
ධර්මශාලාව සංවර්ධනය කිරීම

(වගු අංක 3 - 2025 වර්ෂයේ විහාරස්ථාන සංවර්ධන ව්‍යාපෘති සඳහා වැය කරන ලද ප්‍රතිපාදන සාරාංශය -2025.12.31 දිනට)

අනු අංක	දිස්ත්‍රික්කය	විහාරාධාර		ආපදා		මුළු ප්‍රතිපාදන		2025.12.31 දිනට ඉතිරිය (රු.මි.)
		ව්‍යාපෘති ගණන	ප්‍රතිපාදන (රු.මි.)	ව්‍යාපෘති ගණන	ප්‍රතිපාදන (රු.මි.)	ව්‍යාපෘති ගණන	ප්‍රතිපාදන (රු.මි.)	
1.	කොළඹ	4	2.00	3	0.73	7	2.73	2.71
2.	ගම්පහ	9	4.50	5	1.05	14	5.55	5.43
3.	කළුතර	3	1.50	4	1.19	7	2.69	2.68
4.	මහනුවර	14	7.58	4	2.55	18	10.13	9.53
5.	මාතලේ	12	5.75	-	-	12	5.75	5.75
6.	නුවරඑළිය	21	12.2	2	0.61	23	12.81	12.69
7.	ගාල්ල	14	6.92	6	1.90	20	8.82	8.51
8.	මාතර	5	2.50	3	1.50	8	4.00	3.95
9.	හම්බන්තොට	8	3.59	-	-	8	3.59	3.55
10.	යාපනය	-	-	-	-	-	-	-
11.	මන්නාරම	4	2.00	-	-	4	2.00	1.99
12.	වවුනියාව	-	-	-	-	-	-	-
13.	මුලතිව්	-	-	-	-	-	-	-
14.	කිලිනොච්චිය	-	-	-	-	-	-	-
15.	මඩකලපුව	-	-	1	0.70	1	0.70	0.68
16.	අම්පාර	5	2.50	1	0.14	6	2.64	2.59
17.	ත්‍රිකුණාමලය	2	1.00	-	-	2	1.00	0.99
18.	කුරුණෑගල	15	7.29	3	1.50	18	8.80	8.26
19.	පුත්තලම	9	6.50	-	-	9	6.50	6.42
20.	අනුරාධපුරය	17	14.17	3	1.20	20	15.37	15.32
21.	පොළොන්නරුව	8	4.00	-	-	8	4.00	4.00
22.	බදුල්ල	4	1.90	2	1.50	6	3.40	3.37
23.	මොනරාගල	5	2.30	-	-	5	2.30	2.28
24.	රත්නපුර	6	2.60	2	1.08	8	3.68	3.44
25.	කෑගල්ල	3	1.50	8	2.93	11	4.43	4.13
	මුළු එකතුව	**168**	**92.30**	**47**	**18.58**	**215**	**110.89**	**108.28**

2.1.1.3 කැළණිය විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව

කැළණිය විද්‍යාලංකාර පිරිවෙනට මූල්‍යමය දායකත්වයක් ලබාදීමේ අරමුණින් ඉදිකිරීම් අරම්භ කරන ලද විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාවේ විදුලි පද්ධතිය නැවත ඉදිකිරීමේ හා හඳුනාගත් අත්‍යාවශ්‍ය ඉදිකිරීම් සිදුකිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කරමින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අනුමැතිය අනුව මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2025 වර්ෂය සඳහා රු.මි. 137.11 ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. විදුලි පද්ධතිය නැවත ඉදිකිරීම සම්පූර්ණයෙන් අවසන් කරන ලද අතර 2025.12.31 දිනට අවසන් කළ හැකි බවට හඳුනාගත් අත්‍යාවශ්‍ය කාර්යයන්ගෙන් කොටසක්ද නිම කරන ලද අතර 2025.12.31 දිනට මෙම වැය විෂයෙහි මූල්‍යමය ප්‍රගතිය රු.මි. 84.13 කි. අමාත්‍යාංශය වෙත ඉංජිනේරුවරයකු නොසිටීම හේතුවෙන් වැඩ ආරම්භය ප්‍රමාද වූ අතර ඒ හේතුවෙන් වර්ෂ අවසානයට පෙර ඇතැම් අතිරේකව හඳුනාගත් කාර්යයන් නිම කිරීමට කාලය ප්‍රමාණවත් නොවුණි.





2.1.1.4 අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම

මෙම අමාත්‍යාංශය යටතේ පවතින ටී.බී. ජයා මාවත, කොළඹ 10 යන ස්ථානයේ පිහිටි මහල් 9 කින් සමන්විත අර්ධ වශයෙන් වැඩ නිමකර තිබූ ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ අදියර වශයෙන් නිම කරමින් මෙම අමාත්‍යාංශය යටතේ කුලී පදනම මත පෞද්ගලික ස්ථානයන්හි පවත්වාගෙන යනු ලැබූ ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව හා හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව එහි ස්ථාපිත කරන ලදී.

2025 වර්ෂය සඳහා වෙන් වී තිබූ රු.මි. 52.00 ක ප්‍රතිපාදන භාවිතයට ගෙන නොතිබුණි. එනම් මූලික ඇස්තමේන්තුව සැකසීමේදී වැට බදු ගණනය නොකිරීම හේතුවෙන් ඒ සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමක් සිදුකර තිබුණි. නමුත් මූලික ඇස්තමේන්තුවට වඩා අඩු පිරිවැයක් යටතේ කාර්යය සැලසුම් කළ පරිදි සම්පූර්ණයෙන් නිමකර ඇත. එබැවින් මෙම ප්‍රතිපාදන මුදල භාවිත කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනැගුණි.

2.1.1.5 පුණ්‍යග්‍රාම වැඩසටහන

විනයගරුක, ගුණගරුක, සාරධර්ම පිරි නිරෝගීමත්, සාධාරණ සමාජයක් උදෙසා පුණ්‍යවන්ත ග්‍රාමයක් බිහි කිරීම තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන තුළින් අපේක්ෂා කරයි. එබැවින් මෙම වැඩසටහන යටතේ සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන් හා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

2025 වර්ෂයේ පුණ්‍යග්‍රාම / මත්ද්‍රව්‍ය නිවාරණ වැය විෂය සඳහා රු.මි. 10ක මුදලක් වෙන්වූ අතර, 2025.12.31 දින වන විට පුණ්‍යග්‍රාම - සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන වෙනුවෙන් දිස්ත්‍රික්ක 20ක ගම්මාන 98ක් සඳහා වැඩසටහන් 847ක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.මි. 8.89ක් වියදම් කර ඇත.

දිවිවා සුළි කුණාටුව හේතුවෙන් ඇතිවූ ආපදා තත්ත්වය මත දෙසැම්බර් මාසයේ ක්‍රියාත්මක කිරීමට අනුමත කරන ලද වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

(වගු අංක 4 - පුණ්‍යග්‍රාම වැඩසටහන යටතේ වූ ව්‍යාපෘති සඳහා වැය කරන ලද ප්‍රතිපාදන සාරාංශය - 2025.12.31 දිනට)

අනු අංකය	දිස්ත්‍රික්කය	සාරධර්ම හා සමාජ සංවර්ධන වැඩසටහන් සඳහා	
		වැඩසටහන් ගණන	අනුමත ප්‍රතිපාදන (රු.මි.)
01.	කොළඹ	14	0.17
02.	ගම්පහ	16	0.21
03.	කළුතර	28	0.29
04.	මහනුවර	59	0.66
05.	මාතලේ	43	0.29
06.	නුවරඑළිය	52	0.27
07.	ගාල්ල	62	0.59
08.	මාතර	70	0.70
09.	හම්බන්තොට	65	0.55
10.	අම්පාර	36	0.28
11.	ත්‍රිකුණාමලය	10	0.17
12.	මඩකලපුව	11	0.07
13.	කුරුණෑගල	108	1.07
14.	පුත්තලම	64	0.52
15.	අනුරාධපුරය	21	0.19
16.	පොළොන්නරුව	16	0.16
17.	බදුල්ල	29	0.34
18.	මොණරාගල	30	0.48
19.	රත්නපුරය	44	0.48
20.	කෑගල්ල	67	0.72
21.	සිරි දළදා වන්දනාව - සිතුවම් දැක්ම	01	0.47
22.	ජාතික වෙසක් උත්සවය	01	0.10
එකතුව		**847**	**8.78**



කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, විතිකුලිය ශ්‍රී පුණ්‍යවර්ධනාරාම විහාරස්ථානයේ පැවැති “සමගියට අගයක් ” අන්තර් ආගමික සහජීවන වැඩසටහන



කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, සේරුවාව යක්ගිරිලෙන් රජමහා විහාරස්ථානයේ පැවති ළමා අපචාර හා කාන්තා හිංසනය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන



දිට්වා සුළිකුණාටුවේ බලපෑමෙන් පීඩාවට පත් කන්දෙවත්ත වසමේ පුංචි දරුවන් සඳහා සංවිධානය කරන ලද මානසික සුවතා වැඩසටහන



මහනුවර අස්ගිරි මහාවිහාර මහ පිරිවෙනෙහි ක්‍රියාත්මක කරනු ලැබූ මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන

2.1.1.6 බෞද්ධ විහාරස්ථාන සඳහා සූර්යයබල විදුලිය ලබාදීමේ ඉන්දීය මූල්‍ය ප්‍රදාන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ බෞද්ධ විහාරස්ථානයන්හි විදුලි අවශ්‍යතාව සඳහා සහන සැලසීමේ පරමාර්ථයෙන් ඉන්දීය මූල්‍ය ප්‍රදාන යටතේ සූර්යයබල විදුලිය ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. මේ යටතේ භූමිය මත සවිකරන මෙගාවොට් 10ක සූර්ය පැනල පද්ධතියක් මගින් නිපදවන විදුලිය ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කර එමගින් විහාරස්ථානවල විදුලි පරිභෝජනය වෙනුවෙන් සහන සැලසීමට අපේක්ෂා කරයි.

ඒ අනුව මේ වනවිට ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් හම්බන්තොට පිහිටි අක්කර 30ක භූමියක් නීත්‍යානුකූලව ලබාගෙන ඇති අතර මෙහි උපදේශක ආයතනය වන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් පූර්ව ශක්‍යතා අධ්‍යයනය ද සිදුකර ඇත. යෝජිත ව්‍යාපෘති කාලසීමාව තුළ ව්‍යාපෘතිය නිම කිරීමට සැලසුම් කර ඇත.

2.1.1.7 වෙනත්

- **වීසා නිර්දේශ ලබා දීම**

විදේශගත වන භික්ෂූන් වහන්සේලාට හා විදේශවල සිට මෙරටට වැඩම කර මෙහි රැඳී සිටින භික්ෂූන් වහන්සේලාට වීසා ලබා ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම සිදුවේ.

i. 2025 වර්ෂයේදී විදේශගත වන ශ්‍රී ලාංකීය භික්ෂූන් වහන්සේලා සඳහා වීසා නිර්දේශ ලිපි 1191 ක් නිකුත් කර ඇත.

ii. මෙරටට වැඩම කිරීමට නියමිත විදේශීය භික්ෂූන් වහන්සේලාට පැමිණීමේ වීසා ලබා ගැනීම සඳහා නිර්දේශ ලිපි 276 ක් හා මෙරටට වැඩම කර මෙහි රැඳී සිටින භික්ෂූන් වහන්සේලාගේ වාස වීසා දීර්ඝ කිරීම සඳහා නිර්දේශ ලිපි 650 ක් නිකුත් කර ඇත.

- **තීරුබදු සහන සඳහා නිර්දේශ ලබා දීම**

සිද්ධස්ථාන වෙත ආනයනය කරනු ලබන පූජා භාණ්ඩ වෙනුවෙන් තීරු බදු සහන ලබා ගැනීම සඳහා නිර්දේශ ලිපි ලබා දීම සිදුවේ. 2025 වර්ෂය තුළ ලබාදී ඇති නිර්දේශ සංඛ්‍යාව 15 කි.

- **සහන මිලට දැව/වැලි ලබා ගැනීමට නිර්දේශ ලිපි ලබාදීම**

අධිකරණය මගින් රාජසන්තක කරනු ලබන වැලි සහ දැව සහන මිලට සිද්ධස්ථානවල ඉදි කිරීම් කටයුතු සඳහා ලබා ගැනීමට අධිකරණ අමාත්‍යාංශය වෙත නිර්දේශ ලබා දීම සිදුවේ. 2025 වර්ෂය තුළ ලබා දී ඇති නිර්දේශ සංඛ්‍යාව 362 කි. (දැව- 28 , වැලි- 334)

- **දඹදිව වන්දනා චාරිකා සංගම් ලියාපදිංචි කිරීම හා සංචාර වෙනුවෙන් වීසා ගාස්තු සහන ලබා ගැනීම සඳහා නිර්දේශ ලබා දීම**

දඹදිව වන්දනා චාරිකා සංවිධාන මෙම අමාත්‍යාංශයෙන් ලියාපදිංචි කිරීම සිදුවේ. එකී ලියාපදිංචි සංවිධාන වෙත චාරිකා ගමන්වාර සඳහා වීසා සහන ලබා ගැනීමට නිර්දේශ ලිපි ලබාදීම සිදුවේ.
2025 වර්ෂයේදී වන්දනාකරුවන් 29,276ක් සඳහා දඹදිව සංචාර සඳහා ග්‍රාටිස් වීසා නිර්දේශ ලිපි නිකුත් කර ඇත.

- **විශ්‍රාමශාලා නඩත්තුව හා සංවර්ධනය**

මෙම අමාත්‍යාංශය සතුව දේශීය හා විදේශීය වශයෙන් පහත සඳහන් විශ්‍රාමශාලා පවතී. ඒවායේ නඩත්තුව හා පාලනය අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබයි.

  - **නේපාලයේ පිහිටි දුටුගැමුණු විශ්‍රාම ශාලාව**

නේපාලයේ ලුම්බිණියෙහි රූපන්දෙහි යන ස්ථානයේ පිහිටා ඇත. නේපාලයේ ලුම්බිණි සංවර්ධන භාරය විසින් ශ්‍රී ලංකා රජය වෙත පිරිනමා ඇති භූමියක පිහිටා ඇති මෙම විශ්‍රාම ශාලාව නේපාලයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අධීක්ෂණය යටතේ මෙම අමාත්‍යාංශය මගින් පාලනය වේ. එකවර 161 දෙනෙකුට පමණ නවාතැන් පහසුකම් ලබාගත හැකිය. සම්මන්ත්‍රණ ශාලාවක් හා විවෘත උත්සව ශාලාවකින් යුක්තය.




- **අනුරාධපුර කුරුන්දන්කුලම රජරට චාරිකා නිවාසය**

එකවර තිස්දෙනෙකුට පමණ නේවාසික පහසුකම් සැපයිය හැකි මෙම නිවාඩු නිකේතනය මිහින්තලා පාර, කුරුන්දන්කුලම, අනුරාධපුරය යන ස්ථානයේ පිහිටා ඇත.




2.1.1.8 ආගමික කටයුතු අංශය යටතේ ඉටුකළ කාර්යයන්

ආගමික සහජීවනය උදෙසා සියලු ආගම්වලට අයත් දෙපාර්තමේන්තු එක් අමාත්‍යාංශයක් යටතේ ස්ථාපිතකර පවත්වාගෙන යන අතර බෞද්ධ, හින්දු, මුස්ලිම් සහ ක්‍රිස්තියානි යන ආගමික කටයුතු දෙපාර්තමේන්තු මගින් සිදුවන සියලු ආගමික කටයුතු සම්බන්ධීකරණය, අධීක්ෂණය සිදුකරනු ලබන්නේ ආගමික කටයුතු අංශය මගිනි.

ආගමික හා සමාජ සහජීවනය උදෙසා පහත සඳහන් කාර්යයන් මෙම අංශය මගින් ඉටුකරනු ලබයි.

- අමාත්‍යාංශය යටතේ ඇති බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හා ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු වල ආයතන නොවන අනෙකුත් සියලු රාජකාරි කටයුතු අධීක්ෂණය සහ මගපෙන්වීම.

- එම දෙපාර්තමේන්තු වල විෂය පථයට අදාළව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සකස් කිරීමට අවශ්‍ය සහය ලබාදීම සහ ඒවායේ තීරණ ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු සිදුකිරීම.

- සියලු ආගමික දෙපාර්තමේන්තු වලට අදාළ ඉඩම් හා ආගමික කටයුතුවලට සම්බන්ධ වෙනත් රාජකාරි ඉටුකිරීම.

- හින්දු ආගමික, මුස්ලිම් ආගමික හා ක්‍රිස්තියානි ආගමික කටයුතු යන දෙපාර්තමේන්තු තුනෙන් නිර්දේශ කර අප වෙත යොමුකරනු ලබන ඒ ඒ ආගම්වලට අදාළ පූජ්‍ය ප්‍රසාදීන් හා පුද්ගලයන් සඳහා පැමිණීමේ වීසා ලබා දීම හා වාස වීසා දීර්ඝ කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂක නිෂ්කාෂණ ලබා ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කිරීම, එම අමාත්‍යාංශය විසින් දැනුවත් කරන වෙනත් විශේෂ කරුණු සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීම, ආගමන විගමන දෙපාර්තමේන්තුව හා අනෙකුත් අදාළ ආයතන සම්බන්ධීකරණය සහ දැනුවත් කිරීම.

- ආගමික චාරිකා සඳහා වීසා සහන වෙනුවෙන් නිර්දේශ ලබා දීම.

- විහාරස්ථාන, කෝවිල්, පල්ලි සහ දේවස්ථාන ප්‍රතිසංස්කරණ හා සංවර්ධන කාර්යයන් වෙනුවෙන් ආධාර මුදල් ලබාදීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා අදාළ දෙපාර්තමේන්තු වෙත යොමු කිරීම.

- සියලුම ආගමික ස්ථාන මුල්කරගනිමින් සමාජය තුළ පැන නගින නීතිමය හෝ සාමාජීය ප්‍රශ්න නිරාකරණය කරගැනීම සඳහා අමාත්‍යාංශය මැදිහත් වී, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා දෙපාර්තමේන්තුවලට අවශ්‍ය උපදේශයන් හා නිර්දේශයන් ලබාදීම.

- මුස්ලිම් ආගමික ග්‍රන්ථ මෙරටට ආනයනය කිරීමේදී එම ග්‍රන්ථ රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා අවශ්‍ය ආරක්ෂක නිශ්කාෂණ, ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ලබාගැනීම සහ එම තීරණ සම්බන්ධයෙන් රේගු දෙපාර්තමේන්තුව සහ අදාල අනෙකුත් පාර්ශව දැනුවත් කිරීම.

- ආගම් අතර අන්තර් සහයෝගය හා සහෝදරත්වය වර්ධනය වන පරිදි සහජීවන වැඩසටහන් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

- රාජසන්තක කරන ලද ගොඩනැගිලි ද්‍රව්‍යයන් ආගමික සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණ හා සංවර්ධන කටයුතු වෙනුවෙන් සහන මිලට ලබාදීම සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

- ආගමික කටයුතු උදෙසා දෙපාර්තමේන්තු වෙත විදේශයන්ගෙන් ලැබෙන පරිත්‍යාගයන් රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා අමාත්‍යාංශය මැදිහත් වීම.

- සියලු ආගමික සිද්ධස්ථාන ඉදිකිරීම හා පවත්වාගෙන යාම, අනවසර ආගමික ස්ථාන ඉදිකිරීම පිළිබඳ කටයුතු ඉටුකිරීම සහ මෙම කටයුතුවලදී ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.

- සියලු ආගමික දෙපාර්තමේන්තුවලට අදාළව අන්තර්ජාතික කටයුතු, විදේශ අමාත්‍යාංශය, තානාපති කාර්යාල හා මහ කොමසාරිස් කාර්යාල මගින් කරනු ලබන ඉල්ලීම්, යෝජනා සම්බන්ධව කටයුතු කිරීම හා එම කටයුතු අධීක්ෂණය කිරීම.

2.1.2 සංස්කෘතික කටයුතු අංශය

සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන, සංස්කෘතික කටයුතු අංශය යටතේ ක්‍රියාත්මක ප්‍රධාන වැඩසටහනකි. මේ යටතේ, දිවයින පුරා විසිරී සිටින දරු දැරියන්ගේ හා කලාකරුවන්ගේ කලා කුසලතා ඔප්නැංවීම සඳහා රංගකලා අධ්‍යයනාගාර, පුස්තකාල පහසුකම් සහ නවීන පහසුකම්වලින් යුත් රංග ශාලාවක් ස්ථාපනය කිරීම අරමුණු කරගනිමින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ‘‘සංස්කෘතික මධ්‍යස්ථානයක්’’ පිහිටුවීමට කටයුතු කර ඇත. මෙය සාම්ප්‍රදායික රංග කලාවන් සහ සම්භාව්‍ය සංස්කෘතික අංග සංරක්ෂණයකර, ඉන් පෝෂිත සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට හා මෙම සංස්කෘතිකාංග පොදු මහජනයා අතරට ගෙන යාමට දායක වන විධිමත් යාන්ත්‍රණයකි.

2.1.2.1 සංස්කෘතික මධ්‍යස්ථාන මගින් ලබාදෙන මූලික සේවාවන්

- **පුහුණු පාඨමාලා පැවැත්වීම**

දීපව්‍යාප්තව පිහිටා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන 222, අගයෙන් ඉහල කලා නිර්මාණ බිහිකිරීමට අවශ්‍ය අධ්‍යයනය හා පුහුණුව ලබාගතහැකි ආයතනික ව්‍යූහයක් බවට පත්කිරීම අරමුණුකර ගනිමින්, එම සංස්කෘතික මධ්‍යස්ථානවල, අංකුර කලාකරුවන් සඳහා නව දැනුමක් ලබා දෙන පුහුණු පාඨමාලා පැවැත්වීමට කටයුතු සලසා ඇත. එහිදී ගායන, වාදන, නර්තන යනාදී කලා කුසලතාවයන් සපුරාගැනීමට අපේක්ෂා කරන්නන් සඳහා සහභාගී විය හැකි පරිදි ප්‍රමිතියෙන් යුතු වැඩසටහන් පැවැත්වේ. තවද, විශේෂයෙන් ජනශ්‍රැති පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම හා පර්යේෂණ කටයුතු සඳහා මේවායෙහි අවස්ථාව සලසා දී ඇති අතර, පහත පාඨමාලා ද සංවිධානය කර ඇත.

- උඩරට, පහතරට, සබරගමු, භරත, කථක් සහ ජන නැටුම් පාඨමාලාව
- පෙරදිග සහ අපරදිග සංගීතය පාඨමාලාව
- නාට්‍ය හා රංග කලා පාඨමාලාව
- චිත්‍ර, මූර්ති සහ කැටයම් කලා පාඨමාලාව
- ජ්‍යොතිෂ්‍ය පාඨමාලාව
- කායික හා මානසික සංවර්ධන පාඨමාලාව
- අත්කම් නිපැයුම්, බතික් නිර්මාණ පාඨමාලාව
- සිංහල, දෙමළ, ඉංග්‍රීසි, පාලි හා සංස්කෘත භාෂාවන් පිළිබඳ පාඨමාලාව
- අංගම්පොර ශිල්ප පාඨමාලාව
- මුස්ලිම් රබන් / ලී කෙළි නර්තන පාඨමාලාව
- ජනසන්නිවේදන පාඨමාලාව
- දේශීය හෙළ වෙදකම පාඨමාලාව
- චීන සාම්ප්‍රදායික සටන් කලා පාඨමාලාව
- රූපලාවන්‍ය පාඨමාලා

- **පුස්තකාල සේවාවන් සැපයීම**

සෑම ප්‍රාදේශීය මධ්‍යස්ථානයකම පිහිටුවා ඇති පුස්තකාල මගින් පාසල් ළමුන්ගේ සහ ජනතාවගේ කියවීමේ රුචිය ඉහළ නැංවීමේ සහ අධ්‍යාපනයට රුකුලක් වීමේ අදහසින් මෙම සේවාව ක්‍රියාත්මක කර ඇත. ඇතැම් මධ්‍යස්ථාන මගින් දුෂ්කර ප්‍රදේශවල පිහිටුවා ඇති ග්‍රාමීය සමාජ සඳහා ජංගම පුස්තකාල සේවා ද ආරම්භ කර ඇත.

- **සංස්කෘතික සේවාවන් සැපයීම**

ප්‍රාදේශීය ජනතාවගේ අවශ්‍යතාවය මත ආගමික/සංස්කෘතික උත්සව අවස්ථා සඳහා ප්‍රදේශයේ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් සංස්කෘතික සේවාවන් සැපයීම සිදු කරයි. මේ යටතේ ජයමංගල ගාථා කණ්ඩායම්, හේවිසි කණ්ඩායම්, මඟුල් බෙර කණ්ඩායම්, වෙස් නැටුම් කණ්ඩායම්, නර්තන කණ්ඩායම්, වීදි නාට්‍ය කණ්ඩායම් හා ගිහි පිරිත් කණ්ඩායම් ආදිය සපයනු ලබයි.

- **ආගමික/සංස්කෘතික/අධ්‍යාපනික හා සමාජ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රාදේශීය වශයෙන් වසර පුරා විවිධ ආගමික/සංස්කෘතික/අධ්‍යාපනික වැඩසටහන් තම සංවර්ධන අරමුදලින් /ප්‍රදේශවාසීන්ගේ මූල්‍ය දායකත්වයෙන්/රජයේ දායකත්වයෙන් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

- **සංස්කෘතික මධ්‍යස්ථාන ජාතික නර්තන සංචිතය පවත්වා ගැනීම**

සංස්කෘතික මධ්‍යස්ථානවල සෞන්දර්යය පාඨමාලා හදාරන සිසුන් අතුරින් ප්‍රතිභා පූර්ණ සිසු සිසුවියන්ගෙන් සමන්විත නර්තන සංචිතයක් පවත්වාගෙන යනු ලබයි. රාජ්‍ය/ජාතික උත්සව සඳහාත් විදේශීය සංස්කෘතික සංචාර සඳහාත් මෙම නර්තන සංචිතය දායකත්වය සපයනු ලබයි.

2.1.2.2 සංස්කෘතික කටයුතු අංශය මගින් 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය

අනු අංකය	වැය විෂය විස්තරය	2025 ප්‍රතිපාදන රු.මි.	වියදම 2025.12.31 දිනට රු.මි.	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම					
1.	සංස්කෘතික මධ්‍යස්ථාන 101-02-05-09-1409 (112)	82.00	70.85	86%	86%
2.	ගොඩනැගිලි හා ඉදිකිරීම් 101-02-05-2001	43.60	37.33	85%	95%
3.	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ 101-02-05-2002	2.00	1.84	92%	88%
4.	සංස්කෘතික මධ්‍යස්ථාන වෙත ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ ලබාදීම 101-02-05-2102	8.40	7.91	94%	100%
5.	සංස්කෘතික මධ්‍යස්ථාන වෙත යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ ලබාදීම. 101-02-05-2103	10.00	8.54	85%	100%
6.	සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් හා වැඩිදියුණුකිරීම 101-02-05-23-2104	64.70	50.81	78%	84%
7.	සංස්කෘතික මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලය පුහුණු කිරීම 101-02-05-2401	1.90	1.79	94%	94%
විශේෂිත සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් (පුනරාවර්තන) ක්‍රියාත්මක කිරීම					
8.	වෙනත් 101-02-05-09-1409(99)	20.00	13.52	68%	68%
9.	විදේශ සංස්කෘතික සබඳතා වැඩසටහන 101-02-05-09-1409(113)	1.00	0.41	41%	41%
විශේෂිත සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් (ප්‍රාග්ධන) ක්‍රියාත්මක කිරීම					
10.	ජාතික උරුමයන් සංරක්ෂණය හා ප්‍රවර්ධන වැඩසටහන් 101-02-05-31-2509	24.90	18.45	74%	81%
11.	අමරදේව අසපුව ඉදිකිරීම 101-02-05-37-2104	146.54	13.10	9%	83%

2.1.2.3 සංස්කෘතික කටයුතු අංශය මගින් 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය විස්තරාත්මකව

සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම

I. සංස්කෘතික මධ්‍යස්ථාන - 101-02-05-09-1409 (112)

2025 වර්ෂයට අදාළව සම්පත්දායකයන් ලියාපදිංචි කර ඇති මධ්‍යස්ථානවල පාඨමාලා ආරම්භ කර සම්පත්දායකයින් සඳහා ගෙවීම් සිදුකිරීම සිදු කර ඇති අතර පූර්ව ළමාවිය සංවර්ධන පාඨමාලා ආරම්භ කර ඇති මධ්‍යස්ථානවල සම්පත්දායකයින් සඳහා ගෙවීම් සිදු කිරීම.

තවද, 2025 වසරේ කුසලතා සංවර්ධන පාඨමාලා පැවැත්වීමට නියමිත සංස්කෘතික මධ්‍යස්ථාන 222 න් සංස්කෘතික මධ්‍යස්ථාන 212 ක කුසලතා සංවර්ධන වැඩසටහන් ආරම්භ කර ඇත.

II. ගොඩනැගිලි හා ඉදිකිරීම් - 101-02-05-2001

සංස්කෘතික මධ්‍යස්ථාන 37ක අළුත්වැඩියා කටයුතු සඳහා රු.මි.43.53 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිදහස් කර ඇත. ඉන් මධ්‍යස්ථාන 31 ක භෞතික ප්‍රගතිය 100% ක් වන අතර මධ්‍යස්ථාන 02ක භෞතික ප්‍රගතිය 75%-95% කි. මධ්‍යස්ථාන 05 ක් සඳහා ප්‍රතිපාදන නොවැම්බර් හා දෙසැම්බර් මාසවල ලබා දුන් අතර දිවිවා සුළි කුණාටුව තත්ත්වය මත අළුත්වැඩියා කටයුතු ප්‍රමාද විය. එහෙත් ඒවායේ ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

(01.දොම්පේ 02.බණ්ඩාරගම, 03.කල්මුණේ (උතුර), 04.කැළණිය, 05.ගිරිබාව, 06 ගල්ගමුව, 07. උඩුබද්දාව, 08.මල්ලවපිටිය, 09.පුත්තලම, 10.දංකොටුව, 11.මධ්‍යම නුවරගම් පළාත, 12.කැබිතිගොල්ලෑව, 13.කැකිරාව, 14.නාඋල, 15.ගෝමරන්කඩවල, 16.සංඝරාජපුර, 17.උඩුදුම්බර, 18.යක්කලමුල්ල, 19.බෝපේ පෝද්දල, 20. එරාවුර් නගරය, 21.ලංකාපුර, 22.බෙලිඅත්ත, 23.පේදුරුතුඩුව, 24.වේයන්ගොඩ, 25. කල්මුණේ (මුස්ලිම්), 26. යටිනුවර 27.යටවත්ත 28. මතුගම 29. පන්නල 30. මරදන්කඩවල 31. ගලේවෙල 32. මැදදුම්බර 33. සොරණාතොට 34. සියඹලාණ්ඩුව 35. කොටපොල 36. කරුවිට 37. පල්ලම.)

III. යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ - 101-02-05-2002

සංස්කෘතික මධ්‍යස්ථාන 16ක නර්තන හා සංගීත භාණ්ඩ අළුත්වැඩියා කටයුතු සඳහා රු.මි.1.9 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිදහස් කර ඇත. ඉන් මධ්‍යස්ථාන 15ක භෞතික ප්‍රගතිය 100% ක් වන අතර, එක් මධ්‍යස්ථානයක කටයුතු සිදු කරමින් පවතී.

(01.අත්තනගල්ල, 02.පොල්ගහවෙල, 03.නිහගොඩ, 04.දෙනිපිටිය, 05.කඹුරුපිටිය, 06.වීරකැටිය, 07. කටුවන, 08. කඩුවෙල, 09. වැලිවිටිය-දිවිතුර, 10. බද්දේගම, 11. කරන්දෙනිය, 12. පල්ලේපොල, 13. මාතලේ, 14. සංඝරාජපුර, 15.ගලිගමුව, 16. කෑගල්ල.)

IV. ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ - 101-02-05-2102

2025 ක්‍රියාකාරී සැලැස්මට අනුව සංස්කෘතික මධ්‍යස්ථාන 28ක් සඳහා ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන නිදහස් කර ඇත.

(1. ගලිගමුව, 2.මහවිලච්චිය, 3. මධ්‍යම නුවරගම් පළාත, 4. තිරප්පනේ, 5. පදියතලාව, 6. වීරකැටිය, 7. නියාගම, 8. කරන්දෙනිය, 9. බෙන්තොට, 10. බද්දෙගම, 11. කාතන්කුඩි, 12. එරාවුර් ටවුන්, 13. ලංකාපුර, 14. සන්දිලිප්පායි, 15. මල්ලවපිටිය, 16. පන්නල, 17. වාරියපොල, 18. පුත්තලම, 19. දොඩංගොඩ, 20. කොරස, 21. දිවුලපිටිය, 22. ඇහැලියගොඩ, 23. බලංගොඩ, 24. සංඝරාජපුර, 25. කඹුරුපිටිය, 26. ලග්ගල, 27.අඹන්ගහකෝරළේ 28.ගෝමරන්කඩවල)

V. යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ ලබාදීම - 101-02-05-2103

2025 ක්‍රියාකාරී සැලැස්මට අනුව සංස්කෘතික මධ්‍යස්ථාන 18ක් සඳහා යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත රු.මි.10 ක ප්‍රතිපාදන නිදහස් කර ඇති අතර, ඉන් රු.මි.6.8 ක ප්‍රතිපාදනයක් ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදී ගැනීමට යොදවන ලදී.

(1.හොරොව්පතාන, 2. කැබිතිගොල්ලෑව, 3. මහවිලච්චිය, 4. ඉරක්කාමම්, 5. පදියතලාව, 6. කල්මුණේ (මුස්ලිම්), 7. කල්මුණේ (දෙමළ), 8.පඬුවස්නුවර, 9. පොල්ගහවෙල, 10. කුලියාපිටිය-බටහිර, 11. කොරස, 12. මීරිගම, 13. මාදම්පේ, 14. මාස්පොත, 15. පේදුරුතුඩුව, 16. පාලින්දනුවර, 17. සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය, 18.බෙලිඅත්ත.)

VI. ඉදිකිරීම් හා වැඩිදියුණුකිරීම - 101-02-05-23-2104

සංස්කෘතික මධ්‍යස්ථාන 20 ක අළුත්වැඩියා කටයුතු සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත රු.මි. 58.3 ක ප්‍රතිපාදන නිදහස් කර ඇත. ඉන් මධ්‍යස්ථාන 13 ක ප්‍රගතිය 100% ක්ද, මධ්‍යස්ථාන 03ක ප්‍රගතිය 80%-100% ත් අතරද, මධ්‍යස්ථාන 02ක ප්‍රගතිය 50%-80% ත් අතරද වශයෙන් භෞතික ප්‍රගතියක් පෙන්වා ඇත.
රු.මි. 6.4 ක ප්‍රතිපාදන සූරියවැව මධ්‍යස්ථානයේ ඉදිකිරීම්වලට අදාළ බිල්පත් පියවීම සඳහා ගිණුම් අංශය වෙත යොමු කර ඇතත් බිල්පත සඳහා ගෙවීම් කර නොමැත.

(1. උහන, 2. පදියතලාව, 3. තිරුක්කෝවිල්, 4. ඉරක්කාමම්, 5. වැලිගෙපොල, 6. හාරිස්පත්තුව, 7. පානදුම්බර, 8. කුලියාපිටිය-බටහිර, 9. පොල්ගහවෙල, 10. මාවතගම, 11. දෙහිඕවිට, 12. කෑගල්ල, 13. බෝපේ-පෝද්දල, 14. සන්දිලිප්පායි, 15. ගලෙන්බිඳුණුවැව, 16. මහඔය, 17. අත්තනගල්ල, 18. ගම්පොල උඩපළාත, 19.සූරියවැව, 20. මිල්ලනිය.)

VII. සංස්කෘතික මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලය පුහුණු කිරීම - 101-02-05-2401

අප්‍රේල් 4,5,6 දිනයන්හි නව ස්ථානභාර නිලධාරීන් සඳහා ගිණුම් කටයුතු, කාර්යාල කළමනාකරණය හා සංවර්ධන සංගමයේ මූල්‍ය කටයුතු සම්බන්ධ තෙදින වැඩමුළුව පැවැත්වූ අතර සංස්කෘතික මධ්‍යස්ථාන නිලධාරීන් හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අනුයුක්ත නිලධාරීන් සඳහා සංස්කෘතික වැඩමුළු 02 ක් 2025 දෙසැම්බර් 26 හා 27 දෙදින කොළඹ සහ

ගම්පහ දිස්ත්‍රික්ක සඳහා වේයන්ගොඩ ජාතික පුහුණු මධ්‍යස්ථානයේදීත් 2025 දෙසැම්බර් 27 හා 28 දෙදින දකුණ හා සබරගමු පළාත් සඳහා ඇඹිලිපිටිය නායකත්ව පුහුණු මධ්‍යස්ථානයේදීත් පවත්වන ලදී.

2.1.2.4 විශේෂිත සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් (පුනරාවර්තන) ක්‍රියාත්මක කිරීම

VIII. වෙනත් - **101-02-05-09-1409 (99)**

- **සමාජ සංස්කෘතික ඒකාබද්ධතාවය සඳහා විශේෂ වැඩසටහන් පැවැත්වීම.**

2025 වර්ෂයේ පෙරහැර සහ උත්සව සඳහා මූල්‍යාධාර සැපයීම.

- ජාතික වෙසක් උත්සවයේ සංස්කෘතිකාංග සැපයීම.
- ජාතික පොසොන් බැතිගී උත්සව ආදියෙහි සංස්කෘතිකාංග සැපයීම.
- පෙරහැර උත්සව හා වෙනත් විශේෂ උත්සව සඳහා සංස්කෘතික අංග ලබා දීම.
- මිහින්තලා විහාර පොසොන් හේවිසි පූජාව සඳහා මුදල් ලබා දීම.
- වේයන්ගොඩ ශ්‍රී නාගේන්ද්‍රාරාම විහාර පෙරහැර සඳහා මුදල් ලබා දීම.
- පිටබැද්දර රොටුඹ විහාර පෙරහැර හා හොරණ ඉසිපතනාරාම පෙරහැර සඳහා සහභාගිවූ සංස්කෘතික මධ්‍යස්ථාන ශිල්පීන්ට මුදල් ගෙවීම.
- ඇසළ පෙරහැරට සමගාමීව නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටි පිටිසර දේවාල 16 ක් සඳහා ප්‍රතිපාදන ලබා දීම.
- ඇසළ පෙරහැරට සමගාමීව මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි අම්බොක්ක ශ්‍රී පත්තිනි දේවාල පෙරහැර සඳහා මුදල් ලබා දීම.

- **2025 අන්තර් රාජ්‍ය සේවා සම්මාන ප්‍රදානෝත්සවය පැවැත්වීම.**

මෙම තරඟාවලිය සඳහා නිර්මාණ 1,765ක් ඉදිරිපත්වී ඇත. තරඟාවලිය සිංහල හා දමිළ යන භාෂා මාධ්‍යයන් දෙකෙන්, තරඟ අංශ 15ක් යටතේ පවත්වා ඇති අතර තරඟකරුවන් 181 දෙනෙකු සම්මානයට පාත්‍රවන ලදී.

- **අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම.**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති පහත සඳහන් සංස්කෘතික මධ්‍යස්ථාන මගින් 2025 වර්ෂයට අදාළව පැවැත්වූ විශේෂ සංස්කෘතික වැඩසටහන් සඳහා ප්‍රතිපාදන ලබා දීම.

- මන්මුණේ උතුර - මහාශිව රාත්‍රී වැඩසටහන සඳහා
- කැබිතිගොල්ලෑව - ගී රස විඳින වැඩසටහන සඳහා
- පාතදුම්බර - සොකරි නාට්‍ය සංදර්ශනය සඳහා
- අලව්ව - දැතින් දැතට අලුත් අවුරුදු වැඩසටහන සඳහා
- වාරියපොල - පුන්සිත් ජනනී වැඩසටහන සඳහා

- පොල්ගහවෙල - සොකරි ජන නාට්‍ය වැඩසටහන සඳහා
- කැස්බෑව - මඩු බැසීමේ මංගල්‍ය හා දෙවොල් මඩු ශාන්තිකර්ම වැඩසටහන සඳහා
- බටහිර කුලියාපිටිය - හෙළයේ සංස්කෘතික හුවමාරු වැඩසටහන සඳහා
- අක්කරපත්තුව - රිදී ජුබිලි සැමරුම් උත්සවය සඳහා
- පල්ලේපොල - රජත ජුබිලිය සැමරුම් උත්සවය සඳහා
- දඹුල්ල - කොහොඹා කංකාරිය ශාන්තිකර්මයේ ශිල්පීය දීමනා සඳහා
- මැදදුම්බර - ''නුපුර නදී'' සංස්කෘතික ප්‍රසංගය සඳහා
- ගම්පල උඩපළාත හා මාතර-නූපේ - දහඅට ශාන්තිකර්ම සඳහා

- **ආබාධ සහිත ප්‍රජාවගේ සංස්කෘතික අයිතීන් ප්‍රවර්ධනය කිරීම.**

ආබාධ සහිත පුද්ගලයන්ගේ 2025 ගායන/වාදන තරඟාවලිය පවත්වා සම්මාන උත්සවය පවත්වා ඇත.

ආබාධ සහිත පුද්ගලයන්ගේ ස්වයං චරිතාපදාන සංග්‍රහය මුද්‍රණය කර ඇති අතර ආබාධ සහිත පුද්ගලයන්ගේ ජංගම පුස්තකාල වැඩසටහන සංස්කෘතික මධ්‍යස්ථාන මට්ටමින් ආරම්භ කර ඇත.

- **බන්ධනාගාර රැඳවියන්ගේ කලා කුසලතා හා පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.**

බන්ධනාගාර රැඳවියන්ගේ කලා කුසලතා ප්‍රවර්ධනය හා පෞරුෂත්ව වර්ධනය කිරීමට අදාළ සෞන්දර්ය විෂය පාඨමාලා සතිපතා පැවැත්වීම හා 2025.07.05 දින අඹේපුස්ස බන්ධනාගාරයේ හා 2025.08.03 දින මීගමුව දළුගම තරුණ වරදකරුවන්ගේ විශෝධන බන්ධනාගාරයේ රැඳවියන් සඳහා පෞරුෂත්ව සංවර්ධන එක් දින පුහුණු වැඩමුළු පැවැත්වීම සිදු කරන ලදී.

IX. විදේශ සංස්කෘතික සබඳතා වැඩසටහන - 101-02-05-09-1409 (113)

ශ්‍රී ලංකාව හා විදේශ රාජ්‍ය අතර සංස්කෘතියට අදාළව අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් සංශෝධනය හා නව ව්‍යාපෘති සම්බන්ධ සාකච්ඡා පවත්වා ඇත.
විදේශ රටවල් සමග පැවති වැඩසටහන් හා විදේශ සංචාර සඳහා රාජ්‍ය නැටුම් කණ්ඩායම හා නර්තන සංචිතයේ ශිල්පීන් සහභාගි කරවන ලදී.
BIMSTEC රැස්වීම පැවැත්වීම හා Jaffna Cultural Center සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීම සිදුකර ඇත.

2.1.2.5 විශේෂිත සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් (ප්‍රාග්ධන) ක්‍රියාත්මක කිරීම

X. ජාතික උරුමයන් සංරක්ෂණය හා ප්‍රවර්ධන වැඩසටහන් - 101-02-05-31-2509

- **අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන ''ප්‍රතිභා'' තරඟාවලිය පැවැත්වීම.**

පාරම්පරික නර්තන කලාවන් නූතන පරපුරට හඳුන්වා දීමේ අරමුණින්, උඩරට, පහතරට සහ සබරගමු නර්තන සම්ප්‍රදායන් නූතන ශිෂ්‍ය ප්‍රජාව වෙත නැවුම් මුහුණුවරකින් හඳුන්වාදීම අරමුණු කරගනිමින් සංවිධානය කරනු ලබන වැඩසටහනක් ලෙස සංස්කෘතික මධ්‍යස්ථාන අතර පවත්වන අන්තර්

සංස්කෘතික මධ්‍යස්ථාන ‘‘ප්‍රතිභා’’ තරඟාවලිය හඳුන්වා දිය හැකිය. පාරම්පරික නර්තන කලාව ප්‍රවර්ධනය හා ප්‍රචාරණය කිරීම වාර්ෂිකව සංවිධානය කරනු ලබන මෙම වැඩසටහනේ ප්‍රධාන අභිප්‍රායයි.

2025 වර්ෂයේ සම්මාන ප්‍රදානෝත්සවය 2025.12.24 දින පවත්වන ලදී. 2025 වර්ෂයේ පැවති ප්‍රතිභා තරඟාවලිය ශිල්පීන් 5,000කගේ පමණ සහභාගීත්වයෙන් පවත්වන ලද අතර නර්තනය හා සංගීතය යන අංශවලින් ශිල්පීන් 3,390ක් හා චිත්‍ර අංශයෙන් ශිල්පීන් 40ක් සඳහා ජාතික මට්ටමේ සහතික පත්‍ර ලබා දෙන ලදී.

- **නර්තන සංචිතයෙන් ප්‍රසංගයක් පැවැත්වීම.**

පළාත් මට්ටමින් කුසලතාවයන් දක්වන අංකුර කලාකරුවන් තෝරාගනිමින් අමාත්‍යාංශයේ නර්තන සංචිතය ස්ථාපිත කර ඇත. දේශීය මෙන්ම විදේශීය ප්‍රසංග අවස්ථා ඔස්සේ එම අංකුර කලාකරුවන්ට ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ප්‍රාසාංගික අත්දැකීම් ලබාදීම හා ඔවුන් දිරිගැන්වීම අරමුණු කර ඇති අතර සංචාරක කර්මාන්තය සමග ඒකාබද්ධව ප්‍රසංග ඉදිරිපත් කිරීමට ද ඔවුනට අවකාශ සැලසේ.

මේ වන විට දිස්ත්‍රික් හා ජාතික වශයෙන් තෝරාගත් ශිල්පීන් 125 දෙනෙකුගෙන් සමන්විත ජාතික නර්තන සංචිතය පිහිටුවා ඇත.

“Sri Lankan Day” ජාතික වැඩසටහන හා සමගාමීව දෙසැම්බර් මාසයේ නර්තන ප්‍රසංගය නෙළුම්පොකුණ රඟහලේදී පැවැත්වීමට කටයුතු සූදානම්කර තිබුණද, දිවයිනට බලපෑ ආපදා තත්ත්වය හේතුවෙන් නර්තන ප්‍රසංගය නොපැවැත්වීය.

- **ආබාධිත ප්‍රජාවගේ සංස්කෘතික අයිතීන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම.**

ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ සමාජ ආකල්ප වෙනස් කිරීමේ අරමුණින් මානව පුස්තකාල තෙදින වැඩසටහන, කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට සමගාමීව BMICH පරිශ්‍රයේදී සාර්ථකව පැවැත්වීම.

ආබාධ සහිත ලේඛකයන් සඳහා සාහිත්‍ය වැඩමුළුව 2025.12.29 දින පවත්වන ලදී.

- **අස්පර්ශනීය උරුමයන් සුරක්ෂිත කිරීම හා අනාගත පරපුරට පවරා දීම සඳහා වැඩසටහන් සිදු කිරීම.**

අස්පර්ශනීය උරුමයන් සුරක්ෂිත කිරීම සම්බන්ධව අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් මත ජාතික කමිටුව පත් කරන ලදී.

ලාක්ෂා හා සේසත් නාමයෝජනා සහ කුරුඳු සම්බන්ධ නාමයෝජනාව UNESCO වෙත ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය සැලසුම් කරන ලදී.

දකුණු පළාත් සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් සඳහා අස්පර්ෂ උරුම ලේඛනගත කිරීම පිළිබඳව පුහුණු වැඩමුළුවක් පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් දකුණු පළාත් සභා පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලද අතර අස්පර්ශනීය ජාතික උරුම ජාතික කමිටු මාසික හමුව ද පවත්වන ලදී.

- **ළමා සාහිත්‍ය ප්‍රවර්ධනය කිරීම.**

ළමා සාහිත්‍ය ප්‍රවර්ධනය වෙනුවෙන් You Tube නාලිකාව ජනගත කිරීම අප්‍රේල් මස සිදු කරන ලද අතර සංස්කෘතික මධ්‍යස්ථාන පෙර පාසල් ගුරු පුහුණු වැඩමුළුව නොවැම්බර් මස 01,02,03 යන දිනවලදී පවත්වන ලදී.

- **ආන්තික ප්‍රජාවන් බලගැන්වීම සඳහා සමාජ සංස්කෘතික වැඩසටහන් පැවැත්වීම.**

දෙමටගොඩ හල්ගහවත්ත ප්‍රජා සංවර්ධන සුබසාධක සංගමයේ දරුදැරියන් ජාතික කෞතුකාගාරය නැරඹීමට රැගෙන යාම හා ඔවුන් වෙනුවෙන් චිත්‍ර වැඩමුවවක් පවත්වන ලදී.

2025.09.27,28,29,30 දිනවලදී නාරාහේන්පිට - දාබරේ මාවත, වනාතමුල්ල, හල්ගහවත්ත හා සීවලීපුර යන ප්‍රදේශ ආශ්‍රිත දරුවන් මානව පුස්තකාලය වැඩසටහන සඳහා සම්බන්ධකර ගනිමින් සංස්කෘතික පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී.

තවද, ආන්තික ප්‍රජාව බලගැන්වීමේ වැඩසටහනට අදාළව පුහුණු වැඩසටහනක් මිහින්තලය ‘‘උතුරු - දකුණු මිතුරු සෙවන’’ සංස්කෘතික හුවමාරු මධ්‍යස්ථානයේදී 2026.11.27 හා 30 දිනවල පවත්වන ලදී.

- **කඳුකර වතු ජනතාවගේ සංස්කෘතික අංග හඳුනාගෙන වැඩසටහන් පැවැත්වීම.**

නුවරඑළිය පේඩෘ තේවත්ත සහ හපුතලේ දඹේතැන්න වතුයාය තුළ දරුවන් වෙනුවෙන් විශේෂ නාට්‍ය වැඩමුළුවක් පවත්වන ලද අතර සංස්කෘතික හුවමාරු වැඩසටහන යටතේ යාපනය හා තෙලිප්පලෛ තේ වතු ප්‍රජාව සඳහා වැඩසටහන් පවත්වන ලදී.

තේ වතු ප්‍රජාව සඳහා හඟුරන්කෙත - හේවාහැට වතුයාය හා බලංගොඩ - රාස්සගල වතුයාය නව සංස්කෘතික සමාජ පිහිටුවීම.

එසේම කඳුකර වතු ජනතාවගේ සංස්කෘතික අනන්‍යතා හඳුනාගැනීම සහ ආරක්ෂා කිරීමේ අරමුණින් ප්‍රවර්ධන වැඩසටහනක් ලෙස රාගල, පේඩෘ, දඹේතැන්න, හේවාහැට හා රාස්ස යන වතු සඳහා භරත නර්තනය, සංගීත හා චිත්‍ර පාඨමාලාවන් සම්පත්දායකයින් යොදවාගෙන ඉගැන්වීම් කටයුතු සිදුකිරීම හා සංස්කෘතික සමාජ සෞන්දර්ය වැඩමුළු 02ක් පැවැත්වීම ආදී කටයුතු සිදුකරන ලදී.

- **සෞන්දර්ය පාඨමාලා සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම.**

2025 ඔක්තෝබර් මස 10, 11 හා 12 යන දිනවල සංස්කෘතික මධ්‍යස්ථාන සෞන්දර්ය පාඨමාලා සඳහා මාර්ගෝපදේශ සකස් කිරීමේ මූලික පියවර සම්බන්ධ වැඩමුළුවක් වෙයන්ගොඩ ජාතික පුහුණු මධ්‍යස්ථානයේ දී සිදු කර ඇත.

XI. අමරදේව අසපුව - **101-02-05-37-2104**

ආචාර්ය පණ්ඩිත් ඩී. අමරදේව ශූරීන් විසින් සංගීත ක්ෂේත්‍රයට සිදු කරන ලද අනභිභවනීය ජාතික මෙහෙවර කෘතවේදීව අගයනුවස් 2017 වසරේදී විශේෂ අයවැය යෝජනාවක් ලෙස අමරදේව අසපුව ඉදිකිරීම සිදු කරන ලදී. මෙහිදී අංකුර කලාකරුවන්ගේ දක්ෂතා වර්ධනය කරගැනීමේ ස්ථානයක් ලෙස

ද, පර්යේෂණයන් සිදුකිරීම හා වැඩමුළු පැවැත්වීමේ ස්ථානයක් ලෙස ද, භාවිතා කළ හැකි මහඟු තෝතැන්නක් කලාකරුවන් සඳහා සැකසීමේ අරමුණින් මෙය ඉදිකිරීම ආරම්භ කරන ලදී.

මේ වන විට අමරදේව අසපුව ඉදිකිරීම්වලට අදාළ උප කොන්ත්‍රත් ලබා දීම් සහ ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුවලට අදාළ අමුද්‍රව්‍ය මිලදී ගැනීම හා ගෙවතු අලංකරණ කටයුතු සිදු කර ඇත.

සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් පිළිබඳ මූලික තොරතුරු

පළාත	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොට්ඨාශ සංඛ්‍යාව	අමාත්‍යාංශය මගින් ඉදිකර ඇති ක්‍රියාත්මක සං.ම.සංඛ්‍යාව	විවෘත කිරීමට නියමිත සං.ම. සංඛ්‍යාව	ඉදිකරමින් පවතින නව සං.ම. සංඛ්‍යාව	ඉදිකිරීම් නවතා ඇති සං.ම. සංඛ්‍යාව
මධ්‍යම	මහනුවර	20	15	-	-	-
	මාතලේ	11	11	-	-	-
	නුවරඑළිය	05	04	-	-	-
නැගෙනහිර	අම්පාර	20	10	03	01	-
	මඩකලපුව	14	06	-	-	-
	ත්‍රිකුණාමලය	11	06	-	-	-
උතුරු මැද	අනුරාධපුර	22	15	01	-	-
	පොළොන්නරුව	07	06	-	-	-
උතුර	යාපනය	15	09	-	-	-
	කිලිනොච්චි	04	-	-	-	-
	මන්නාරම	05	-	-	-	-
	මුලතිව්	06	-	-	-	-
	වවුනියා	04	02	-	-	-
වයඹ	කුරුණෑගල	30	23	02	-	-
	පුත්තලම	16	09	02	-	-
සබරගමුව	කෑගල්ල	11	09	-	-	-
	රත්නපුර	17	08	-	01	02
දකුණ	ගාල්ල	19	14	-	-	-
	හම්බන්තොට	12	07	-	01	-
	මාතර	16	16	-	-	-
ඌව	බදුල්ල	15	14	-	-	-
	මොනරාගල	11	07	01	-	-
බස්නාහිර	කොළඹ	13	07	-	-	-
	ගම්පහ	13	09	01	-	-
	කළුතර	14	13	01	-	-
	එකතුව	**331**	**220**	**11**	**03**	**02**

ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය

1. හැඳින්වීම.

මහජන ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන චිත්‍රපට හා වේදිකා නාට්‍ය සංදර්ශන සඳහා අනුමැතිය ලබා දීම ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ මූලික කාර්යය බව එහි මුල්ම ආඥා පනත වන වර්ෂ 1912 අංක 07 දරණ ප්‍රසිද්ධ රැඟුම් ආඥා පනතෙහි (Public Performances Ordinance) සඳහන්ව ඇත. එසේම ආරම්භයේදී මෙම පනතෙන් ආවරණය වූ විෂය ක්ෂේත්‍රය වඩා පුළුල් විය. එනම් සැණකෙළි (Carnivals), චිත්‍රපට (Cinema) හා සමාජ ශාලා (Clubs) යන ක්ෂේත්‍රයන් ද එහි බලාධිකාරයට යටත් විය.

1912 ආඥා පනත 1918, 1919 යන වර්ෂයන්හිදී සංශෝධනය කරන ලද අතර ස්ථිර රැඟුම් පාලක මණ්ඩලයක් ස්ථාපනය කෙරෙනුයේ වර්ෂ 1952 අංක 23 දරණ ආඥා පනතිනි. වර්ෂ 1956 දී සංස්කරණයක් සිදුවූ අතර වර්ෂ 1961 (අංක 41), 1964 (අංක 26), 1969 (අංක 11) සංශෝධනයන් සිදුකර ඇත. මුල් ආඥා පනත ප්‍රසිද්ධ රැඟුම් සඳහා පමණක් සීමා වූ පනතක් බවට පත්වූයේ වර්ෂ 1961 සංශෝධන අනුවය.

ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගේ සංයුතිය

ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ සාමාජික මහත්ම මහත්මීන්ගේ වගකීම වනුයේ ලංකාව තුළ ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන චිත්‍රපට, වේදිකා නාට්‍ය, සංදර්ශන නිරීක්ෂණය කර අනුමැතිය ලබා දීමයි.

පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගේ සංයුතිය 1983 දී 25 දක්වා වැඩි කළ අතර 1997 සේනක බණ්ඩාරනායක කමිටු වාර්තාව අනුව එහි සාමාජිකයන් ගණන 15 කට සීමා කළ යුතු බවට යෝජනා කෙරිණි. ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය ඉහළම බලාධිකාරිය යටතේ ප්‍රතිෂ්ඨාපනය කල යුතු අතර එහි විෂය ක්ෂේත්‍රය රූපවාහිනී මාධ්‍ය හා වීඩියෝ කර්මාන්තයද අනාවරණය වන පරිදි පුළුල් විය යුතු බවට වැඩි දුරටත් යෝජනා කෙරිණි. නමුත් රූපවාහිනී ක්ෂේත්‍රය මෙතෙක් රැගුම් පාලක මණ්ඩලයේ අධීක්ෂණයට ලක් වී නොමැත.

රැගුම් පාලක මණ්ඩලයේ චිත්‍රපට සමීක්ෂණ මණ්ඩලයේ වගකීම වනුයේ ලංකාව තුළ ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන චිත්‍රපට, වේදිකා නාට්‍ය, චිත්‍රපට හෝ වේදිකා නාට්‍ය නොවන සංදර්ශන නිරීක්ෂණය කර අනුමැතිය ලබා දීමයි.

මෙහිදී කිසිදු ප්‍රමාදවීමකින් තොරව අවසරය ලබා දීම සඳහා එක් දින සේවයකින් හා පැය විසිහතරේ සේවයකින් වැඩකටයුතු තවත් ඵලදායී කර තිබේ.

රැගුම් පාලක මණ්ඩලය සිය යුතුකම් හා වගකීම් ඉටු කිරීමේදී ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, ශ්‍රී ලංකාවේ ඇති තානාපති කාර්යාල, චිත්‍රපට නිෂ්පාදකයන්, ආනයනකරුවන්, නාට්‍ය අධ්‍යක්ෂකයන් හා ප්‍රසංග සංවිධායකයන් සමග කටයුතු කරමින් සිටී.

දැක්ම, මෙහෙවර, අරමුණ

ඉදිරි දැක්ම

නිදහස් හා යහපත් නිර්මාණ පරිසරයක් ගොඩනැගීම.

මෙහෙවර

චිත්‍රපට, නාට්‍ය, සංගීත හා ප්‍රාසාංගික සංදර්ශන සඳහා වර්ගීකරණ සහතික ලබාදීම සහ කලා ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා කාර්යක්ෂම සේවාවක් ලබාදීම.

අරමුණ

සමාජ වගකීම, නිර්මාණ නිදහස, ජනතා සුබසෙත ආදිය පදනම් කරගනිමින් මහජන ප්‍රදර්ශනය සඳහා සංදර්ශන හා කලා නිර්මාණ ඉදිරිපත් කිරීම දිරිමත් කිරීම.

ප්‍රධාන කාර්යයන්

- ලාංකීය සමාජයට බලපාන ප්‍රසිද්ධ රහ දැක්වීම් සම්බන්ධයෙන් දේශීය හා විදේශීය චිත්‍රපට, නාට්‍ය සහ සියළුම මහජන සංදර්ශන යන විෂය පථයන් දක්වා ඇත.
- එහිදි උක්ත විෂය පථයන් ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩල පනත යටතේ මහජන ප්‍රදර්ශනය සඳහා සුදුසු ද යන්න දැක්ම අනුව විමර්ශනය කරනු ඇත.

ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ සමාජ වගකීම

- ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය චිත්‍රපට, නාට්‍ය, සහ සංදර්ශන සඳහා මහජන ප්‍රදර්ශනයට අනුමැතිය දීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිදු කරනු ලබන අතර අවශ්‍ය සංශෝධන යෝජනා කරනු ලබයි.
- මහජන ප්‍රදර්ශනය සඳහා අනුමත කිරීමේදී හෝ වාරණයට ලක් කිරීමේදී පහත සඳහන් ප්‍රතිපත්ති කෙරෙහි ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය සැළකිලිමත් වී අනුමැතිය ලබා දෙමින් බලවත් වගකීමක් ඉටු කරයි.
  - රටේ පවතින නීතිය හෑල්ලුවට ලක් නොකළ යුතුය.
  - සියලුම ජාතීන්ගේ සහ වාර්ගිකයින්ගේ සිරිත් විරිත් සහ සම්ප්‍රදායන්ට ගරු කළ යුතුය.
  - සියලුම ජනතාවගේ ආගමික හැඟීම් වලට ගරු කළ යුතුය.
  - අපරාධ, සාවද්‍ය ක්‍රියා, දුෂ්ට ක්‍රියාවන් හෝ පාපයන් පිළිබඳව ප්‍රේක්ෂක අනුකම්පා නොඉපදිය යුතුය.
  - විවාහයේ පාරිශුද්ධත්වය පිළිගත යුතු අතර දුශ්චරිතය ඉස්මතුවන ආකාරයට ලිංගිකත්වය ඉදිරිපත් නොකළ යුතුය.

ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය ඉහත සඳහන් කරුණු ක්‍රියාත්මක කිරීමේදී මානව ප්‍රගතියට කලා ලොවේ පවත්නා වැදගත්ම කලාව රසවිඳීම සඳහා ප්‍රේක්ෂකයාට ඇති අයිතියත් සැලකිල්ලට ගනිමින් නිදහස් අදහස් ප්‍රකාශනයට ඇති අයිතිය වැරදි ආකාරයට පාවිච්චි කරන්නේද යන වග ද සිහි තබා ගනී. ඒ සඳහා සමාජ වගකීම මුල් තැනෙහි ලා සැලකිල්ලට ගනු ලැබේ. සමාජයට අහිතකර දේ බැහැර කිරීම, රඟුම් පාලක මණ්ඩලයේ ප්‍රතිපත්තියයි.

ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ වගකීම කිසියම් චිත්‍රපටයක්, නාට්‍යක් හෝ සංගීත සංදර්ශනයක්, එය මහජන ප්‍රදර්ශනයට සුදුසු විෂයයක්ද යන වග තීරණය කිරීමයි. මේ තීරණයට එළඹීමේදී ඊට නිසි වාරණ සීමා හා වගකීම් අදාළ ප්‍රේක්ෂකයන් වෙත පැනවිය හැකිය.

ඉහතින් පැනවූ නීති රෙගුලාසි මණ්ඩලයට පැවරී ඇති බලතල හා කාර්යයන් අනුව ක්‍රියාත්මක වේ.

චලන චිත්‍රය සන්නිවේදනය තුළ පවත්නා බලවත්ම මාධ්‍යයයි. ඉන් ප්‍රබල බලපෑමක් චිත්‍රපට ප්‍රේක්ෂකයන් වෙත ඇතිකළ හැකිය. එය ජනතා යහපත සඳහාද මෙහෙයවිය හැකිය.

ඉහත සඳහන් වූ ප්‍රතිපත්ති සලකා බැලීමට අමතරව අදාළ කරුණු ඉදිරිපත් කිරීම හෝ ඒවා සංශෝධනය කිරීම සඳහා පූර්ණ අයිතිය ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය සතුය.


වර්තමානයේ ජාත්‍යන්තර වශයෙන් සමාජ වගකීම් න්‍යායන් භාවිතා වේ. මෙහිදී විශේෂයෙන් අපරදිග කලාව හුදු නිදහස් කලාවක් වශයෙන් ව්‍යාප්තවීමට තිබෙන නිදහස, පෙරදිග රටවල පවතින සමාජ වගකීම යන තීරණාත්මක සාධකයෙන් තුලනය වේ.

මෙහිදී සරල වශයෙන් කියන්නේ නම් මේ කලා නිර්මාණ මහජන ප්‍රදර්ශනයන් බැවින්, සමාජයට ඉන් වන අහිතකර තත්ත්වය සලකා බලා තීරණයන් කෙරෙහි එළඹීම මණ්ඩලයේ මූලික වගකීමකි.

1912 අංක 07, 1919 අංක 07 දරණ ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩල ආඥා පනත් පසුව 1951 අංක 23, 1961 අංක 40, 1964 අංක 26, 1969 අංක 11 පනත්වලින් ප්‍රසිද්ධ රංගනයන්, සැණකෙලි සහ ඒවාට සම්බන්ධව හෝ ඒවායින් මතුවන අවස්ථා වඩාත් හොඳින් විධිමත් කිරීම සඳහා බලය ලබා දී ඇත. මෙම ආඥා පනත ‘‘ප්‍රසිද්ධ රඟුම් පාලන ආඥා පනත’’ යනුවෙන් හැඳින්විය හැකිය.

2.

ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය - සංවිධාන සැළැස්ම - 2025



3. කාර්ය මණ්ඩලය

අනු අංකය	තනතුර	ක.සේ.ව.අංක 03/2016 අනුව වැටුප් ක්‍රේතය	කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත තනතුරු සංඛ්‍යාව	තත්‍ය	පුරප්පාඩු
1.	ලේකම්	JM 1-1	01	-	01 දැනට මෙය සංවර්ධන නිලධාරී තනතුරින් ආවරණය වේ.
2.	වැඩසටහන් නිලධාරී	MN 4 2006	04	04	-
3.	තොරතුරු තාක්ෂණ සහායක	MA2-1	01	-	01
4.	කළමනාකරණ සහකාර	MA1-2	01	-	01
5.	රියදුරු	PL3	02	-	02
6.	ප්‍රක්ෂේපණ යන්ත්‍ර ක්‍රියාකරු	PL2	01	-	01
7.	කාර්යාල කාර්ය සහායක	PL1	01	01	-
එකතුව			**11**	**06**	**05**

4. මූල්‍යමය තොරතුරු

4.1 බලපත්‍ර ආදායම.

අනු අංක	වර්ෂය	ආදායම (රු.මි.)
1.	2023	8.29
2.	2024	10.00
3.	2025	10.10

4.2 ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම්.

2025		ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු.මි.)	වියදම (රු.මි.)	සමස්ත වියදම (%)
1.	පුනරාවර්තන	10.41	7.46	72%
2.	ප්‍රාග්ධන	1.0	0.74	74%
		11.41	8.20	71%

5. ආයතන ප්‍රගතිය

5.1 චිත්‍රපට නිරීක්ෂණය -2025

නිරීක්ෂණය කළ මුළු චිත්‍රපට සංඛ්‍යාව	භාෂාව						U වර්ගීකරණය අසීමිත මහජන ප්‍රදර්ශනය	A වර්ගීකරණය වැඩිහිටියන්ට වඩාත් සුදුසු	X වර්ගීකරණය වැඩිහිටියන්ට පමණයි	වාරණය කළ
	සිංහල	දෙමළ	ඉංග්‍රීසි	හින්දි	වෙනත්					
235	49	22	66	63	30	05	159	51	25	-

5.2 DVD නිරීක්ෂණය -2025

නිරීක්ෂණය කළ මුළු DVD සංඛ්‍යාව	අනුමත කළ	අනුමත නොකළ
62	62	-

5.3 වේදිකා නාට්‍ය නිරීක්ෂණය -2025

නිරීක්ෂණය කළ මුළු නාට්‍ය සංඛ්‍යාව	• (X - වර්ගීකරණය) වැඩිහිටියන්ට පමණයි = 05 • ප්‍රදර්ශනය වාරණය කළ = 03					
	සිංහල		දෙමළ		ඉංග්‍රීසි	
	කෙටි	දිර්ඝ	කෙටි	දිර්ඝ	කෙටි	දිර්ඝ
364	107	121	20	05	69	42

5.4 ප්‍රසංග නිරීක්ෂණය-2025

චිත්‍රපට හෝ නාට්‍ය නොවන ප්‍රසංග	දේශීය		විදේශීය	
	සාමාන්‍ය ප්‍රසංග	රූපවාහිනී මාධ්‍ය ප්‍රසංග	එළිමහන් ප්‍රසංග	ඇතුළත ප්‍රසංග
712	648	06	11	47

2.1.3 ජාතික උරුම අංශය

2.1.3.1 ජාතික උරුම අංශය මගින් ක්‍රියාත්මක කළ වැඩසටහන්

ජාතික උරුම අංශයහි වගකීම වනුයේ ''ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම සහ සංස්කෘතිය, සාහිත්‍ය සහ කලාව ඉහළ ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම සඳහා අදාළ නීති සහ අණ පනත්වලට අනුකූලව සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක ජාතික උරුමයන් සංරක්ෂණය විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, ජාතික ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමයි''. වැඩසටහන් හා ව්‍යාපෘති කිහිපයක් සෘජුවම ජාතික උරුම අංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ අතර 2025 වර්ෂය සඳහා වෙන් වී තිබූ ප්‍රතිපාදනය උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව උපයෝජනය කිරීම සිදු කරන ලදී.

- **ආදිවාසී/ සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාව සංරක්ෂණ සේවාවන් පැවැත්වීම**

ආදිවාසීන් සඳහා වන සංරක්ෂණ සේවා බොහෝ විට ස්වාභාවික සම්පත් සහ පෙව විවිධත්ව සංරක්ෂණය සඳහා කටයුතු කරන අතරම දේශීය දැනුම, වටිනාකම් සහ අයිතිවාසිකම්වලට ගරු කරන සහයෝගී උත්සහයන් ඇතුළත් වේ. ඒ අනුව ඔවුන්ගේ අනන්‍යතාව රැක ගැනීම සඳහා සුවිශේෂී වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.

- **දඹාන ආදිවාසී ගම්මානයේ ලෝක ආදිවාසී දින සැමරුම, හෙනානිගල වාර්ෂික හැත්ම ශාන්තිකර්මය පැවැත්වීම හා දළදා මාලිගාවේ මී පැණි පුජාව පැවැත්වීම**

ආදිවාසී ගම්මානයේ ආදිවාසී දින සැමරුම් උත්සවය ගරු ජනාධිපතිතුමාගේ සහභාගිත්වයෙන් ඉතාමත් ඉහළින් සිදු කළ අතර ඒ සඳහා වැය කරන ලද මුදල රු. 2,366,486.34 කි.






ආදිවාසී ප්‍රජාවගේ සංස්කෘතික අංගයක් වන හැත්ම ශාන්තිකර්මය දඹාන ආදිවාසී ගම්මානයේ සිදු කරන ලදි. ඒ සඳහා වැය කරන ලද මුදල රු. 269,815.00 කි.





ආදිවාසී ප්‍රජාවගේ අතීතයේ සිට පැවත එන දළදා සමිඳු වෙනුවෙන් මී පැණි පූජාව සිදු කිරීම සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් අමාත්‍යාංශයේ මුලිකත්වයෙන් සිදු කරන ලදී. ඒ සඳහා වැය කරන ලද මුදල රු. 84,500.00 කි.





- **ආදිවාසී ගම්මානයන්ගේ යටිතල පහසුකම් සංවර්ධනය**

හෙනානිගල වරිගසභා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම.

හෙනානිගල ආදිවාසී ප්‍රජාව රැස්වන වරිගසභා ගොඩනැගිල්ල අබලන් තත්ත්වයක පැවතීම හේතුවෙන් එම ගොඩනැගිල්ල සඳහා වානේ රාමුවක් ඉදිකිරීම සහ වහලය සකස් කරමින් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලදී. ඒ සඳහා වැය කරන ලද මුදල රු. 2,857,650.79 කි.





පොල්ලේබැද්ද ආදිවාසී ගම්මානයේ පවුල් සඳහා වැසිකිලි පහසුකම් ලබා දීම.



පොල්ලේබැද්ද ආදිවාසී ගම්මානයේ පාසල් යන දුදරුවන් සිටින පවුල්වල පවා වැසිකිලි පසහුකම් නොමැති වීමෙන් සෞඛ්‍ය තත්ත්වය ඉතා අවම මට්ටමක පැවතීම නිරීක්ෂණය විය. ඒ අනුව දුදරුවන් සිටින පවුල් සඳහා මූලිකත්වය ලබා දෙමින් එවැනි පවුල් 50ක් සඳහා වැසිකිලි ඉදිකිරීමේ කටයුතු සිදු කරන ලදී. ඒ සඳහා වැය කරන ලද මුදල රු. 6,418,918.97 කි.

- **ආදිවාසී ගම්මානයන්ගේ සමාජ සජීවීකරණ වැඩසටහන් සිදු කිරීම.**

හෙනානිගල අධ්‍යාත්මික හා ආකල්ප සංවර්ධනය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන.

බෞද්ධ කටයුතු සමායෝජන නිලධාරී, ඵලදායීතා සංවර්ධන නිලධාරී, මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන නිලධාරී සහ සමථ සංවර්ධන නිලධාරී සම්බන්ධ කරගනිමින් හෙනානිගල ආදිවාසී ප්‍රජාවගේ අධ්‍යාත්මික හා ආකල්ප සංවර්ධනය වැඩසටහන සිදු කරන ලදි. ඒ සඳහා වැය කරන ලද මුදල රු. 21,000.00 කි.

හෙනානිගල කාන්තාවන් උදෙසා ස්වයංරැකියා මංපෙත් විවර කිරීම සඳහා ගෘහ නිෂ්පාදන පුහුණු කිරීමේ වැඩසටහන.

ආදිවාසී කාන්තාවන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා මිශ්‍ර බයිට්, මුරුක්කු, ගඡෝරු සහ බෙල්ලෝ බයිට් නිෂ්පාදන පුහුණු වැඩසටහනක් සිදු කළ අතර එම නිෂ්පාදන අලෙවිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මැදිහත් වීමෙන් සිදු කරනු ලබයි. ඒ සඳහා වැය කරන ලද මුදල රු. 33,220.00 කි.

හෙනානිගල ආදිවාසී නර්තනය සඳහා රංගවස්ත්‍රාභරණ කට්ටලයක් නිර්මාණය කිරීමේ වැඩසටහන.

වියැකී යන ආදිවාසී සංස්කෘතික අංගයන් වන ඔවුන්ගේ නර්තන, ගායන, වාදන රැකගැනීමත් ඔවුන්ට එමගින් වෘත්තීයමය මට්ටමක් ඇති කිරීමත් අපේක්ෂා කරගනිමින් ආදිවාසී නර්තනය සඳහා රංගවස්ත්‍රාභරණ කට්ටලයක් නිර්මාණය කිරීම සිදු කරන ලදී. ඒ සඳහා වැය කරන ලද මුදල රු. 107,050.00 කි.

රතුගල ආදිවාසී ගම්මානයේ සමාජ සජීවීකරණ වැඩසටහනක් පැවැත්වීම.

ආදිවාසී ජනතාව තුළ පවතින දුර්මත බැහැර කරමින් පාසල් යා යුතු වයසේ පසුවන දරුවන් තුළ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කරමින් දැහැමි සමාජයක් ගොඩනැගීම අරමුණු කරගනිමින් උක්ත වැඩසටහන සිදු කළ අතර ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී, මානව සම්පත්

නිලධාරී, සංස්කෘතික නිලධාරී සහ ළමා හා කාන්තා කාර්යංශයේ පොලිස් නිලධාරී සම්පත් දායකත්වය ලබා දෙන ලදී. ඒ සඳහා වැය කරන ලද මුදල රු. 89,800.00 කි.




දඹාන විද්‍යාලයේ දරුවන් සඳහා ගීත රසවින්දනය හා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහන.

දඹාන විද්‍යාලයේ සිටින දරිද්‍රතාවයෙන් පෙළෙන ආදිවාසී සහ මිශ්‍ර ආදිවාසී දරුවන් 180ක් සඳහා පාසල් බෑග් ලබා දීම මගින් ඔවුන් අධ්‍යාපනය සඳහා යොමු කිරීමත් ගීත රසවින්දනය මගින් නිර්මාණශීලී, විනයගරුක, සංවේදී පුරවැසියන් සමාජගත කිරීමත් සඳහා මෙම වැඩසටහන සිදු කරන ලදී. ඒ සඳහා වැය කරන ලද මුදල රු. 502,800.00 කි.





දළුකාන පන් භාණ්ඩ නිෂ්පාදන පුහුණු වැඩසටහන.

ආදිවාසී අඩු ආදායම් ලාභී, ගෘහ මූලික කාන්තාවන් හා ආදිවාසී තරුණ තරුණියන් සම්බන්ධ කරගනිමින් ප්‍රදේශයේ වැව් අශ්‍රිතව සුලභව දැකිය හැකි පන් යොදාගනිමින් පන් ආශ්‍රිත නිර්මාණ පුහුණු කිරීම මඟින් ස්වයං රැකියා අවස්ථා ඇති කරන ලදී. ඒ සඳහා වැය කරන ලද මුදල රු. 49,400.00 කි.




පොල්ලේබැද්ද ආදිවාසී ප්‍රජාව කේන්ද්‍ර කරගත් සමාජ සජීවීකරණ වැඩසටහන.

ආදිවාසී ජනතාවගේ අනන්‍යතාවය සුරකිමින් ආකල්ප, අධ්‍යාත්මික, සමාජීය හා ආර්ථික තත්ත්වය සංවර්ධනය කිරීම සහ හුදකලා වී සිටින ආදිවාසී ජනතාව නිවැරදි ලෙස සමාජගත කිරීම අරමුණු කරගනිමින් මෙම වැඩසටහන් සිදු කරන ලදී. ඒ සඳහා වැය කරන ලද මුදල රු. 58,000.00 කි.






- **දඹාන ජන උරුම කෞතුකාගාරය නවීකරණය සහ ප්‍රතිසංවිධානය කිරීම.**

ස්විස්ටලන්තයේ බැසල්ස් කෞතුකාගාරයේ සිට මෙරටට ගෙන එන ලද ආදිවාසී අස්ථි සහ පුරාවස්තු දඹාන ජන උරුම කෞතුකාගාරයේ තැන්පත් කර නවීකරණය සහ ප්‍රතිසංවිධාන කටයුතු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය කේ. එම්. ඇලෙක්සැන්ඩර් මහතා ප්‍රමුඛ විද්වත් කමිටුවේ උපදෙස් මත සිදු කළ අතර 2025.08.09 ආදිවාසී දින අවස්ථාවේදී ගරු ජනාධිපතිතුමා විසින් ජනතා ප්‍රදර්ශනය සඳහා විවෘත කරන ලදී. කැනේඩියානු අරමුදලෙන් ලද ආධාර මගින් සහ සොලිඩැරිඩැඩ් (Solidaridad) ආයතනය මැදිහත් වීමෙන් කෞතුකාගාරයේ යම් යම් නවීකරණ කටයුතු සිදු කළ අතර අමාත්‍යාංශය මගින් රු. 8,330,824.10ක් වැය කර පහත කාර්යයන් සිදු කරන ලදී.

- ජන උරුම කෞතුකාගාරයේ දොරවල් සවි කිරීම - රු. 1,696,667.68
- ජන උරුම කෞතුකාගාරයේ මැද මිදුල සකස් කිරීම - රු. 346,045.98
- ජන උරුම කෞතුකාගාරයේ පිවිසුම් ස්ථානය, ඉඩම් සකස් කිරීම - රු. 1,582,775.70
- වහලය ප්‍රතිසංස්කරණය සහ කොරිඩෝව සකස් කිරීම - රු. 1,263,990.25
- ජන උරුම කෞතුකාගාරයේ බිමට කාපට් යෙදීම - රු. 288,071.62
- පුවරු සඳහා අන්තර්ගත තොරතුරු ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවට පරිවර්තනය - රු. 11,810.00
- කෞතුකාගාරයේ මානව රූප අලුත්වැඩියා කිරීම, නාම පුවරු සකස් කිරීම - රු. 2,364,874.87
- කෞතුකාගාරයේ නවීකරණ කටයුතු සඳහා අවශ්‍ය ප්‍රවාහන, ආහාර සඳහා වෙනත් කටයුතු සඳහා - රු. 776,588.00








- **දඹාන ජන උරුම මධ්‍යස්ථානයේ සේවය කරන කාර්යය මණ්ඩලයට වැටුප් ගෙවීම.**

දඹාන ජන උරුම කෞතුකාගාරයේ ආදිවාසී ජනතාවගේ අස්ථි, සත්ව ඇටසැකිලි, පැරණි ආදිවාසි උපකරණ අන්තර්ගත සුවිශේෂී කෞතුකාගාරයක් වන අතර, එහි නඩත්තු කටයුතු පවත්වා ගැනීම සඳහා අමාත්‍යාංශය මගින් වැටුප් ගෙවීමක් සිදු කරනු ලබයි. ඒ සඳහා වැය කරන ලද මුදල රු. 1,500,000.00 කි.

- **ජාතික උරුම හා සංස්කෘතික දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව පැවැත්වීම**

“දැයේ උරුමය දරුවන්ටයි” ව්‍යාපෘතිය

2025 වර්ෂයේ දැයේ උරුමය දරුවන්ටයි ව්‍යාපෘතිය සඳහා රු.මි. 3.5 ක ප්‍රතිපාදන වෙන් වී තිබුණි. ඒ යටතේ ජාතික උරුමය හා සංස්කෘතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 6 ක් දිස්ත්‍රික්ක 6ක පුරාවිද්‍යා ස්ථාන කේන්ද්‍ර කරගනිමින් සිදු කරන ලදී. ඒ අනුව, එක් එක් වැඩසටහන් සඳහා එක් එක් පුරාවිද්‍යා ස්ථානයන් ආසන්නයේ ඇති පාසල්හි උසස්පෙළ හා සාමාන්‍ය පෙළ හදාරනු ලබන සිසු සිසුවියන් 540 දෙනෙකු සහභාගී කරගනිමින් සිදු කරන ලදී. එම සමස්ත ව්‍යාපෘතිය සඳහා වියදම රු. 1,645,734.25 කි.

- **පළමු වැඩසටහන - අනුරාධපුර දිස්ත්‍රික්කයේ වෙස්සගිරිය පුරාවිද්‍යා ස්ථානය**





- **දෙවන වැඩසටහන - ගාල්ල දිස්ත්‍රික්කයේ ගාලු කොටුව පුරාවිද්‍යා ස්ථානය**





- **තෙවන වැඩසටහන - රත්නපුර දිස්ත්‍රික්කයේ මඩුවන්වල වලව්ව පුරාවිද්‍යා ස්ථානය**





- සිව්වන වැඩසටහන - මොණරාගල දිස්ත්‍රික්කයේ යුධගනාව පුරාවිද්‍යා ස්ථානය





- පස්වන වැඩසටහන - අම්පාර දිස්ත්‍රික්කයේ රජගල පුරාවිද්‍යා ස්ථානය





- සයවන වැඩසටහන - කුරුණෑගල දිස්ත්‍රික්කයේ බිංගිරිය ටැම්පිට විහාර පුරාවිද්‍යා ස්ථානය





ජාතික උරුම ආරක්ෂා කිරීමට ප්‍රතිපත්තියක් සකස් කිරීම.

(“Developing a National Heritage Policy for Sri Lanka” – *UNESCO Participation Programme)*

යුනෙස්කෝ සහභාගීත්ව වැඩසටහන යටතේ ජාතික උරුමයන් පිළිබඳ ශක්තිමත් ඒකාබද්ධ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාවේ සම්බන්ධීකරණයෙන් ඇ.ඩො. 20,000 ක (රු. ලක්ෂ 6,068,953.97) UNESCO මූල්‍ය ප්‍රදානයක් යටතේ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධාන අංශයේ අදාළ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් ජාතික උරුම ප්‍රතිපත්ති කෙටුම්පතක් සකස් කිරීමේ වැඩමුළුවක් 2025 සැප්තැම්බර් මස 24, 25 සහ 26 තෙදින වාද්දුව Laya Beach හෝටල් පරිශ්‍රයේ දී පවත්වන ලදී. ඒ සඳහා රු. 2,785,501.00ක මුදලක් වැය වී ඇත. කෙටුම්පත් කරන ලද ජාතික උරුම ප්‍රතිපත්තිය සඳහා මහජන අදහස් ලබා ගැනීමට නියමිතව ඇත.






ජාතික උරුම හඳුනා ගැනීම, සංරක්ෂණය හා ජාතික උරුම කළමනාකරණය කිරීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම.

ජාතික උරුම තීරණය කිරීමට හා හඳුනා ගැනීමට අදාළව 2024.12.31 වන දිනට දිස්ත්‍රික් මට්ටමින් නාම යෝජනා 24ක් ලැබී ඇත. එම නාමයෝජනා අතරින් ජාතික උරුම තීරණය කිරීම හා හඳුනා ගැනීම සඳහා අනු කමිටු සමාජිකයන් විසින් සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණය ජාතික නාමල් උයන හා කහටගහ මිනිරන් පතල ආශ්‍රිතව 2025.11.29 දින සිදු කරන ලදී. මෙම ක්ෂේත්‍ර පර්යේෂණය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සම්මානිත මහාචාර්ය ජිනදාස කටුපොත මහතා සහ මධ්‍යම සංස්කෘතික අරමුදලේ සංරක්ෂණ නිලධාරී කේ. උපුල් නිශාන්ත මහතා විසින් සිදු කරන ලදී.





නායකත්ව පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.


ජාතික උරුම අංශයේ මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් කාර්ය මණ්ඩලයේ හැකියාවන් වර්ධනය කිරීම, ධාරිතා ප්‍රවර්ධනය කිරීම, නායකත්ව ගුණාංග වැඩිදියුණු කිරීම, අභියෝග කළමනාකරණය කර ගැනීම, කණ්ඩායම් හැඟීම් ප්‍රවර්ධනය කිරීම සහ රසවින්දනයෙන් මානසික සුවය වර්ධනය යන කරුණු මුලික කරගෙන ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් දෙදින පුහුණු වැඩමුළුවක් බාහිර කථිකාචාර්ය උදය කුමාර මහතා සහ මානව සම්පත් නිලධාරි හා වෘත්තිය මාර්ගෝපදේශක එල්.පී.පේමසිරි මහතාගේ සම්පත් දායකත්වයෙන් රන්මිහිතැන්න පරිශ්‍රයේ දී පැවැත්විණි.






❖ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

සංරක්ෂණ හා නඩත්තු









බිංගිරිය ටැම්පිට විහාරය සංරක්ෂණය

අනුරාධපුර රන්මසු උයන පැරණි ඇළ මාර්ගය තහවුරු කිරීම





අනුරාධපුර දකුණු දාගැබ තහවුරු කිරීම



අනුරාධපුර නව සංචාරක බංගලාවේ බිම්ගල් ඇල්ලීම



මාතලේ මීවලපතහා දාගැබ වටබැම්ම සංරක්ෂණය කිරීම





බදුල්ල ලුණුගල මාපාඇල්ල පත්තිනි දේවාලය නඩත්තු කිරීම.



මාතලේ පමුනුව වාලවෙල පුරාණ ටැම්පිට විහාරය සංරක්ෂණය



අම්පාර දීඝවාපිය නිල නිවාසයේ ඉතිරි වැඩ අවසන් කිරීම.





ලෝක උරුම ගාලු කොටුව තුළ ඇති සමුද්‍ර අට්ටාලය පහල කොටසේ තිබෙන පැරණි අශ්ව ස්ථාලය සංරක්ෂණය කිරීමෙන් පසුව එහි පුස්තකාලයක් හා පුරාවිද්‍යා ප්‍රකාශන අලෙවිසැලක් ලෙස සකස් කර ඇත.





අම්පාර මගුල් මහා විහාරය විද්‍යාත්මක නඩත්තු කිරීම.

අම්බලංගොඩ ඕලන්ද ස්ථාල ගොඩනැගිල්ල නඩත්තු කිරීම.









අම්පාර ඔවාගිරිය විද්‍යාත්මක නඩත්තු කිරීම.

පුරාවිද්‍යාත්මක කාර්යයන් අධීක්ෂණය







දීඝවාපිය ස්තූප සංරක්ෂණය

නීලගිරිය ස්තූප සංරක්ෂණය

ගවේෂණ ලේඛනගත කිරීම්, කැණීම හා පර්යේෂණ

ස්ථාන පරීක්ෂාව හා ක්ෂේත්‍ර කටයුතු







දිවුලපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විස්තීර්ණ ගවේෂණය - බදුල්ල

අනුරාධපුර තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක වාර්තාගත කිරීම

බලපිටිය වලව්ව ගවේෂණය

කැණීම් ව්‍යාපෘති



කුෂ්ඨරාජගල පර්යේෂණ කැණීම - මාතර





ශ්‍රාවස්තිපුර කැණීම





අනුරාධපුර ඇතුළු නගරය කැණීම

අභිලේඛන හා නාණක විද්‍යා





ශිලාලේඛන පිටපත් කිරීම - අම්පාර නීලගිරිය



ශිලාලේඛන පිටපත් කිරීම - අම්පාර ශාස්ත්‍රවෙල

උරුම ප්‍රවර්ධන වැඩසටහන් හා මහජන ප්‍රදර්ශන

කෞතුකාගාර අංශය

කෞතුකාගාර ප්‍රදර්ශන ප්‍රවර්ධන, කළමනාකරණ හා කෞතුකාගාර පවත්වා ගෙන යාම

කැණීම්, ගවේෂණ, අධිකරණ නියෝග හා වෙනත් ක්‍රමවේද මගින් අත්පත් කර ගන්නා ලද කෞතුක භාණ්ඩ එකතූන් ආරක්ෂා කරමින් මහජනතාව වෙත දැනුම අවබෝධය සහ විනෝදය ලබා දීම අරමුණු කර ගෙන දිවයින පුරා කෞතුකාගාර හා තොරතුරු මධ්‍යස්ථාන 28 ක් ප්‍රශස්ථ මට්ටමින් පවත්වා ගෙන යනු ලබයි. ඒ අනුව කෞතුකාගාර ප්‍රදර්ශන ප්‍රවර්ධන හා කළමනාකරණ කටයුතු ව්‍යාපෘතීන් තුළින් කෞතුකාගාර ප්‍රදර්ශන මැදිරි හා පරිශ්‍රය දෛනිකව පිරිසිදු කිරීම, කෞතුක භාණ්ඩ එකතුව පිරිසංරක්ෂණය කිරීම, සුළු නඩත්තු කටයුතු සහ අඩුපාඩු සැකසීම ආදි කාර්යයන් සිදු කරනු ලබයි. ප්‍රශස්ත කෞතුකාගාර ප්‍රදර්ශනයක් මහජනතාව වෙත ලබා දීමත් අපගේ අතීත උරුමය ආරක්ෂා කිරීමත් මෙහි අරමුණ වේ.



කෝට්ටේ කෞතුකාගාරයේ ප්‍රදර්ශන විධිමත් කිරීමේ අරමුණින් ප්‍රදර්ශන පුවරු LED පුවරු ලෙස අලුතින් නිර්මාණය කිරීම

නීලගිරි ධාතූන් වහන්සේලා සහ පුරාවස්තු ප්‍රදර්ශන

අම්පාර, ලාහුගල නීලගිරිය ස්තූප කැණීමෙන් අනාවරණය කරගන්නා ලද ධාතූන් වහන්සේලා සහ පුරාවස්තු එකතුව මහජනතාව වෙත ප්‍රදර්ශනය කිරීමේ කාර්යය කෞතුකාගාර අංශය විසින් සිදු කරන ලද අතර 2025 මාර්තු 03 වන දින එම ධාතූන් වහන්සේලා සහ පුරාවස්තු නැවත ධාතු ගර්භයේ තැම්පත් කිරීමේ කටයුතු සිදු කරන ලදී.



රාජ්‍ය වෙසක් උත්සවය

2025 වර්ෂයේ රාජ්‍ය වෙසක් උත්සවය නුවරඑළිය කේන්ද්‍ර කර ගනිමින් ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේදී පැවැත් වූ අතර ඒ සඳහා පුරාවස්තු ප්‍රදර්ශනයක් කෞතුකාගාර අංශය මගින් සංවිධානය කරන ලදී.





පුරාවිද්‍යා සතියට සමගාමීව පුරාවස්තු ප්‍රදර්ශනයක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේදී පැවැත්වීම

133 වැනි ජාතික පුරාවිද්‍යා සමුළුව 2025.07.07 දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයේදී පැවැත්විණි. එදින පුරාවිද්‍යා දිනයට සමගාමීව පුරාවස්තු හා අනුරූ ප්‍රදර්ශනයක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපීඨ පරිශ්‍රයේදී පැවැත්විණි.






දෙපාර්තමේන්තුව භාරයේ ඇති දුටුගැමුණු භෂ්මාවශේෂ අකුරැස්ස අම්බලංගොඩ ගංගාරාම විහාරස්ථානයේදී මහජනතාව වෙනුවෙන් ප්‍රදර්ශනය කරන ලදී. කෞතුකාගාරවල ඇති කෞතුක භාණ්ඩ එකතූන්වල තොරතුරු ස්ථීර ලේඛනයකට ඇතුළත් කිරීම සඳහා මධ්‍යම අත්පත් කර ගැනීමේ ලේඛනය සකස් කර ඇත. මෙහි ආරම්භක පියවර ලෙස කෝට්ටේ කෞතුකාගාරයේ කෞතුක භාණ්ඩවල තොරතුරු එම ලේඛනයට ඇතුලත් කිරීම සිදු කරන ලදී. මහනුවර කෞතුකාගාර මුල් කර ගෙන සමාරම්භක උත්සවය ද දේශන හා ක්‍රියාකාරකම් සහිතව ප්‍රායෝගික පුහුණුව පොළොන්නරුවේ තාක්ෂණික කෞතුකාගාරය මූලික කරගෙන ද සිදු කරන ලදී.

ප්‍රවර්ධන අංශය

පුරාවිද්‍යා සමුළුව පැවැත්වීම

ඉකුත් වසරේ පුරාවිද්‍යා කටයුතුවල ප්‍රතිඵල පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රවීණ හා ආධුනික විද්‍යාර්ථීන් හා පුරාවිද්‍යාඥයින් අතර දැනුම හුවමාරු කර ගැනීමේ අරමුණින් හා ඉදිරි පුරාවිද්‍යාත්මක පර්යේෂණ හා ක්ෂේත්‍ර කටයුතු සඳහා පුරාවිද්‍යා පර්යේෂකයින්ට ඉඩ ප්‍රස්ථාව විවර කර දෙමින් සෑම වසරකම පුරාවිද්‍යා දිනයට සමගාමීව ජාතික පුරාවිද්‍යා සමුළුව පවත්වනු ලබන අතර, 2025 වර්ෂයේ ජූලි මස 07 දින පුරාවිද්‍යා සමුළුව ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේදී පැවැත්විණි. පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම, අන්තර්ජාල ප්‍රකාශන එළිදැක්වීම හා ත්‍යාග ප්‍රදානයන් ද එදින සිදුවිය.



පුරාවිද්‍යා දිනයට සමගාමීව පුරාවිද්‍යා සතිය ලෙස නම් කර සෑම දිස්ත්‍රික්කයකම තෝරාගත් පුරාවිද්‍යා ස්ථාන තුළ විශේෂ උරුම ප්‍රවර්ධන වැඩසටහන් වාර්ෂිකව පවත්වනු ලබයි. තම ගම් ප්‍රදේශය තුළ පුරාවිද්‍යා ස්ථාන, ජීවමාන ස්මාරක සුරකීම පිළිබඳ අවබෝධයක් / දැනුම ලබා දීම මෙහි පරමාර්ථය වන අතර ශ්‍රමදාන මගින් නඩත්තු හා සංරක්ෂණ කටයුතු සඳහා මහජනයා සහභාගි කරවා ගැනීම මෙහිදී සිදු කරනු ලබයි.



ගාල්ල / මාතර දිස්ත්‍රික්කයන්හි පාසැල්, මහජනතාව, රාජ්‍ය හා පෞද්ගලික ආයතන අරභයා පුරාවස්තු විනාශය වැලැක්වීම පිළිබඳ දේශන පැවැත් වීම.

ප්‍රකාශන මුද්‍රණ

ප්‍රවර්ධන අංශයේ ප්‍රකාශන යටතේ ග්‍රන්ථ, අත් පත්‍රිකා හා සඟරාවක් ඇතුළුව ප්‍රකාශන 25ක කාර්යයන් සිදු කර ඇත.



මාධ්‍ය අංශය

පුරාවිද්‍යා ස්ථාන අලලා සැකසෙන කෙටි වීඩියෝ පට මාලාව

2025 වර්ෂයට අදාළව පුරාවිද්‍යා ස්ථාන කිහිපයක රූගත කිරීම් සිදු කළ අතර ඉන් කිහිපයක වැඩ නිමවා සමාජ මාධ්‍ය ජාලා වෙත මුදා හැර ඇත.

(1) බදුල්ල දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි එම රූගත කිරීම් ඉටුකරන ලද ස්ථාන

- බදුල්ල සොරගුණේ දේවාලය
- හල්දුම්මුල්ල බලකොටුව
- හපුතලේ සර් ඇන්ඩෘ දේවස්ථානය
- බණ්ඩාරවෙල පල්ලිය කන්ද ප්‍රාග් ඓතිහාසික භූමිය
- කැප්පෙටිපොළ බලකොටුව
- හල්පේ පත්තිනි දේවාලය
- දෝව රජමහා විහාරය
- බණ්ඩාරවෙල ආරුක්කු නමය පාලම (Nine arch)
- බෝගොඩ පාලම
- බදුල්ල වෙළේකඩේ පුරාවිද්‍යා ස්ථානය
- ඓතිහාසික බුදුගේ කන්ද
- මහියංගණ නාගදීප රජමහා විහාරය
- රාවණා ඇල්ල ප්‍රාග් ඓතිහාසික ලෙන
- බදුල්ල ශුද්ධ වූ මාකස් දේවස්ථානය

(2) 2025 වර්ෂයේ කෙටි වීඩියෝපට නිර්මාණය කොට සමාජ මාධ්‍ය ජාලා සඳහා මුදාහැර ඇති කෙටි වීඩියෝපට කිහිපයක්,

- මොණරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඌරාසිටා වැව පැරණි සොරව්ව
- වැල්ලවාය ඓතිහාසික බුදුරුවගල පුරාවිද්‍යා ස්ථානය
- වැල්ලවාය රක්ඛිතාකන්ද පුරාවිද්‍යා ස්ථානය
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වට්ටවාන් ලෙන් සංකීර්ණය (News)
- අනුරාධපුර බටහිරාරාමයේ පිහිටි කැසිකිළි ගල
- අනුරාධපුර ශ්‍රාවස්තිපුර දෙමටගල පැරණි දාගැබේ පුරාවිද්‍යා කැණීම
- අම්පාර ඓතිහාසික ගොනාගොල්ල රාජමහා විහාරය (පුංචි සීගිරිය)
- අම්පාර දිස්ත්‍රික්කයේ මානික්කමඩු පුරාවිද්‍යා ස්ථානයේ පුරාවිද්‍යා කැණීම් කටයුතු
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාටෙලෝ කුළුණ සහ තවත් ස්ථාන කිහිපයක් අලලා සැකසුනු කෙටි විඩියෝ පට
- දිඹුලාගල සෙල් ලිපිය පිළිබඳ කරුණු පැහැදිළි කෙරෙන කෙටි වීඩියෝ පට මාලාවේ දිග හැරුම (I කොටස හා II කොටස)
- මොණරාගල දිස්ත්‍රික්කයේ ඓතිහාසික ගලබැද්ද බිසෝ පොකුණ
- මොණරාගල දිස්ත්‍රික්කයේ ඓතිහාසික මයුරගිරි විහාරය
- අම්පාර ඓතිහාසික නීලගිරි දාගැබේ ධාතු නිධන් උත්සවය



දෝව රජමහා විහාරය



බණ්ඩාරවෙල ආරුක්කු නමය පාලම (Nine arch)



රාවණාඇල්ල ප්‍රාග් ඓතිහාසික ලෙන



හපුතලේ සර් ඇන්ඩෲ දේවස්ථානය



බදුල්ල ශුද්ධ වූ මාකස් දේවස්ථානය

(3) 2025 වසරේ "දායාද" පුරාවිද්‍යා පුවත් අටුවාව මුද්‍රණය කිරීම සිදු කර ඇත.

❖ ටවර් හෝල් රඟහල පදනම

- **ටවර් නාට්‍ය උළෙල 2025**

පෙබරවාරි මස 11 දින සිට පෙබරවාරි මස 20 දින දක්වා පුරා දින 10 ක් මරදාන ටවර් රඟහල හා එල්ෆින්ස්ටන් රංගශාලාවන් කේන්ද්‍ර කරගනිමින් පවත්වන ලදී. මේ සඳහා දිගු නාට්‍ය - 14, කෙටි නාට්‍ය - 12, ළමා නාට්‍ය - 8 ඇතුළු නාට්‍ය 34 ක් වේදිකා ගත කරන ලදී.



- **ටවර් කලාකරු ඇගයීම සහ තිළිණ හා සම්මාන ප්‍රදානය**

ජීවිතයේ එක්වරක් පමණක් පිදෙන ටවර් කලාකරු ඇගයීම සහ තිළිණ හා සම්මාන ප්‍රදානය ටවර් හෝල් රඟහල පදනමේ සභාපති ගරු අග්‍රාමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් 2025 පෙබරවාරි මස ටවර් නාට්‍ය උළෙලට සමගාමීව පවත්වන ලදී.

මේ සඳහා සුවිශේෂී කලාකරුවන් 20 දෙනෙක් ඇගයීමට පාත්‍රවූ අතර, ඔවුන් සඳහා රු. 30,000/- ක මුදල් තිළිණයක් හා සම්මානයක් ලබාදීම මගින් 2025.02.11 දින සිට 2025.02.20 දින දක්වා ටවර් නාට්‍ය උළෙලට සමගාමීව එක් දිනකට කලාකරුවන් දෙදෙනෙකු බැගින් ඇගයීමට පාත්‍ර විය. එහිදී නාට්‍ය උළෙල ආරම්භක දින ගරු අග්‍රාමාත්‍යතුමිය අතින් ප්‍රවීණ කලාකරු විජේරත්න වරකාගොඩ මහතා වෙත සම්මාන ප්‍රදානය සිදු කරනු ලැබූ අතර, අනිකුත් දිනයන්හි තිළිණ හා සම්මාන ප්‍රදානය කිරීම බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු ගරු නියෝජ්‍ය අමාත්‍ය ගමගෙදර දිසානායක මහතා, ගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමා, සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් ඇතුළු ප්‍රවීණ කලාකරුවන් අතින් සිදු කරන ලදී.







- **ලෝක නාට්‍ය දිනය සැමරුම් උත්සවය**

ලෝක නාට්‍ය දිනය මාර්තු මස 27 දින බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාගේ ප්‍රදානත්වයෙන් එල්ෆින්ස්ටන් රඟහලේදී පවත්වන ලදී. මේ සඳහා ප්‍රවීණ නාට්‍යවේදීන්, කලාශිල්පීන්, විශ්ව විද්‍යාල ආචාර්යවරුන් හා පාසල් ගුරුවරුන්, පාසල් සිසු සිසුවියන් ඇතුළු 600 කට වැඩි පිරිසකගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

යාපනය හා කොළඹ පිහිටි දෙමළ හා සිංහල මාධ්‍ය නාට්‍ය හා රංගකලා පාසල් සිසුන් විසින් "Do or Die" නාට්‍ය ඇතුළු තවත් නර්ථන අංගයන් ඉදිරිපත් කරන ලදී.

- **සූර්ය මංගල්‍ය 2025 අලුත් අවුරුදු තිලිණ ප්‍රදානය හා කලාකරු අවුරුදු උත්සවය 2025**

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ටවර් හෝල් රඟහල පදනම විසින් ප්‍රථම වතාවට සංවිධානය කළ "ටවර් කලාකරු බක්මහ උළෙල" 2025 අප්‍රේල් 08 දවස පුරා මරදාන එල්ෆින්ස්ටන් රඟහල පරිශ්‍රයේ දී පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි මහතා, නියෝජ්‍ය අමාත්‍ය ගමගෙදර දිසානායක මහතා, අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්. පී. සේනාධීර මහතා, ජාතික උරුම අංශයේ අතිරේක ලේකම් (පාලන) එස්.ජී. පල්ලියගුරුගේ මහත්මිය, ටවර් කලාශිල්පීන්, අනුග්‍රාහකභවතුන්, ටවර් නාට්‍ය හා රංගකලා පාසලේ විද්‍යාර්ථීන්, ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක මහතා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය සමගින් විශාල පිරිසක් මේ සඳහා එක් විය.





- **ටවර් ප්‍රභාෂ්වර ප්‍රසංගය පැවැත්වීම**

1. පළමු ප්‍රසංගය මාතලේ දිස්ත්‍රික්කයේ පල්ලේගම මධ්‍ය මහා විද්‍යාලයේදී 2025 අප්‍රේල් මස 30 දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මොරගහකන්ද කලාපයේ අනුග්‍රහයෙන් පවත්වන ලදී.
2. දෙවන ප්‍රසංගය නුවරඑළිය නගර ශාලාවේදී පවත්වන ලදී.
3. තුන්වන ප්‍රසංගය වයඹ පළාත් සභා ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.
4. හතරවන ප්‍රසංගය, හලවත ආනන්ද විද්‍යාලීය ප්‍රධාන ශාලාවේදී පවත්වන ලදී.
5. උඟව පළාත් සභාව, බදුල්ල මහ නගර සභාව හා මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.









- **ටවර් රංග යාත්‍රා ප්‍රසංග පැවැත්වීම**

2025 වර්ෂයේ පළමු ප්‍රසංගය වශයෙන් කෑගලු බාලිකා විද්‍යාලයේදී නූර්ති, නාඩගම්, ටීටර්, ග්‍රැමෆෝන් ගීත හා ජවනිකා ඇතුලත් අධ්‍යාපනික ප්‍රසංගයක් 2025.05.29 දින පවත්වන ලදී.

- **බොදු බැති ගී ප්‍රසංගය පැවැත්වීම**

වෙසක් උත්සවය වෙනුවෙන් බුද්ධාභිවන්දනා වෙසක් කලාපය සඳහා කොළඹ මහ නගර සභා පරිශ්‍රයේදී ප්‍රසංගයක් පවත්වන ලදී.

බුද්ධ රශ්මි වෙසක් කලාපය වෙනුවෙන් ගංගාරාමය බේරේ වැවේ සකස් කළ වේදිකාවක් මත බොදු බැති ගී ප්‍රසංගයක් පවත්වන ලදී.

පොසොන් උත්සවය වෙනුවෙන් රයිගම්පුර පොසොන් කලාපය සඳහා බොදු බැති ගී ප්‍රසංගයක් පවත්වන ලදී.





- **සමස්ත ලංකා පාසල් නාට්‍ය තරඟාවලියට අදාළ අවසාන වටයේ තරඟ විනිශ්චය**

සමස්ත ලංකා පාසල් නාට්‍ය තරඟාවලියට අදාළ දැනුවත් කිරීම පිළිබඳ වැඩමුළුවක් නාට්‍ය හා රංගකලා සිංහල හා දෙමළ මාධ්‍ය ගුරුවරුන් සඳහා 2025.02.24 හා 25 දෙදින සවිසිරිපාය ශ්‍රවනාගාරයේදී පැවැත්වුණි.

ටවර් හෝල් රඟහල පදනම, අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව 30 වැනි වරටත් සංවිධානය කළ සමස්ත ලංකා පාසල් නාට්‍ය තරඟාවලිය 2024/25 හි අවසාන වටය හෙවත් ජාතික මට්ටමේ තරඟ 2025 අගෝස්තු 19 දිනෙන් ආරම්භවී 27 දින දක්වා මරදාන ටවර් රඟහලේදී පැවැත්විණි. පළාත් වටයෙන් උපරිම ලකුණු ලබාගත් සිංහල මාධ්‍ය පාසල් 30 ක් හා දෙමළ මාධ්‍ය පාසල් 23 ක් අවසාන වටය හෙවත් ජාතික තරඟාවලිය සඳහා සුදුසුකම් ලබා තිබුණි.







- **අසාධ්‍ය තත්ත්වයේ සිටින කලාකරුවන් සඳහා සහන සැලසීම**



අසාධ්‍ය තත්ත්වයේ සිටි ප්‍රවීණ කලාශිල්පීන් දෙදෙනෙක් සඳහා ආර්ථික සහන සැලසීම

- **නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා පාඨමාලාව පවත්වාගෙන යාම (සිංහල හා දෙමළ මාධ්‍ය)**





ප්‍රාසාංගික නාට්‍ය කලාකරුවකු වන ඩෙන්මාර්ක් හී පදිංචි ආධවන් මහතා විසින් නාට්‍ය පුහුණු වැඩමුළුවක් පවත්වන අවස්ථාවක්

- **නාට්‍ය හා රංගකලා පාසලේ නවක සිසුන් බඳවා ගැනීම (සිංහල මාධ්‍ය) අධ්‍යයන වර්ෂ 2026/2027**

නාට්‍ය හා රංගකලා දෙවර්ෂ පූර්ණ ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍ය) සඳහා නවක සිසුන් බඳවා ගැනීම 2025.11.25 දින සවිසිරිපාය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

- **වාද බයිලා ප්‍රසංගය පැවැත්වීම මීගමුව රුක්මණිදේවි රඟහල**

අභාවයට පත්වෙමින් යන වාද බයිලා කලාව යාවත්කාලීන කිරීමේ අරමුණින් වාදබයිලා ප්‍රසංගයක් මීගමුව රුක්මණිදේවි රංගශාලාවේදී 2025.11.15 දින පවත්වන ලදී.







- **කලාකරු වන්දනා චාරිකාව (අනුරාධපුර පූජා නගරය)**

ටවර් හෝල් රඟහල පදනම සමග කටයුතු කරනු ලබන කලාශිල්පීන් සඳහා අනුරාධපුර අටමස්ථානය වැඳපුදා ගැනීමේ වන්දනා චාරිකාවක් සංවිධානය කිරීම.





❖ ගාලු උරුමය පදනම

ගාලු කොටුවට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන් සඳහා ප්‍රශස්ථ මට්ටමේ වැසිකිළි පද්ධතියක් ඉදි කිරීම.

2025 වර්ෂයේ ගාලු උරුමය පදනමේ ක්‍රියාකාරී සැලැස්මට අන්තර්ගතව ඇති මෙම ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලැබී ඇත්තේ 2025 මැයි මාසයේ දී ය. ඒ අනුව රුපියල් මිලි. 40ක ප්‍රතිපාදන ප්‍රමාණයක් භාණ්ඩාගාරය විසින් වෙන් කරන ලදී. 2025 වර්ෂයේ ලැබුණේ මින් රුපියල් මිලියන 25ක් පමණි.

ශ්‍රී ලංකා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ උපදේශකත්වය යටතේ සකස් කරන ලද ප්‍රසම්පාදන ලියවිලිවලට අදාළව අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් ප්‍රසම්පාදන කටයුතු සිදු කොට කොන්ත්‍රාත් ප්‍රදානය 2025.10.29 දින සිදු විය.

2025 නොවැම්බර් මස 06 දින කොන්ත්‍රාත්කරු වැඩ ආරම්භ කළ අතර 2025.12.31 දින වන විට සම්පූර්ණ කර ගැනීමට හැකි වුයේ භෞතික ප්‍රගතියෙන් 44%ක ප්‍රමාණයකි. එය ප්‍රතිපාදනවලින් 34% කි. ප්‍රමාද වී වැඩ ආරම්භ වීම, කම්කරු හිඟය සහ කාළගුණික හේතු නිසා නියමිත දිනට මෙහි වැඩ අවසන් කිරීමට නොහැකි විය.




❖ අපේ ගම

මෙම පරිශ්‍රය ආදායම් උපයන ප්‍රධාන ආකාරය වන්නේ පරිශ්‍රය තුළ පවතින විවිධ ස්ථාන විවිධ වූ පාරිභෝගික අවශ්‍යතා සඳහා කුලී පදනම මත ලබා දීමයි. ඒ අනුව පුරාණ ගම පෙදෙස එහි සංකල්පයට හානි නොවන අවුරුදු වැඩසටහන් හා සංචාරක ආකර්ෂණය ලැබෙන වැඩසටහන් සඳහා ද, A, B, C ශාලා කොටස සංගීත, නැටුම්, චිත්‍ර, යෝග ආදී පංති පැවැත්වීම සඳහා ද, රංග ශාලාව නාට්‍ය, වැඩමුළු, වේදිකා නාට්‍ය, පොත් එළිදැක්වීම් ආදී කටයුතු සඳහා ද මහවලව්ව ශාලාව විවාහ උත්සව, සුභද හමු, සංගීත වැඩසටහන් ආදිය සඳහා ද ලබාදීම සිදු කරන ලදී.



ඊට අමතරව ශිල්ප ගම්මාන කොටසේ පවතින වෙළඳ කුටි අතරින් 16ක ශිල්පීන් 2024 වසරේ දී තම වෙළඳ හා නිෂ්පාදන කටයුතු සිදුකළ අතර, 2025 වර්ෂයේ ප්‍රසිද්ධ දැන්වීම් පලකර සුදුසුකම් පරීක්ෂාව හරහා නව ශිල්පීන් 05 දෙනෙකු සඳහා එම අවස්ථාව ලබාදී ඇත. වෙළඳ කුටිවල වහල අලුත්වැඩියාව සිදු කිරීමට නොහැකිවීම හේතුවෙන් සියලු වෙළඳ කුටි ලබාදීමට නොහැකි වී ඇත.



පුරාණ ගම කොටසේ පවතින ගැමි ගෙවල් 11 හි පැවති සුළු සුළු අඩුපාඩු සම්පූර්ණ කර, අර්ධ වශයෙන් විනාශව පැවති පුද්ගල අනුරූ හා සත්ව රූප 27ක් ජාතික අනුරූ පාසල හරහා ප්‍රතිසංස්කරණය කර ගැළපෙන ස්ථානවල ප්‍රදර්ශනයට තබා නරඹන්නන්ට සජීවී ගම්මානයක ස්වරූපය විඳින්නය කිරීමට අවස්ථාව නැවත ලබා දීමට කටයුතු කර ඇත.

අමාත්‍යාංශය මෙම පරිශ්‍රයේ පරිපාලන කටයුතු භෞතික වශයෙන් 2021.04.01 දින සිට භාරගෙන ඇති අතර, එදින සිට වාර්තා වූ වැඩිම ආදායම 2025 වර්ෂයේ වාර්තා කර ඇති අතර එහි අගය රු.මි. 21.66 කි. එය ඉලක්කගත ආදායම් දර්ශකය ඉක්මවා යෑමක් වන අතර, රට තුළ ඇතිවූ හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් දෙසැම්බර් මස වැඩසටහන් 12ක් අවලංගු වීම නොසිදුවූයේ නම් මෙම අගය රු.මි. 24කට ආසන්න වීමට හැකියාව තිබුණි.

පරිශ්‍රයේ සංවර්ධන කටයුතු සඳහා වෙන්වූ රු.මි. 21 ක මුදලින් අත්‍යාවශ්‍ය හා ප්‍රමුඛතාවය ලබාදිය යුතු ව්‍යාපෘති හඳුනාගෙන ඇස්තමේන්තුගත මුදල හා සැසඳුණු ව්‍යාපෘති 10ක් පසුගිය වසරේ 100% ක භෞතික ප්‍රගතියක් අත්කර ගනිමින් ක්‍රියාත්මක කල හැකි විය.

ඊට අමතරව පරිශ්‍රයේ කටයුතු සඳහා අත්‍යාවශ්‍ය පොලිෂර්, දිග ඉනිමං, චේන් ෂෝ, high pressure gun ආදී උපකරණ වර්ග 10කට අධික ප්‍රමාණයක්ද මිලදී ගත හැකි විය.



වෙළඳ කුටි වහලයන් අලුත්වැඩියා කිරීමට පෙර තත්වය



වෙළඳ කුටි වහලයන් අලුත්වැඩියා කිරීමෙන් පසු තත්වය



පුරාණ ගම ගැමි නිවාස අලුත්වැඩියා කිරීමට පෙර තත්ත්වය



පුරාණ ගම ගැමි නිවාස අලුත්වැඩියා කිරීමෙන් පසු තත්ත්වය



පුරාණ ගම භූමිය සකස් කිරීමට පෙර තත්ත්වය



පුරාණ ගම භූමිය පස් පුරවා සකස් කිරීමෙන් පසු තත්ත්වය



මහවලව්ව ශාලාවේ කාර්යාල කොටසේ වහලය අලුත්වැඩියා කිරීමට පෙර තත්වය



මහවලව්ව ශාලාවේ කාර්යාල කොටසේ වහලය අලුත්වැඩියා කරන අතරතුර

2024.09.10 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 24/1687/620/034 හි සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් පරිශ්‍රයට අදාළව 2025-2029 ව්‍යාපාර සංවර්ධන සැලැස්මක් සකස් කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අමා/25/1485/822/038 හා 2025.09.04 දිනැතිව ලබා ගෙන ඇත.

එම අනුමැතිය පරිදි 2026 වර්ෂයට මුදල් වෙන්කර ගැනීම හා එහි සඳහන් ආදායම් උත්පාදන මාර්ග සක්‍රීය කර ගනිමින් ආදායම් ඉපයීමට අවශ්‍ය මූලික කටයුතු සියල්ල සම්පාදනය කර ඇත.

වසර කිහිපයකට පෙර දෙස් විදෙස් සංචාරකයන්ගේ නොමද අවධානයට ලක්ව තිබූ මෙම පරිශ්‍රය නැවතත් සංචාරක ආකර්ෂණය සහිත ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ අරමුණෙන් නව සංචාරක ගමනාන්තයක් ලෙස මෙම පරිශ්‍රය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා මෙන්ම බස්නාහිර පළාත් ආණ්ඩුකාර කාර්යාලය හා පළාත් සංචාරක මණ්ඩලය හරහාද විවිධ වැඩසටහන් සැලසුම් කිරීම 2025 වර්ෂයේ ආරම්භ කරන ලදී.

ඒ අනුව, එම ආයතන හා එක්ව Tourism Trail of Kingdom of Kotte නමින් සංචාරක ප්‍රවර්ධන වැඩසටහනක් විදේශිකයන් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් 2025.07.27 දින මෙම පරිශ්‍රයේදී සිදු කරන ලදී.









එම වැඩසටහන හරහා ලද මාධ්‍ය ප්‍රචාරය හේතුවෙන් සංචාරක පැමිණීමේ යම් වර්ධනයක් සිදුවිය. එසේම සෑම මසකම එක් ඉරු දිනක් ‘‘ඉරිදට අපේ ගමට’’ නමින් Kotte Green Tourism Network ප්‍රජා මූල සංවිධානය හරහා සංවිධානය වන සුවිශේෂී වැඩසටහන හරහාද මහජනතාව වෙත ලබා දීමට කටයුතු කරන ලදී.






පසුගිය වසරේ ලද අත්දැකීම් පදනම් කර ගනිමින් අනුමතව ඇති ව්‍යාපාර සැලැස්මටද අනුගත වෙමින් මෙම වසරේ අලුත්වැඩියා කටයුතු රාශියක් මෙන්ම විවිධ වැඩසටහන් ගණනාවක්ද සිදු කිරීමට සැලසුම් කර ඇත.

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 පුනරාවර්තන වියදම්

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ඒසිඒ2(ii) හි 101-2-05-1503 (38) හා 101-2-05-1509 (38) වැය විෂයයන් අනුව අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා කලා මණ්ඩලයට ලබාදුන් පුනරාවර්තන ප්‍රතිපාදන සහ වියදම පිළිවෙලින් රු.14,200,000 හා 13,105,328 ක් ලෙස දක්වා තිබුණ ද, ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය තුළ අමාත්‍යාංශයෙන් ලද පුනරාවර්තන ප්‍රතිපාදනය රු.12,886,447 ක් ලෙස දැක්වීම හේතුවෙන් අමාත්‍යාංශයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වියදම රු.218,881 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

(අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි මූලධන වත්කම් අත්පත් කර ගැනීම් යටතේ මුළු වියදම රු.115,433,579ක් වුවද, ඒසිඒ-6 ආකෘතියේ වර්ෂයට අදාළ මූලධන වත්කම් අත්පත් කර ගැනීම් වටිනාකම රු.53,871,068ක් ලෙස රු. 61,562,511 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2025 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය සතුව පැවති වාහන 04ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබූ අතර එදිනට අමාත්‍යාංශය සතුව නොපැවැති රු.12,300,000ක වටිනාකමකින් යුතු වාහන 03ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර තිබුණි.

1.6.3 අග්‍රිම ශේෂය

(අ) 209/24 අග්‍රිම ගිණුම් අංකයට අදාළව 2025 ජනවාරි 01 දිනට පැවති නොපියවූ උප අග්‍රිම ශේෂය වූ රු.1,638,152ක් ඒසිඒ 3 අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනයෙහි 209/25 අග්‍රිම ගිණුම් අංකය යටතේ 2025 ජනවාරි 01 දිනට වූ ශේෂය ලෙස දක්වා තිබුණි.

(ආ) භාණ්ඩාගාර මුදිත SA-71 අනුව සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු.1,702,916,582ක් වුවද, අමාත්‍යාංශ ශේෂ පිරික්සුම් අනුව එය රු.1,414,907,582ක් හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි රු.1,704,149,126ක් ලෙස වෙනසක් පැවතුණි.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(අ) ඇප ලේඛනය	මුදල් රෙගුලාසි 891	යාවත්කාලීන කර නොතිබුණි.
(ආ) වාහන ලොග් පොත්	මුදල් රෙගුලාසි 1645(අ)	යාවත්කාලීන කර නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මුල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1	2024 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය සතුව පැවති වාහන 06ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබූ අතර එදිනට අමාත්‍යාංශය සතුව නොපැවැති රු.12,300,000ක වටිනාකමකින් යුතු වාහන 03ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර තිබුණි.	1.6.2 (ආ)
1.6.3 (අ)	ඇප ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	1.6.4 (අ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්තන වැය විෂයයන් තිස්නවයක් (39) ක් සඳහා ප්‍රතිපාදිත, එකතුව රු.457,660,742ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 378,437,947ක් ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 30 සිට සියයට 99 දක්වා පරාසයක පැවතුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් හයක් (06) ක් සඳහා ප්‍රතිපාදිත, එකතුව රු.3,850,000ක් හා මූලධන වැය විෂයයන් දෙකක් (02)ක් සඳහා ප්‍රතිපාදිත, එකතුව රු.1,092,000,000ක් වූ සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් හතරක් සහ මූලධන වැය විෂයයක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කරන ලද එකතුව රු. 31,550,000ක් වූ ප්‍රතිපාදනවලින් රු. 19,865,176 ක් ඉතිරි කර තිබූ අතර එම ඉතිරිය මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීම්වල ප්‍රතිශතයක් ලෙස සියයට 43 සිට සියයට 96 දක්වා ඉහළ පරාසයක් ගෙන තිබුණි.

(ඈ) එක් මූලධන වැය විෂයයක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කර ගෙන තිබූ රු. 4,200,000 ක සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ඉ) පුනරාවර්තන වැය විෂයයක් සහ මූලධන වැය විෂයයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් මාරු කරන ලද එකතුව රු.153,218,985 ක් වූ ප්‍රතිපාදන වලින් රු.137,548,141 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 30 සිට සියයට 91 දක්වා පරාසයක පැවතුණි.

(ඊ) මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනයක් නොමැති මූලධන වැය විෂයයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.5,431,957 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණද, වර්ෂය අවසානයේ සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(උ) මූලධන වැය විෂයයන් දහහතරක් (14)ක් සඳහා ප්‍රතිපාදිත, එකතුව රු. 676,810,000ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.459,192,822ක් ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 32 සිට සියයට 99 දක්වා පරාසයක පැවතුණි.

(ඌ) පුනරාවර්තන වැය විෂයයක් සඳහා රු.2,000,000ක් වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් රු.1,000,000ක් මු.රෙ. 66 මඟින් වෙනත් වැය විෂයයකට මාරු කර තිබූ අතර ඉතිරි ප්‍රතිපාදිත මුදල ද අදාල අරමුණ වෙනුවෙන් වැය කර නොතිබුණි.

(එ) පුනරාවර්තන වැය විෂයයන් දහසයක (16) සහ මූලධන වැය විෂයයන් නවයක (09) මුල් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය හා සංශෝධිත ප්‍රතිපාදනය අතර විචලතා පැවතුණු අතර එම විචලතාවය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 31 සිට සියයට 2831 දක්වා පරාසයක පැවතුණි.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) 2024 වර්ෂයට අදාළව 2025 වර්ෂය තුළ නිරවුල් කරන ලද ප්‍රාග්ධන වැය විෂයයන් 23කට හා පුනරාවර්තන වැය විෂයයන් 81කට අදාළ එකතුව රු.34,060,482ක් වූ බැරකම් සමාලෝචිත

වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙහි බැඳීම් බැරකම් වාර්තාවේ නිරවුල් කිරීමට ඇති බැරකම් ලෙස දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වැය විෂයයන් හතරක් යටතේ 2026 වර්ෂය තුළදී ගෙවා තිබුණු එකතුව රු.2,475,856 ක වියදම්, බැඳීම් බැරකම් ලේඛනයෙහි බැරකම් ලෙස ඇතුළත් කර නොතිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104(4)	අලාභයක් සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද, 2025 ජූනි 27 දින හා 2025 සැප්තැම්බර් 09 දින අනතුරට ලක් වූ මෝටර් රථ දෙකක් සම්බන්ධයෙන් වන පූර්ණ වාර්තා එම අනතුරු සිදු වී මාස 05ක් ඉක්මවීමෙන් පසුව ඉදිරිපත් කර තිබුණි.
(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 756 (6)	මුදල් රෙගුලාසි ප්‍රකාරව අමාත්‍යාංශයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.
(ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය	චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවන් සිදු කර නොතිබුණි.

3.4 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබා ගන්නා ලද මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය නිමකල විගසම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත්, සමාලෝචිත

වර්ෂය තුලදී අවස්ථා 20කදී ලබාදී තිබූ එකතු වටිනාකම රු.407,212ක් වූ අතුරු අග්‍රිම පියවීමේදී දින 15 සිට දින 42 දක්වා වූ කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි.

3.5 **තැන්පතු**

අමාත්‍යාංශයේ පොදු තැන්පතු ගිණුමකට අදාළව එකතුව රු.11,721,398ක් වූ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(2) හා (3) හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලැසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි විසර්ජන පනත යටතේ වැය ශීර්ෂයෙන් අනුමත වී ඇති සියළුම අමාත්‍යාංශ විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු වේ. ඒ අනුව 101 වැය ශීර්ෂය යටතේ ඇති බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සඳහා එක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් හා එක් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද, බුද්ධශාසන අංශය, සංස්කෘතික අංශය හා උරුම අංශය සඳහා වෙන් වෙන් වශයෙන් වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් 03ක් හා ක්‍රියාකාරී සැලසුම් 03ක් පිළියෙල කර අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර තිබුණි.

4.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) අමාත්‍යාංශයේ සංස්කෘතික කටයුතු අංශය සඳහා අනුමත ක්‍රියාකාරී සැලැස්ම අනුව,

(i) ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන 220 ට අදාළව පළාත් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සහ සංස්කෘතික මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීම සඳහා රු.800,000 ප්‍රතිපාදන වෙන් කර තිබුණද, 2025 වර්ෂයට අදාළව කිසිදු පළාතක් සම්පූර්ණයෙන්ම ආවරණය වන පරිදි ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා නොතිබුණු අතර මධ්‍යස්ථාන තුනක් එනම්, සියයට 1.3 ක් වැනි ප්‍රමාණයක් ආවරණය වන පරිදි විමර්ශන හා ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා තිබුණි.

(ii) විදේශ සංස්කෘතික සබඳතා පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා රු. මිලියන 01 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද එයින් රු.550,000 ක් එනම් සියයට 55 ක ප්‍රතිපාදන නිෂ්කාර්යව පැවතුණු අතර වර්ෂය තුල ඉටු කල යුතු කාර්යයන් ප්‍රමාණවත්ව

හඳුනා ගෙන නොතිබුණි. කාර්යසාධනය ඇගයීමේ දී සැලසුම් කළ කාර්යයන් ප්‍රගති වාර්තාවේ ඉදිරිපත් කර තිබුණු කාර්යයන් සමඟ නොගැලපීම් පැවතුණි.

(ආ) අමාත්‍යාංශයේ ජාතික උරුම අංශය සඳහා අනුමත ක්‍රියාකාරී සැලැස්ම අනුව,

(i) අපේ ගම පරිශ්‍රයට අයත් මහ වලව්ව ශාලාවේ වහලය අළුත්වැඩියා කිරීම සඳහා රු. මිලියන 8.7 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද, මෙම අළුත්වැඩියාව සමාලෝචිත වර්ෂය තුල දී සම්පූර්ණ කර නොතිබුණු අතර රු. මිලියන 2.489 ක කාර්යයන් පමණක් ඉටුකර තිබීමෙන් රු. මිලියන.6.211 ක ප්‍රතිපාදන එනම් සමස්ත ප්‍රතිපාදනයෙන් සියයට 71 ක් නිෂ්කාර්ය ව පැවතුණි.

(ii) ග්‍රාමෝදය ජනකලා කෙන්ද්‍රයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.මිලියන 6.4 ක්, (H/01) සංගීත පන්තියේ වහල අළුත්වැඩියාව හා වයරින් කිරීම සඳහා රු.මිලියන 0.301 ක් හා කාර්යාල උපකරණ මිල දී ගැනීම සඳහා රු.මිලියන 1.67 වශයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබුණද මෙම කාර්යයන් සමාලෝචිත වර්ෂය තුල දී ඉටුකර නොතිබීමෙන් රු. මිලියන 8.371 ක ප්‍රතිපාදන නිශ්කාර්ය වී තිබුණි.

4.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

අමාත්‍යාංශයේ ප්‍රතිපාදන භාවිතා කරමින් එක් එක් සංස්කෘතික මධ්‍යස්ථානය විසින් අවම වශයෙන් කුසලතා සංවර්ධන වැඩසටහන් 5 ක් වත් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරීව පැවති සංස්කෘතික මධ්‍යස්ථාන 220 න් සංස්කෘතික මධ්‍යස්ථාන 40 ක් එනම් සියයට 18 ක් ඌණ ක්‍රියාකාරී මට්ටමක පැවතුණු අතර එම සංස්කෘතික මධ්‍යස්ථාන විසින් පවත්වනු ලබන පාඨමාලා පිළිබඳ තොරතුරු විශ්ලේෂණය කර ඌණ ක්‍රියාකාරී මට්ටමේ සංස්කෘතික මධ්‍යස්ථාන හඳුනා ගැනීමට හා පාඨමාලා සඳහා විෂය මාර්ගෝපදේශ ලබාදීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

4.1.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ 2025 කාර්යසාධන වාර්තා කෙටුම්පතෙහි ඇතුළත් අනුකූලතා වාර්තාව අනුව අමාත්‍යාංශය විසින් අනුකූල වී නොමැති පහත කරුණු සම්බන්ධයෙන් අනුකූල වන බව වාර්තා කර තිබුණි.

i. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කර නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.

ii. වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.

iii. වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.

iv. වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.

v. කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.

vi. ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන් ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.

4.2 වත්කම් කළමනාකරණය

(අ) 2022 වර්ෂයේදී අපහරණය කළ යුතු බවට නිර්දේශ කර තිබූ අමාත්‍යාංශයේ කාර් රථයක අපහරණ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණි.

(ආ) මාර්ග සංවර්ධන අධිකාරියට අයත්ව තිබූ කැබ් රථයක් 2024 දෙසැම්බර් 09 දින ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රවාහන අංශය හරහා අමාත්‍යාංශය වෙත භාර දී තිබූ අතර එහි වර්තමාන ලියාපදිංචි අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට 2026 මැයි 29 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2018 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව, වාහන දැනට පරිහරණය කරනු ලබන ආයතනයට අයිතිය ලබා ගැනීමට නොහැකි අවස්ථාවලදී වාහනයේ ලියාපදිංචි අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වුවත්, අමාත්‍යාංශයට අයත් එකතු වටිනාකම් රු.49,000,000 ක් වූ වාහන දෙකක ලියාපදිංචි අයිතිය ලබා ගෙන නොතිබුණි.

(ඈ) අමාත්‍යාංශය විසින් පරිහරණය කරනු ලබන රජරට වාරිකා නිවාසය (කුරුන්දන්කුලම) පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල අමාත්‍යාංශය වෙත පවරා ගැනීමේ කටයුතු ද 2026 මැයි 29 දින වන විටත් අවසන් වී නොතිබුණි.

(ඉ) 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයෙහි ඇතුළත් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් නිකුත් කර ඇති මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශයෙහි 2.3 ඡේදය ප්‍රකාරව සෑම වර්ෂ 5කට වරක්ම ඉඩම් හා ගොඩනැගිලි නැවත තක්සේරු කිරීමක් සිදු කළ යුතු වුවත්, නො.135, ධර්මපාල මාවත, කොළඹ 07 හි පිහිටි බුද්ධශාසන අමාත්‍යාංශ ගොඩනැගිල්ල හා ඉඩම සඳහා 2013 ඔක්තෝබර් 28 දිනෙන් පසු තක්සේරු වාර්තාවක් ලබාගෙන නොතිබුණු අතර,2026 මැයි 29 දිනය වන විට එම තක්සේරු වාර්තාවට වසර 12 ක් ඉකුත් වී තිබුණි.

4.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 883 ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය තනතුරුවලට අදාළ සියලුම අලුත් පත්වීම් සහ ඇප තබා ඇති නිලධාරීන් සම්බන්ධයෙන් වන මාරු කිරීම්, ඉල්ලා අස්වීම්, සේවයෙන් පහ කිරීම්, මිය යෑම් යනාදිය සම්බන්ධයෙන් සෑම මසක් පාසාම විගණකාධිපතිවරයාට වාර්තා කළ යුතු වුව ද අමාත්‍යාංශය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 880 ප්‍රකාරව, රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 12 වන අධිකාරියට අනුකූලව අමාත්‍යාංශයේ ඇප තැබිය යුතු නිලධාරීන් 20 දෙනෙකුගෙන් ඇප අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.4 පාඩු හා හානි

2023 වර්ෂයේදී අමාත්‍යාංශයේ සිදුවූ A4 ප්‍රමාණයේ ඡායා පිටපත් සොරකමට අදාළව රජයට සිදුව තිබූ රු.320,450ක් වූ අලාභයෙන් රු.142,867ක් පමණක් අය කර ගෙන ඇති අතර ඉතිරිය වන රු. 177,583ක මුදල 2026 ජූනි 17 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.5 කළමනාකරණ දුර්වලතා

(අ) අමාත්‍යාංශ අත්තිකාරම් "බී" ගිණුමෙහි 2025 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව පාලන ගිණුමේ ශේෂය සමග සැසඳීමේ ප්‍රකාශයේ, කේවල ශේෂ වර්ගීකරණ ශේෂය සහ පාලන ගිණුමේ ශේෂය අතර රු 1,426,148 ක වෙනසක් සඳහන් කර තිබුණු අතර එම වෙනසට හේතු වශයෙන් 2004 සිට 2010 දක්වා වූ හඳුනා නොගත් ශේෂ වෙනස්කම් 04ක් සහ 2008 දෙසැම්බර් මස මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් කර ඇති වැරදි හර කිරීමක් දක්වා තිබුණද, ඒවා නිවැරදි කිරීමට 2025 වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ආ) සංස්කෘතික මධ්‍යස්ථාන විසින් වාර්ෂිකව අනුමත කරගනු ලබන ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කිරීම, අපේක්ෂිත කාර්යසාධන මට්ටමට ළඟාවීම හා තවදුරටත් එක් එක් සංස්කෘතික මධ්‍යස්ථාන විසින් එම ප්‍රදේශයන්ට ගැලපෙන අයුරින් ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් හඳුනාගැනීම පිළිබඳ පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් අමාත්‍යාංශය විසින් සකස් කර නොතිබුණි.

(ඇ) ප්‍රතිභා වැඩසටහනේ පළාත් තරඟ පැවැත්වීමේදී අවශ්‍ය වන සංවිධාන කටයුතු සඳහා අදාළ පළාත්වල සංස්කෘතික මධ්‍යස්ථාන නිලධාරීන්ගේ හෝ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

මගින් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර සිටින නිලධාරීන්ගේ සේවය ලබා ගැනීම මගින් මෙහෙයුම් පිරිවැය අවම කර ගත හැකිව තිබුණද ඒ අනුව කටයුතු කර නොනිබුණු අතර සෑම අවස්ථාවකදීම ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ම අදාළ රාජකාරී සඳහා යෙදවීමට කටයුතු කර තිබීමෙන් වැඩසටහනේ සමස්ත වියදමින් සියයට 53 ක් නිලධාරීන්ගේ නේවාසික, සංග්‍රහ හා ප්‍රවාහන වියදම් සඳහා වැයකර තිබුණි.

(ඇ) ප්‍රතිභා වැඩසටහන සඳහා ඇස්තමේන්තුගත අතිකාල වියදම රු.300,000 ක් එනම් මූලික ඇස්තමේන්තුවෙන් සියයට 3.5 ක් වුවත්, සත්‍ය අතිකාල වියදම රු. 1,034,819 ක් එනම්, මූලික ඇස්තමේන්තුවෙන් සියයට 12 ක් ලෙස සියයට 8.5 කින් වැඩි වී තිබූ බැවින් නිලධාරීන්ගේ අතිකාල වැඩ පාලනය කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයන් නොතිබුණි.

(ඉ) මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වුවද, වසර 3-5 අතර කාලයක් පවතින මියගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.200,983 ක ණය ශේෂයක්ද, වසර 1-3 අතර කාලයක් පවතින මියගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.537,816 ක ණය ශේෂයක්ද වශයෙන් රු.738,799 ක එකතු ණය ශේෂයක් තවදුරටත් පැවතුණි.

(ඊ) විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ විධිවිධාන වලට අනුව කටයුතු කල යුතු වුවද, වසර 1-3 අතර කාලයක් පවතින විශ්‍රාම ගිය නිලධාරීන් හය දෙනෙකුගෙන් අයවියයුතු රු.139,170 ක එකතු ණය ශේෂයක්ද, වසර 3-5 අතර පවතින එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.124,077 ක ණය ශේෂයක් හා වර්ෂ 20 කට වැඩි එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.128,732 ක ණය ශේෂයක් වශයෙන් රු.391,980 ක එකතු ණය ශේෂයක් පැවතුණි.

(උ) සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීම සඳහා 2020 ඔක්තෝම්බර් 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛයේ පලමු කොටසේ 3.1 (ආ) හි විධිවිධාන පරිදි කටයුතු කලයුතු වුවද සේවය අතහැර ගොස් වසර 1-3 අතර කාලයක් ගතවූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු.300,510 ක එකතු ණය ශේෂයක්ද, වසර 3 – 5 අතර කාලයක් ගතවූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.127,580 ක ණය ශේෂයක්ද, වසර 10 - 20 අතර කාලයක් ගතවූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.64,130 ක ණය ශේෂයක්ද වශයෙන් එකතුව රු.492,220 ක එකතු ණය ශේෂයක් තවදුරටත් පැවතුණි.

(ඌ) වැඩ තහනම් කල නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිඡේදයේ 4.5 වගන්ති ප්‍රකාරව කටයුතු කල යුතු වුවද, තවදුරටත් අය විය යුතු වසර 5-10 කාලයක් පවතින වැඩ තහනම් කල නිලධාරීන් දෙදෙනෙකුගේ අයවිය යුතු රු. 20,195 ක ණය ශේෂයක්ද, වසර 10 – 20 අතර කාලයක් පවතින වැඩ තහනම් කල නිලධාරීන් හය දෙනෙකුගෙන් අයවිය යුතු රු.443,875 ක ණය ශේෂයක්ද, වශයෙන් එකතුව රු. 464,070 ක එකතු ණය ශේෂයක් පැවතුණි.

(එ) 2020 වර්ෂයේ ඉදිකර තිබූ ප්‍රසිද්ධ රඟමු පාලක මණ්ඩලයට අයත් ආසන සියයකින් යුක්ත සිනමා ශාලාව 2026 මැයි මාසය වන විටත් අක්‍රිය තත්වයේ පවතින අතර පැරණි සිනමා ශාලාව පැවති සමයේ දී මිල දී ගෙන තිබුණු Digital Cinema Project යන්ත්‍රය අක්‍රිය වීම නිසා මෙම සිනමා ශාලාව ක්‍රියාත්මක තත්වයට පත් කිරීමට නොහැකි වී පැවතුණි. 2025 ඔක්තෝබර් 14 දිනැති අමප 25/1837/822/047 අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අමාත්‍යාංශය වෙත වෙන් කරනු ලැබ ඇති අයවැය ප්‍රතිපාදන තුල කලමණාකරණය කර ගැනීමට යටත්ව Digital Cinema Project යන්ත්‍රයක් මිල දී ගැනීමට අනුමැතිය දී තිබුණ ද අමාත්‍යාංශය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඒ) මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය පිහිටි ඉඩම රජයේ ඉඩමක් වන අතර මෙම උද්‍යානය ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය යටතේ පැවති කාල සීමාවේදී එම අමාත්‍යාංශයේ බලයලත් නිලධාරියා වෙතට මෙම ඉඩමේ අයිතිය පැවරීම සිදුකර තිබුණි. 2026 මැයි 31 දින වන විටත් ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයේ බලයලත් නිලධාරියාගේ නමින් පැවති මෙම ඉඩම අමාත්‍යාංශය වෙත පවරා ගෙන නොතිබුණි.

(ඔ) 2024 මැයි 31 දිනැති අංක 01/2020(III) දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.2 අනුව පාර්ලිමේන්තුවේ සම්මත කර ඇති පණතකින් හෝ වෙනත් යම් නීතියකින් විධිවිධාන සලස්වා නොමැති අවස්ථාවන්හිදී, රාජ්‍ය ආයතන විසින් මහජනතාව වෙත සේවා සම්පාදනය කිරීමේදී අයකරනු ලබන ගාස්තු වසර තුනකට වරක් සමාලෝචනය කළ යුතු වුවද ටෙලි සිනමා උද්‍යානය ආරම්භයේදී අය කිරීමට තිරණය කරන ලද ගාස්තු 2026 මැයි 31 දින දක්වා සංශෝධනය කර නොතිබුණු අතර මේ හේතුවෙන් ගාස්තු ඉහළ නැංවීම මගින් ලබාගත හැකිව තිබූ අමතර ආදායම වර්ෂ කිහිපයක් තිස්සේ අහිමි වී ගොස් ඇති අතර මේ සඳහා වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156(I)(අ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඕ) මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානයේ ආයතනික සේවා ගිවිසුම අනුව "නිර්මාණයේ රුගත කිරීම්වලින් සියයට 75 ක් අවසන් වන විට එදිනට අදාළ සියලු බිල්පත්

ගෙවා අවසන් කළ යුතු අතර නිර්මාණයේ සියළුම වැඩ කටයුතු වලට අදාළ අවසන් බිල්පත් හිඟය උද්‍යානයෙන් පිටතට යාමට පෙර ගෙවා අවසන් කළ යුතු" බව දක්වා නිබුණද, එසේ සියළුම හිඟ ආදායම් අයකර නොගත් අවස්ථා පැවතුණි.

(ක) සංස්කෘතික මධ්‍යස්ථාන වලට අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලයට හා සම්පත්දායකයන්ට අනුරූපව පවත්වාගෙන යනු ලබන පාඨමාලා ප්‍රමාණය, මධ්‍යස්ථානය සතු භෞතික සම්පත් ප්‍රමාණයට අනුව නිරත වන ආදායම් උත්පාදන කාර්යයන් ප්‍රමාණය යනාදී වශයෙන් මෙම එක් එක් සංස්කෘතික මධ්‍යස්ථානය පිළිබඳ සියළුම තොරතුරු ලබා ගැනීමට ප්‍රමාණවත් තොරතුරු පද්ධතියක් අමාත්‍යාංශය සකස් කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අදාළව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශය සඳහා අනුමත කළ කාර්ය මණ්ඩලය 1189 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 1194 ක් වූයෙන් සමස්තයක් ලෙස කාර්ය මණ්ඩලය පස් දෙනෙකුගෙන් අතිරික්ත වී තිබුණි. තවද ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 6ක, තෘතීය මට්ටමේ තනතුරු 3ක, ද්විතීක මට්ටමේ තනතුරු 35ක පුරප්පාඩු පැවති අතර සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 49ක අතිරික්තයක් ඒ අතර පැවතුණි.

(ආ) සංස්කෘතික මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය තුළ එක් සංස්කෘතික මධ්‍යස්ථානයක් සඳහා අවම වශයෙන් ද්විතීයක ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනෙකු හා කාර්යාල කාර්ය සහයක ශ්‍රේණියේ නිලධාරීන් එක් අයෙකු වශයෙන් සේවයේ යෙදවිය යුතු වුවත්, සංස්කෘතික මධ්‍යස්ථාන 223 සඳහාම ද්විතීක ශ්‍රේණියේ නිලධාරීන් 386 ක් හා කාර්යාල කාර්ය සහයක ශ්‍රේණියේ නිලධාරීන් 194 ක් පමණක් අනුයුක්ත කර තිබීම මත පිළිවෙලින් ද්විතීයක ශ්‍රේණියේ නිලධාරීන්ගේ හා කාර්යාල කාර්ය සහයක ශ්‍රේණියේ නිලධාරීන්ගේ 60 ක හා 29 ක ඌණතාවයක් පැවතුණි.

කේ.එච්.සූ.ඩී.සරත් කුමාර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

4.1.1 බුද්ධශාසන අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100-90 %	**89-75 %**	**74-50 %**
1. පූජාභූමි පහසුකම් ඉහල නැංවීමේ ප්‍රමාණය • සැලසුම් කළ සංවර්ධන වැඩසටහන් ප්‍රමාණය - 13 අවසන් කරන ලද වැඩසටහන් ප්‍රමාණය - 13 • සන්නස්පත්‍ර ලබාදීමට සැලසුම් කළ ප්‍රමාණය -14 ලබාදුන් සන්නස් ප්‍රමාණය -14	100%	-	-
2. ග්‍රාමීය විහාරස්ථානයන්හි භෞතික යටිතල පහසුකම් ඉහල නැංවීමේ ප්‍රමාණය • සැලසුම් කළ විහාරස්ථාන සංවර්ධන වැඩසටහන් ප්‍රමාණය - 215 • අවසන් කරන ලද විහාරස්ථාන සංවර්ධන වැඩසටහන් ප්‍රමාණය - 215	100%	-	-
3. විද්‍යාලංකාර බෞද්ධ සම්මන්ත්‍රණශාලාවෙහි විදුලි පද්ධති හා ඉතිරි වැඩ නිමකිරීමේ ප්‍රමාණය • අපේක්ෂිත නිමැවුම - 100 % • සත්‍ය නිමැවුම - 100%	100%	-	-
4. සමාජීය, ආධ්‍යාත්මික හා ආර්ථිකමය වශයෙන් පුද්ගලයන් බලගැන්වීම සඳහා පවත්වන ලද වැඩසටහන් ප්‍රමාණය • සැලසුම් කල වැඩසටහන් ප්‍රමාණය - 800 • පවත්වන ලද වැඩසටහන් ප්‍රමාණය - 847	100%	-	-
5. අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු නිම කිරීමේ ප්‍රමාණය • සැලසුම් කල ප්‍රමාණය වැටිබදු 100% ගෙවා අවසන් කිරීම • සත්‍ය නිමැවුම - 0%	-	-	-
6. බෞද්ධ විහාරස්ථාන සඳහා ලබාදුන් සූර්යයබල විදුලි පද්ධති ප්‍රමාණය/ ඉදිකරන ලද පැනල පද්ධතිය • සැලසුම් කල ප්‍රමාණය- 9000 • සත්‍ය නිමැවුම - 0	-	-	-

4.1.2 සංස්කෘතික කටයුතු අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
1. සංස්කෘතික මධ්‍යස්ථානවල පාඨමාලා හදාරන සිසුන් ගණන, සත්‍ය අගය - 44,855 (සංස්කෘතික මධ්‍යස්ථාන -221) (අපේක්ෂිත අගය - 45,000)	100%	-	-
2. සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාල හරහා පුස්තකාල පහසුකම් ලබන ප්‍රාදේශීය පුස්තකාල සාමාජිකයන් ගණන, සත්‍ය අගය - 50,115 (අපේක්ෂිත අගය - 40,000) (100% ඉක්මවා ගොස් ඇති අතර තත්‍ය අගය -125%)	100%	-	-
3. සංස්කෘතික කටයුතු අංශය මගින් වාර්ෂිකව පවත්වන ලද / දායකත්වය ලබාදෙන ලද ජාතික/ විශේෂ වැඩසටහන් ගණන, සත්‍ය අගය - 05 (අපේක්ෂිත අගය - 10)	-	-	50%
4. සංස්කෘතික මධ්‍යස්ථාන විසින් ප්‍රාදේශීයව පවත්වන ලද විශේෂ සංස්කෘතික වැඩසටහන් ගණන සත්‍ය අගය - 2,065 (අපේක්ෂිත අගය - 1,300) (100% ඉක්මවාගොස් ඇති අතර තත්‍ය අගය -158% වී ඇත.)	100%	-	-
5. සංස්කෘතික කටයුතු අංශය මගින් පවත්වන ලද විදේශ සංස්කෘතික සබඳතා වැඩසටහන් ගණන සත්‍ය අගය - 05 (අපේක්ෂිත අගය - 35) තත්‍ය නිමැවුම (14%)	-	-	-
6. ක්‍රියාත්මක සංස්කෘතික ද්විපාර්ශ්වික ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් ගණන සත්‍ය අගය - 50 (අපේක්ෂිත අගය - 68)	-	-	74%
7. අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීම (සිංහල හා දමිළ මාධ්‍ය වලින්) සත්‍ය අගය - 1,765 (අපේක්ෂිත අගය -3,000)	-	-	59%

4.1.3. ජාතික උරුම අංශය

විශේෂිත දර්ශක	වාර්ෂික අයවැය ප්‍රතිපාදන (රු.මී)	මූල්‍ය ප්‍රගතිය		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			වෙනත්
		සත්‍ය වියදම (රු.මී)	වෙන් කළ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස	100% -90%	75% - 89%	50% - 74%	
(1).ව්‍යාපෘතිය - ආදී වාසි ප්‍රජා සංරක්ෂණ කාර්යයන් ***** දර්ශකය - ආදිවාසි උරුමයන් සංරක්ෂණය	**9.397**	**8.419**	**89%**	√			
(2) උරුමයන් ප්‍රවර්ධනය හා ස්වදේශික ජනතාව ආරක්ෂා කිරීම * දර්ශකය - ආදිවාසී ප්‍රජාවගේ දෛනික කටයුතු පහසුවීම.	**10.9**	9.301	**84%**		√		*පොල්ලේබැද්ද ආදිවාසී ගම්මානයේ පවුල් 50ක් සඳහා වැසිකිලි පහසුකම් ලබා දීම. *හෙනානිගල ජන උරුම කේන්ද්‍රය පරිශ්‍රයේ පිහිටි වරිග සහා ගොඩනැගිල්ල වහලය සකස් කිරීම.
* දර්ශකය - ශ්‍රී ලාංකීය දරු පරපුරු සාම්ප්‍රදායික අගයන් පිළිබඳව දැනුවත් වීම සහ ඒම සම්ප්‍රදායන් අඛණ්ඩව පවත්වාගෙන යාමට සමත් සංස්කෘතික මිනිසෙකු බිහිවීම	**2.6**	1.646	**63%**	√			*2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ වැඩසටහන් 06 සිදු කර අවසන්ව ඇත.
* දර්ශකය - විද්‍යුත් මාධ්‍ය හා සමාජ මාධ්‍ය මගින් ජාතික උරුම සංරක්ෂණය	**1.5**	0.003	**0.2%**			√	*දුම්රිය දෙපාර්තමේන්තුව වෙත වාර්තාමය විඩියෝපට ප්‍රචාරණය සඳහා ලබා දී ඇති අතර ඒ සඳහා වර්ෂයකට රු. 3000.00 වැනි අවම කාර්තුමය වියදමක් පමණක් දැරීමට සිදු විම. සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකන් ගුවන් සේවය හා ශ්‍රී ලංකා ගුවන් තොටුපල මඟින් ප්‍රචාරණය සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇ.නි අතර ඒ සඳහා මුල්‍ය පිරිවැයක් දැරීමට සිදු නොවීය.
(3).ව්‍යාපෘතිය - ආදිවාසී/ සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාව සංරක්ෂණ සේවාවන් පැවැත්වීම - ***** දර්ශකය - ආදිවාසී හා සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාවන්ගේ අයිතීන් සුරැකීම සඳහා සංස්කෘතික හා සාම්ප්‍රදායික උත්සව	**3.014**	2.721	**90%**	√			*ඉලක්ක ගත භෞතික ප්‍රගතිය ලභා කර ගත හැකි විය.
(4). ව්‍යාපෘතිය - සමාජ සජීවිකරණ වැඩසටහන සිදු කිරීම. *දර්ශකය - සමාජ සජීවිකරණය තුළින් බල ගන්වන ලද ආදිවාසී ප්‍රජාව	**1.7**	0.861	**51%**			√	*ඉදිරිපත් වී තිබූ ව්‍යාපෘති යෝජනා අතරින් සමාජ සජීවීකරණ වැඩසටහන් ලෙස ක්‍රියාත්මක කිරීමට සුදුසු ව්‍යාපෘති යෝජනා අවම වීම. වැඩසටහන් 07 ක් ක්‍රියාත්මක කිරීම.

විශේෂිත දර්ශක	වාර්ෂික අයවැය ප්‍රතිපාදන (රු.මි)	මූල්‍ය ප්‍රගතිය		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			වෙනත්
		සත්‍ය වියදම (රු.මි)	වෙන් කළ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස	100% -90%	75% - 89%	50% - 74%	
(5).ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය * ව්‍යාපෘතිය - පාඨමාලා සංවර්ධනය *දර්ශකය - සංවර්ධනය වූ පාඨමාලා ගණන	11.664	2.5	21%			√	
* ව්‍යාපෘතිය - අලුත්වැඩියා කටයුතු, ඉදිකිරීම සහ මිල දී ගැනීම *දර්ශකය - ප්‍රමුඛතා පදනම් මත තෝරා ගත්/සංවිධානය කළ යටිතල පහසුකම්							
(7). පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය - ගොඩනැගිලි හා ඉදිකිරීම් සේවා *දර්ශකය - ගවේෂණය කරන ලද පුරාවිද්‍යාත්මක හා ස්මාරක සංරක්ෂණය හා නඩත්තු කටයුතු	667.284	282.399	42%			√	
(8) .අපේ ගම ව්‍යාපෘතිය - අපේ ගම පරිශ්‍රය අළුත් වැඩියා කටයුතු *දර්ශකය- ප්‍රමුඛතා පදනම් මත තෝරාගත් සංවර්ධනය කල යටිතල පහසුකම්	48.8	16.399	34%			√	
(9).ටවර් හෝල් රඟහල පදනම * දර්ශක- ප්‍රමුඛතා පදනම් මත අලුත් වැඩියා කරන ලද යටිතල පහසුකම් (වායු සමීකරණ හා වයරින් පද්ධතිය) හා පාඨමාලා පවත්වා ගෙන යාමේ තිරසර බව තහවුරු වීම.	50.0	34.245	68%		√		
(10) ගාලු උරුමය පදනම *සංචාරක තෘප්තිය පිළිබඳව ධනාත්මක ප්‍රතිචාර	40.0	8.42	21%				
(11)රන්මිහිතැන්න ජාතික ටෙලි සිනමා උද්‍යානය	60	5.585	9%				ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා අභිලාෂයන් කැඳවීම හේතුවෙන් ආයතනය පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය ව්‍යාපෘති හැර අනෙකුත් ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීමට තීරණය කරන ලදී.
(12) .කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය ව්‍යාපෘතිය- සාම්ප්‍රදායික ගම සංවර්ධන වැඩසටහන	5	3.365	67%			√	

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

5.1.1 බුද්ධශාසන අංශය

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0-49 (%)	50-74 (%)	75-100 (%)
අරමුණ 17 : අරමුණු සඳහා හවුල්කාරිත්වය	**ඉලක්කය: 17.16 (බහුපාර්ශ්වික හවුල්කාරිත්වය)** **ඉලක්කය:** තිරසාර සංවර්ධනය සඳහා වන ගෝලීය හවුල්කාරිත්වය වැඩිදියුණු කිරීම. මේ සඳහා දැනුම, විශේෂඥතාව, තාක්ෂණය සහ මූල්‍ය සම්පත් බෙදාහදා ගන්නා බහුපාර්ශ්වික හවුල්කාරිත්වයන් (Multi-stakeholder partnerships) මගින් සහාය ලබා දීම. • **දැනුම බෙදාහදා ගැනීම:** • **සංස්කෘතික රාජ්‍ය තාන්ත්‍රිකභාවය:**	• ථේරවාද බුදුදහම පිළිබඳ දැනුම ලෝකය සමග බෙදාහදා ගැනීම සඳහා වෙනත් රටවල් සමග ඇති කරගන්නා අධ්‍යාපනික සහ ආගමික ගිවිසුම් • ආගමික සංචාරක සහ අධ්‍යාපනික සේවා සඳහා වීසා නිකුත් කිරීමේ සහ දීර්ඝ කිරීමේ සහ සහන වීසා සේවා • ආගමික සබඳතා හරහා වෙනත් රටවල් සමග මිත්‍රත්වය වර්ධනය කර ගැනීම - විදේශ ආධාර ව්‍යාපෘති සඳහා අධීක්ෂණ ආයතනය ලෙස සම්බන්ධීකරණය කිරීම	-	-	80% 100% 100%
අරමුණ 16: සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන (Peace, Justice and Strong Institutions)	• **ඉලක්කය 16.1:** සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් සහ ඒ ආශ්‍රිත මරණ අනුපාතයන් ලොව පුරා අවම කිරීම. (ආගමික සහජීවනය තුළින් ගැටුම් අවම කිරීම). • ආගමික සංහිඳියාව සහ ජාතික සමගිය තහවුරු කිරීම. • **ඉලක්කය 16.b:** තිරසාර සංවර්ධනය සඳහා වෙනස් කොට සැලකීමකින් තොරව නීති සහ ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම සහ බලාත්මක කිරීම.	•ආගමික සහජීවනය සඳහා ප්‍රතිපත්ති සැකසීම / ප්‍රතිපත්තිමය තීරණ ගැනීම •සර්ව ආගමික සභාව පිහිටුවීම			100% 100%

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0-49 (%)	50-74 (%)	75-100 (%)
අරමුණ 11: තිරසාර නගර සහ ප්‍රජාවන් (Sustainable Cities and Communities)	**ඉලක්කය 11.4:** ලෝකයේ සංස්කෘතික හා ස්වභාවික උරුමයන් ආරක්ෂා කිරීමට සහ සංරක්ෂණය කිරීමට දරන උත්සාහයන් ශක්තිමත් කිරීම.	• පූජාභූමි පහසුකම් ඉහල නැංවීම • විහාරස්ථානයන්හි භෞතික යටිතල පහසුකම් ඉහල නැංවීම • විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණශාලාවෙහි විදුලි පද්ධති හා ඉතිරි වැඩ නිමකිරීමේ ප්‍රමාණය - අපේක්ෂිත නිමැවුම 100 % • අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම් සම්පූර්ණ කිරීමේ ප්‍රමාණය අපේක්ෂිත නිමැවුම - අදාල වැට් බදු ගෙවීම	0%		100% 100% 100%
අරමුණ 04: ගුණාත්මක අධ්‍යාපනය (Quality Education) - **සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන්" හරහා ගුණාත්මක පුරවැසියෙකු බිහි කිරීම**	**ඉලක්කය 4.7:** තිරසාර සංවර්ධනය සහ තිරසාර ජීවන රටාවන්, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සාමය සහ අවිහිංසාව ප්‍රවර්ධනය කිරීම මගින් සියලුම ඉගෙන ගන්නන් දැනුම සහ කුසලතා ලබා ගැනීම සහතික කිරීම.	සාර්ථකව අවසන් කරන ලද සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව			100%
අරමුණ 07: දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය (Affordable and Clean Energy) **අරමුණ 13: දේශගුණික පියවර** (Climate Action): හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම මගින් දේශගුණික විපර්යාස පාලනයට සහාය වීම.	**ඉලක්කය 7.2:** 2030 වන විට ගෝලීය බලශක්ති සංකලනය (Energy Mix) තුළ **පුනර්ජනනීය බලශක්තියේ (Renewable Energy)** කොටස සැලකිය යුතු ලෙස වැඩි කිරීම.	සුර්යබල විදුලි පහසුකම් ලබාදුන් විහාරස්ථාන සංඛ්‍යාව	18%		

5.1.2 සංස්කෘතික කටයුතු අංශය

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
අරමුණ 4: පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමට අවස්ථාව සලසා දීම	**4.7.** 2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපන හා තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය, ප්‍රවණ්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය හා සංස්කෘතික විවිධත්වය ඇගයීම හා තිරසර සංවර්ධනයට සංස්කෘතික වශයෙන් දායක වීම ඇතුලත් වේ	1. දීප ව්‍යාප්තව ඉදිවන, ක්‍රියාත්මක සංස්කෘතික මධ්‍යස්ථාන ගණන	-	66%	-
		2. සංස්කෘතික මධ්‍යස්ථාන හරහා පැවැත්වෙන පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන් සංඛ්‍යාව	-	61%	-
		3. සංස්කෘතික මධ්‍යස්ථානවල ප්‍රාදේශීය පුස්තකාල පරිශීලනය කරන පාඨක සංඛ්‍යාව	-	-	100%
		4.සංස්කෘතික මධ්‍යස්ථාන විසින් ප්‍රාදේශීයව පවත්වන ලද විශේෂ සංස්කෘතික වැඩසටහන් ගණන	-	-	100%
		5.සංස්කෘතික කටයුතු අංශය මගින් වාර්ෂිකව දායකත්වය දක්වන ලද විශේෂ සංස්කෘතික වැඩසටහන් සංඛ්‍යාව	-	50%	-
		6.විදේශ සංස්කෘතික සබඳතා - සංස්කෘතික ද්විපාර්ශ්වික ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව	-	74%	-
අරමුණ 11: නගර හා ජනාවාස, පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් හා තිරසර ලෙස සකස් කිරීම	**11.4.** ලෝකයේ ස්වභාවික හා සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම	1. ප්‍රතිභා තරඟාවලියේ ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් සංඛ්‍යාව	-	67%	-
		2. අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීම	-	59%	-
		3. ජාතික උරුමයන් සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම.	35%	-	-

5.1.3 ජාතික උරුම අංශය

ඉලක්ක	අරමුණු/ ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
11.4. ලෝකයේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීමට සහ ආරක්ෂා කිරීමට දරන උත්සාහයන් ශක්තිමත් කිරීම .	***ආදී වාසි ප්‍රජා සංරක්ෂණ කාර්යයන්** **දඹාන ජන උරුම කෞතුකාගාරය ආශ්‍රිත ප්‍රතිසංස්කරණය**	ආදිවාසි උරුමයන් සංරක්ෂණය			√
	***තෝරාගත් යටිතල පහසුකම් සංවර්ධනය කරන ලද ආදිවාසි ගම්මාන**	ආදිවාසී ප්‍රජාවගේ දෛනික කටයුතු පහසු වීම			√
	***සංස්කෘතික කඳවුරු පැවැත්වීම**	**ශ්‍රී ලාංකීය දරු පරපුරු සාම්ප්‍රදායික අගයන් පිළිබඳව දැනුවත් වීම සහ එම සම්ප්‍රදායන් අඛණ්ඩව පවත්වාගෙන යාමට සමත් සංස්කෘතික මිනිසෙකු බිහිවීම**			√
	***ආදිවාසී/ සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාව සංරක්ෂණ සේවාවන් පැවැත්වීම,** ආදිවාසි දිනය සැමරීම සහ වාර්ෂික ගාන්තිකර්ම සිදු කිරීම .	ආදිවාසි හා සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාවන්ගේ අයිතීන් සුරැකීම හා තෘප්තිමත් ජන කොටසක් බවට පත් වීම			√
	***ප්‍රකාශිත ජාතික උරුම හඳුනා ගැනීම හා සංරක්ෂණය**	ජාතික උරුමයන් සංරක්ෂණය හා පර්යේෂණය සඳහා ස්ථායී හා විධිමත් ක්‍රමවේදයක් පැවතීම			√
9. ධරණීය යටිතල පහසුකම් ගොඩ නැගීම , සංයුක්ත සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සහ නව්‍යකරණයන් පෝෂණය කිරීම	*** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව** විශ්වීය වැදගත්කමක් ඇති පුරාවිද්‍යා ස්ථාන ලෝක උරුම තත්ත්වයට උත්ශ්‍රේණි කිරීම	ගවේෂණය කරන ලද පුරාවිද්‍යාත්මක හා ස්මාරක සංරක්ෂණය හා නඩත්තු කටයුතු		√	
11. තිරසර නගර සහ ප්‍රජාවන්	***අපේ ගම** අපේ ගම පරිශ්‍රයේ ප්‍රතිසංස්කරණ කටයුතු	ප්‍රමුඛතා පදනම මත තෝරාගත් සංවර්ධනය කල යටිතල පහසුකම්			√
	***කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය**	සාම්ප්‍රදායික ගම සංවර්ධන වැඩසටහන			√
	***ගාලු උරුමය පදනම** ලෝකයේ ස්වාභාවික සහ සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම	අරමුදල් මූලාශ්‍ර (පොදු, පුද්ගලික), උරුම වර්ගය (සංස්කෘතික, ස්වභාවික) සහ රාජ්‍ය මට්ටම (ජාතික, ප්‍රාදේශීය සහ මහ නගර) මගින් සියලුම සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් සංරක්ෂණය , ආරක්ෂාව සහ සංරක්ෂණය සඳහා වූ මුළු එක පුද්ගල වියදම			√
4.1. ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබාගැනීමට හැකි වන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් සඳහ නිදහස් සමාන හා ගුණාත්මකභාවයෙන් ඉහළ , ප්‍රාථමික, සහ ද්විතියික අධ්‍යාපනයන් සම්පූර්ණ කර සිටින බව තහවුරු 4.2. සියලුම ගැහැණු ළමුනට සහ පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට, සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම හා එමඟින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සුදානම්ව සිටින බව තහවුරු කිරීම.	***ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය** සෞන්දර්ය පාඨමාලා සඳහා තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ සහ ජාතික ආයුතිකත්ව පුහුණු අධිකාරියේ අනුමැතියෙන් ජාතික නිපුණතා මට්ටම ලබාගැනීමට හැකිවන ආයතනයක් බවට පත් කිරීම.	සංවර්ධනය වූ පාඨමාලා ගණන			√
	***ටවර් හෝල් පදනම්** ඩිප්ලෝමා පාඨමාලා 04 ක් ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය උපකරණ මිලදී ගැනීම	නාට්‍ය නිර්මාණයෙන් ඉහළ මට්ටමක දැනුමක් ලබා දීම			√

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

5.2.1 බුද්ධශාසන අංශය

බුද්ධශාසන අංශය යටතේ තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේදී කැපී පෙනෙන ප්‍රගතියක් අත්කරගෙන ඇත. විශේෂයෙන්ම, ගුණාත්මක අධ්‍යාපනය (අරමුණ 04) යටතේ සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන් හරහා ගුණාත්මක පුරවැසියන් බිහි කිරීමේ ඉලක්කය 100% ක් සපුරා ඇත. එමෙන්ම, සාමය සහ ශක්තිමත් ආයතන (අරමුණ 16) තහවුරු කිරීමට සර්ව ආගමික සභාව පිහිටුවීම සහ ආගමික සහජීවන ප්‍රතිපත්ති සැකසීම මගින් පූර්ණ ජයග්‍රහණ ලබාගෙන ඇත.

සංස්කෘතික උරුමයන් සුරැකීම (අරමුණ 11) යටතේ පූජාභූමි සහ විහාරස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය 100% ක මට්ටමක පවතී. අරමුණු සඳහා හවුල්කාරිත්වය (අරමුණ 17) යටතේ දැනුම බෙදාහදා ගැනීම සහ ආගමික සබඳතා වර්ධනය ඉහළ මට්ටමක පවතින අතර, පුනර්ජනනීය බලශක්තිය (අරමුණ 07) යටතේ විහාරස්ථාන සඳහා සූර්යබල පහසුකම් ලබාදීම 18% ක් වැනි අවම මට්ටමක පැවතීම අභියෝගයකි.

5.2.2 සංස්කෘතික කටයුතු අංශය

- **ජයග්‍රහණ**
    - නාගරික වතු ප්‍රජාව, බන්ධනාගාර රැඳවියන් හා කඳුකර වතු ප්‍රජාව ඇතුළත් ආන්තික ප්‍රජාවගේ සංස්කෘතික අයිතීන් තහවුරු කිරීම සඳහා නව වැඩසටහන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
    - ආබාධ සහිත ප්‍රජාවගේ අයිතීන් තහවුරු කිරීම සඳහා නව වැඩසටහන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම යටතේ මානව පුස්තකාල වැඩසටහනක් පැවැත්වීම හා ආබාධිත ප්‍රජාවගේ ස්වයං චරිතාපදාන සංග්‍රහය මුද්‍රණය කිරීම.
    - දැයේ දරුවන්ගේ කලා කුසලතාවයන් සංවර්ධනය හා දිරිගැන්වීම මගින් අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන "ප්‍රතිභා 2025" උත්සවය පැවැත්වීම.
    - 77 වන ජාතික නිදහස් දින සමරු උළෙල සඳහා සංස්කෘතික විශේෂාංගය වෙනුවෙන් සංස්කෘතික මධ්‍යස්ථානයන්හි ශිල්පීන් හා නර්තන සංචිතයේ ශිල්පීන් සහභාගී කරවීම.
    - අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලිය හරහා රාජ්‍ය සේවයින්ගේ සහ විශ්‍රාමික රාජ්‍ය සේවකයින්ගේ කලා කුසලතාවයන් ඇගයීම.
- **අභියෝග**
    - මීගමුව දළුගම තරුණ වරදකරුවන්ගේ විශෝධන බන්ධනාගාරයේ රැඳවියන් සඳහා පෞරුෂ සංවර්ධන පුහුණු වැඩමුළු පැවැත්වීම.
    - දිවයින පුරා පවතින සංස්කෘතික මධ්‍යස්ථාන ජාලය සක්‍රීයව පවත්වා ගැනීම.
    - "ශ්‍රී ලාංකික දිනය" ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම.

5.2.3 ජාතික උරුම අංශය

ජාතික උරුම හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම සඳහා වන දිගුකාලීන අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක වීමට විශේෂිත වූ ක්‍රමවේදයක් නොමැතිවීම මෙම ක්ෂේත්‍රය තුළ පැවති විශාල හිඩැසකි. ඒ අනුව ජාතික උරුම හඳුනා ගැනීම හා නම් කිරීම සඳහා නිර්ණායක සකස් කරන ලදී. ශ්‍රී ලංකාවේ ජාතික උරුම ලෙසින් නම් කළ හැකි සංස්කෘතික උරුම සහ ස්වභාවික උරුමයන් පිළිබඳව වන නාම යෝජනා කැඳවීම අනුව ජාතික උරුම ලෙස නම් කිරීමට යෝජනා 24ක් ලැබී ඇත. ඒ සඳහා පත් කළ විද්වත් අනු කමිටු විසින් එම යෝජනා සමාලෝචනය කර ජාතික උරුම ලෙස නම් කිරීම සඳහා කටයුතු කරමින් සිටින අතර ක්ෂේත්‍ර පරීක්ෂාවට අදාළ ආයතන වල නිර්දේශ ලබා දෙමින් කටයුතු කිරීම සඳහා දිගු කාලයක් ගත වේ.

ජාතික උරුම හා සංස්කෘතික කඳවුරු වැඩසටහන පැවැත්වීම සඳහා දින වෙන් කර ගැනීමත්, පාසල් සිසුන්ගේ නාම ලේඛන ලබා ගැනීමත්, කඳවුර සඳහා සිසුන් සහභාගී කර ගැනීමත්, ස්වභාවික ආපදා තත්ත්වයන් හේතුවෙන් (අධික වර්ෂාව හා ගංවතුර) වෙන් කර ගන්නා දින වලදී කඳවුරු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වීම ආදී විවිධ අභියෝග වලට මුහුණ දීමට සිදු විය.

ආදිවාසී ප්‍රජාව මුහුණ දෙනු ලබන ගැටලු හා අභියෝගයන් වලට සාර්ථකව මැදිහත් වීමට හැකිවිය. ඒ අනුව ආදිවාසී අනන්‍යතාවය හා සංස්කෘතික උරුමය සංරක්ෂණය වන පරිදි දඹාන ජන උරුම කෞතුකාගාරය නවීකරණය කිරීම, ආදිවාසී ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය හා සමාජ සජීවීකරණය සාර්ථකව නිම කරන ලදී.

අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු හා කාර්යයන්ට අනුකූලව ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම හා සංස්කෘතිය, සාහිත්‍ය සහ කලාව ඉහළ ප්‍රමිතියකින් හා උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ ද කාලගුණික වෙනස්කම් හා හදිසි ආපදා තත්ත්වයන් නිසාවෙන් 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම 100% ක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වුව ද පැවති තත්ත්වයට සාපේක්ෂව සෑහීමකට පත්විය හැකිය.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

6.1.1 බුද්ධශාසන අංශය

සේවක මට්ටම (2025.12.31 දිනට)	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	19	16	03
තෘතීක	03	03	00
ද්විතීයික	106	92	14
ප්‍රාථමික	44	36	08

6.1.2 සංස්කෘතික කටයුතු අංශය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	13	11	02
තෘතීයික	03	02	01
ද්විතීයික	534	501	33
ප්‍රාථමික	517	462	55

* මෙහි ප්‍රාථමික හා ද්විතීයික කාණ්ඩයේ දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කරන ලද තනතුරු (සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී, ප්‍රවර්ධන නිලධාරී, මධ්‍යස්ථාන මුරකරු) දරන නිලධාරීන් විශ්‍රාම ගැන්වූ පසු එය කාර්යය මණ්ඩලයේ ඇබෑර්තු යටතට නොගැනෙන බැවින් එම නිලධාරීන් සංඛ්‍යාව අඩුකර ප්‍රාථමික හා ද්විතීයික කාණ්ඩයේ ඇබෑර්තු ගණනය කර ඇත.

6.1.3 ජාතික උරුම අංශය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	07	06	01
තෘතියික	03	01	02
ද්විතියක	59	57	02
ප්‍රාථමික	10	07	03

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

6.2.1 බුද්ධ ශාසන අංශය

අදාළ නොවේ.

6.2.2 සංස්කෘතික අංශය

මාණ්ඩලික මට්ටමේ පවතින පුරප්පාඩු 03 සඳහා නිලධාරීන් අනුයුක්ත කර දෙන මෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් යොමු කර ඇත. එම තනතුරුවලින් සහකාර ලේකම් (පාලන) තනතුරෙහි දැනට සහකාර ලේකම් (ප්‍රවර්ධන) තනතුරු දරණ නිලධාරිනිය වැඩ බැලීම සිදුකරයි. අනිකුත් තනතුරු ද්විත්වය (අභ්‍යන්තර විගණක හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී) පුරප්පාඩුව පවතියි.

ද්විතියක මට්ටමේ තනතුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් සිදුකරනු ලබන නව බඳවාගැනීම්වලදී නිලධාරීන් අනුයුක්ත කර දෙන මෙන් ඉල්ලීම් යොමු කර ඇත. පවතින පුරප්පාඩු දැනට සේවයේ නියුතු නිලධාරීන්ගෙන් කළමනාකරණය කරගනිමින් කටයුතු කරනු ලබයි.

ප්‍රාථමික මට්ටමේ තනතුරු පුරප්පාඩුවලට විවෘත බඳවාගැනීම් සිදුකිරීම සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ පිහිටුවා ඇති බඳවාගැනීම් සමාලෝචනය කිරීමේ කමිටුවෙන් හා රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් අනුමැතිය ඉල්ලා ලිපි යොමු කර ඇති අතර ලැබෙන උපදෙස් මත ක්‍රියාකිරීමට නියමිතය. එතෙක් පවත්නා කාර්ය මණ්ඩලය මගින් රාජකාරී අතපසු නොවන අන්දමින් කටයුතු කළමනාකරණය කරගැනීම සිදුකරනු ලබයි.

6.2.3 ජාතික උරුම අංශය

ජාතික උරුම අංශයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපාන අතර රාජකාරී කටයුතු පවත්වාගෙන යාමේදී විවිධ අපහසුතාවයන්ට ලක් වීමට සිදුවේ.

6.3 මානව සම්පත් සංවර්ධන

6.3.1 බුද්ධ ශාසන අංශය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය (රු.)	විදේශීය (රු.)		
1.	ධර්ම දේශනා	නිලධාරීන් 130	පැය 2	-	-	දේශීය	නිලධාරීන්ගේ විෂයය දැනුම / ආකල්ප වර්ධනය නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ යාම
2.	නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024	නිලධාරීන් 01	දින 02	10.00	-	දේශීය	
3.	රජයේ වැටුප් පද්ධති මෘදුකාංග (GPS)	නිලධාරීන් 01	දින 03	-	-	දේශීය	
4.	කළමනාකරණ සේවා නිලධාරී සේවය III ශ්‍රේණියේ බඳවාගැනීමේ සීමිත තරඟ විභාගය 2023 යටතේ බඳවාගත්, 2025 වර්ෂයේ පත්වීම් ලද නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන	නිලධාරීන් 03	දින 05	-	-	දේශීය	
5.	A workshop for Senior Government Officers on Gender Responsive Budgeting (GRB)	නිලධාරීන් 02	පැය 04	-	-	දේශීය	

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය (රු.)	විදේශීය (රු.)		
6.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා ප්‍රායෝගික භාවිතය	නිලධාරීන් 01	දින 03	18.00	-	දේශීය	නිලධාරීන්ගේ විෂයය දැනුම / ආකල්ප වර්ධනය නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ යාම
7.	රජයේ ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය	නිලධාරීන් 01	අවුරුදු 01	75.00	-	දේශීය	
8.	JICA Technical assistance project for Capacity Development for effective public Investment Management in the Department of National planning (NPD) Sri Lanka	නිලධාරීන් 01	දින 03	-	-	දේශීය	
9.	මූලික විමර්ශනය	නිලධාරීන් 03	දින 01	19.5	-	දේශීය	
10.	රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ පුහුණු වැඩසටහන	නිලධාරීන් 56	දින 01	143.21	-	දේශීය	
11.	කාර්යාල කළමනාකරණය හා කාර්ය පටිපාටිය	නිලධාරීන් 01	දින 01	7.5	-	දේශීය	
12.	විද්‍යාත්මක පිරිමැසුම්දායක ආරක්ෂිත රිය පැදවීම	රියදුරු 03	දින 01	18.00	-	දේශීය	

